TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that upholds integrity

# අපරාධ වලින් උපයාගත් දේපළ සම්බන්ධ ශ්‍රී ලංකාවේ යෝජිත නෛතික සහ ප්‍රතිපත්ති රාමුව පිළිබඳ විග්‍රහය

2019 නොවැම්බර්

**ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා (TISL) යනු ස්වාධීන, රාජ්‍ය නොවන, ලාභ නොලබන හා පක්ෂග්‍රාහි නොවන සංවිධානයක් වන අතර එහි දැක්ම වනුයේ ශ්‍රී ලංකාවේ ආණ්ඩුකරණය, දේශපාලනය, ව්‍යාපාර කටයුතු, සිවිල් සමාජය හා පොදු ජන ජීවිතය දූෂණයෙන් තොර කිරීමයි. බර්ලින් මුල් කොටගත් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් සංවිධානයේ බලයලත් ජාතික ආයතනය වශයෙන් TISL ආයතනය, ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් සංවිධානය සමග මෙන්ම ලොව පුරා ඇති එහි ජාතික ආයතන සමඟ හවුල්කාරීත්වයෙන් යුතුව කටයුතු කරයි.**

කතෘ: මහේෂි හේරත්

නිර්මාණය: හරිත දහනායක

මෙම වාර්තාවෙහි අඩංගු තොරතුරු වල නිරවද්‍යතාවය තහවුරු කිරීම පිණිස සියලු ප්‍රයත්නයන් දරා ඇත. 2019 නොවැම්බර් මස වන විට මෙහි ඇති සියලු තොරතුරු සත්‍යය බවට විශ්වාස කරන ලදී. කෙසේ වෙතත් මෙම තොරතුරු වෙනත් අරමුණු සඳහා හෝ වෙනත් සන්දර්භයන්හිදී භාවිතා කිරීමේ ප්‍රතිවිපාකයන්වල වගකීම දැරීමට ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයට නොහැකිය.

ISBN: 978-955-1281-96-0

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල්  ශ්‍රී ලංකා
5/1
එලිබෑන්ක් පාර,
කොළඹ 05,
ශ්‍රී ලංකා

දුරකථන: +94 0114369781
ෆැක්ස්: +94 011 2 501 707

tisl@tisrilanka.org
www.tisrilanka.org

facebook.com/tisrilanka
twitter.com/tisrilanka

# අපරාධ වලින් උපයාගත් දේපළ සම්බන්ධ ශ්‍රී ලංකාවේ යෝජිත නෛතික සහ ප්‍රතිපත්ති රාමුව පිළිබඳ විග්‍රහය

2019 නොවැම්බර්

# කෙටි යෙදුම්

| | |
|---|---|
| APG | මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා පැසිෆික් කණ්ඩායම |
| CIABOC | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |
| CISLAC | සිවිල් සමාජ ව්‍යවස්ථාදායක උපදේශන මධ්‍යස්ථානය |
| CSOs | සිවිල් සමාජ සංවිධාන |
| FCID | මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය |
| FIU | මූල්‍ය බුද්ධි ඒකකය |
| GFAR | වත්කම් ආපසු ලබා ගැනීම පිළිබඳ ගෝලීය සංසදය |
| MOU | අවබෝධතා ගිවිසුම |
| PEP | දේශපාලනිකව නිරාවරණය වූ පුද්ගලයා |
| RTI | තොරතුරු දැන ගැනීමේ අයිතිය |
| SDGs | තිරසර සංවර්ධන ඉලක්ක |
| START | රාජ්‍ය වත්කම් ආපසු ලබා ගැනීම ගැනීම පිළිබඳ විශේෂ ජනාධිපති කාර්ය සාධක බලකාය |
| TISL | ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා |
| UNCAC | දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය |
| UWO | පැහැදිලි නොකළ ධනය උපයාගත් ආකාරය හෙළි කරන ලෙස අණ කෙරෙන නියෝගය |

# CONTENTS


| | |
|---|---|
| විධායක සාරාංශය | 01 |
| 1. හැඳින්වීම | 02 |
| 2. ශ්‍රී ලංකාවේ වර්තමාන නීතිය සහ එහි දුර්වලතාවය | 03 |
| 3. අපරාධ වලින් උපයාගත් දේපළ පිළිබඳ ශ්‍රී ලංකාවේ යෝජිත පනත පිළිබඳ ප්‍රතිපත්තිය සහ නෛතික රාමුවෙහි (ප්‍රතිපත්තිය) පසුබිම | 04 |
| 4. නෛතික රාමුවෙහි ඇති ප්‍රධාන විධිවිධාන පිළිබඳ විග්‍රහය | 07 |
| 5. සමාප්තිය | 16 |

| | |
|---|---|
| ඇමුණුම 1 - අපරාධ වලින් උපයාගත් දේපළ පිළිබඳ ශ්‍රී ලංකාවේ යෝජිත පනතෙහි ප්‍රතිපත්ති සහ නීති රාමුව | 17 |
| ඇමුණුම 2 - දූෂණ නඩු වලදී රාජසන්තක කරන ලද සොරකම් කළ වත්කම් බැහැර කිරීම හා පවරා දීම සඳහා වන වත්කම් ආපසු ලබා ගැනීම පිළිබඳ ගෝලීය සංසදයෙහි ප්‍රතිපත්ති | 26 |
| ඇමුණුම 3 - දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියෙහි වත්කම් ආපසු ලබා ගැනීම පිළිබඳ පරිච්ඡේදය | 28 |

# විධායක සාරාංශය

අපරාධ වලින් උපයාගත් දේපළ පිළිබඳ ශ්‍රී ලංකාවේ යෝජිත නෛතික සහ ප්‍රතිපත්ති රාමුව පිළිබඳව වන මෙම කෙටි විග්‍රහය තුළින් සොරකම් කරන ලද වත්කම් ආපසු ලබා ගැනීම පිළිබඳව වන පරිපූර්ණ නීතියක අවශ්‍යතාවය සහ අපරාධ වලින් උපයාගත් දේපළ සම්බන්ධයෙන් වන එවැනි නීතියක අන්තර්ගත විය යුතු ප්‍රධාන අංග කවරේද යන්න අවධාරණය කෙරෙයි. මෙම නීතිය ක්‍රියාත්මක කිරීමේදී මෙම නීතිය අවභාවිතා කිරීමට මග පෑදිය හැකි කපොලු අවහිර කරමින්, මානව හිමිකම් පිළිබඳ අවධානයන්ට ප්‍රමාණවත් පරිදි ආමන්ත්‍රණය කරනු ලබන බව සහතික කිරීම පිණිස නීතිය බලාත්මක කිරීමට පෙර පාර්ශ්වකරුවන් අතර පුළුල් සංවාදයක් ඇතිකිරීමේ වැදගත්කම ද එමගින් පෙන්වා දෙයි.

අපරාධ වලින් උපයාගත් දේපළ සාර්ථක ලෙස ආපසු ලබා ගැනීම පිණිස, සොරකම් කරන ලද වත්කම් ආපසු ලබා ගැනීමට අදාළව ශ්‍රී ලංකාවේ දැනට පවතින නීතියෙහි තිබෙන අඩුපාඩු අවධාරණය කරමින්, දැනට පවතින එම නීතිය පිළිබඳ විග්‍රහයක් කිරීමට මෙම විශ්ලේෂණාත්මක සංක්ෂිප්තය මගින් අපේක්ෂා කෙරෙයි. දේශීය සිද්ධීන් සලකා බැලීමේදී, එසේ සොරකම් කරන ලද වත්කම් අත්හිටුවීම, පරිග්‍රහණය කිරීම සහ රාජසන්තක කිරීම සම්බන්ධයෙන් වන නීති ගණනාවක්ම තිබෙන නමුත්, අපරාධ මගින් උපයා ගෙන ශ්‍රී ලංකාවෙන් ඉවතට ගෙන ගොස් විදේශීය රටවල සඟවා තිබෙන දේපළ සාර්ථක ලෙස රාජසන්ක කිරීම, ආපසු ගෙන ඒම සහ ඉන් පසුව කළමනාකරණය කිරීම සහතික කළ හැකි පරිපූර්ණ යාන්ත්‍රණයක් ශ්‍රී ලංකාවට නැත. මෑතකදී කෙටුම්පත් කරන ලද, යෝජිත 'අපරාධ වලින් උපයාගත් දේපළ පනත පිළිබඳ ප්‍රතිපත්තිය සහ  නෛතික රාමුව (ප්‍රතිපත්තිය) මගින් එකී ආපසු ලබා ගන්නා ලද දේපළ මෙරටට ආපසු ගෙන ඒම සහ කළමනාකරණය කිරීම සඳහා වන යාන්ත්‍රණයක් සපයා දීමට අපේක්ෂා කෙරෙයි. අනාගතයේදී ඉදිරිපත් කරනු ලැබිය හැකි, අපරාධ වලින් උපයා ගන්නා දේපළ පිළිබඳ පනත් කෙටුම්පතක් කෙටුම්පත් කිරීමේදී සහ ඒ පිළිබඳ විවාද කිරීමේදී සැලකිල්ලට ගත යුතු ප්‍රධාන ක්ෂේත්‍ර අවධාරණය කරමින් මෙම ප්‍රතිපත්තිය විග්‍රහ කරනු ලැබේ.

මෙම වාර්තාව සඳහා සොරකම් කරන ලද වත්කම් ආපසු ලබා ගැනීම පිළිබඳව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා විසින් සිදු කරන ලද පර්යේෂණ වලින් තොරතුරු ලබා ගෙන ඇති අතර එම ප්‍රතිපත්තිය කෙටුම්පත් කිරීම සඳහා පත් කරන ලද කමිටුවෙහි කෙටුම්පත් කමිටු සාමාජිකයෙකු ලෙස ලබා ගෙන ඇති අත්දැකීම් ද උපයෝගී කර ගෙන ඇත. අදාළ පාර්ශ්වකරුවන් නිරත කරවීමේදී කෙටුම්පත්කරුවන් සැලිකිලිමත් විය යුතු, සොරකම් කරන ලද වත්කම් ආපසු ලබා ගැනීම සම්බන්ධ විවාදාත්මක ක්ෂේත්‍ර අතරින් සමහරක් පිළිබඳ අවධානය යොමු කරන  අතරම, මෙම ප්‍රතිපත්තියෙහි සාධනීය ලක්ෂණ අවධාරණය කරමින් මෙම ප්‍රතිපත්තිය තුළින් යෝජනා කර ඇති විධිවිධාන මෙම සංක්ෂිතය මගින් විග්‍රහ කෙරෙයි.

සොරකම් කරන ලද වත්කම් ආපසු ලබා ගැනීමේ අරමුණ ඇතිව වෙනත් රටවල යොදා ගනු ලබන, සොරකම් කරන ලද වත්කම් ආපසු ලබා ගැනීම පිළිබඳව වන සාධනීය විධිවිධාන ගණනාවක් මෙම ප්‍රතිපත්තියට ඇතුළත් වන අතර, බලතල දරන්නන්ට එම විධිවිධාන අවභාවිතා කළ නොහැකි වන පරිදි ප්‍රමාණවත් ආරක්ෂක විධිවිධාන ඇතුළත් කරමින් එම සංකල්ප සම්පාදනය කරනු ලබන බව සහතික කිරීම පිණිස මෙම නීතිය කෙටුම්පත් කිරීමේ අදියරෙහිදී බහු-පාර්ශ්ව සංවාද පවත්වන ලෙසට මෙම වාර්තාව මගින් ඉල්ලා සිටිනු ලැබේ. එම අදහස් විමසීම් සිදුකිරීමෙන් අනතුරුව ප්‍රමාද නොවී මෙම නීතිය බලාත්මක කරන ලෙස ද මෙම වාර්තාව මගින් නීති සම්පාදකයින්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

# 1. හැඳින්වීම

සොරකම් කරන ලද වත්කම් ආපසු ලබා ගැනීම යනු අපරාධ හේතුවෙන් රටකට අහිමිවී ඇති වත්කම් පරිග්‍රහණය කිරීම, රාජසන්තක කිරීම, එම වත්කම් අයිති රට වෙත ආපසු යැවීම සහ ඒවායෙහි නියම හිමිකරුවන් අතට නැවත පත් කිරීම සහතික කෙරෙන ක්‍රියාවලියකි.[1] මෙය ප්‍රභව රට, සංක්‍රාන්ති රට සහ ගමනාන්ත රට යනුවෙන් හඳුනාගනු ලබන රටවල් ගණනාවක නීති ක්‍රියාත්මක කරන ආයතනවල සම්බන්ධීකරණය සහිත ප්‍රයත්නයන් අවශ්‍ය කරන සංකීර්ණ ක්‍රියාවලියකි.[2] අපරාධකරුවන් අපරාධ තුළින් ප්‍රතිලාභ නොලැබිය යුතුය යන්න සහ මෙම සොරකම් කරන ලද වත්කම්වල ප්‍රතිලාභය මගින් අවසන් වශයෙන් එම වත්කම්වල නියම හිමිකරුවන්ට - අපරාධයෙහි ඍජු වින්දිතයින්ට සහ ද්විතියික වින්දිතයින්ට, එනම් එම වත්කම් අයිතිව තිබූ සමාජයට - වන්දි ගෙවිය යුතුය සහ ප්‍රතිලාභ අත්කර දිය යුතුය යන්න මෙම ක්‍රියාවලියෙහි පදනම සකස් කරන ප්‍රධාන ප්‍රතිපත්ති දෙක වේ.[3]

සොරකම් කරන ලද වත්කම් ආපසු ලබා ගැනීම පාලනය කෙරෙන පරිපූර්ණ රාමුවක් ශ්‍රී ලංකාවට නැත.[4] දේශීය වශයෙන් වත්කම් අත්හිටුවීම සහ රාජසන්තක කිරීම සහ අපරාධ වලින් උපයාගත් දේපළ ආපසු ලබා ගැනීම[5] සඳහා විවිධ නීති හරහා සැකසුණු විවිධ යාන්ත්‍රණ තිබෙන නමුත්, රටෙන් බැහැර තිබෙන සොරකම් කරන ලද වත්කම් රාජසන්තක කිරීමට සහ ආපසු ලබා ගැනීමට ක්‍රියාවලියක් නැත. එමෙන්ම, දේශීය සහ අන්තර්ජාතික වශයෙන් රාජසන්තක කරන ලද, ශ්‍රී ලංකාවට අයිති ආපසු ලබා ගන්නා ලද වත්කම් කළමනාකරණය කිරීම සඳහා ද යාන්ත්‍රණයක් නැත. එපමණක් නොව, සොරකම් කරන ලද වත්කම් සිවිල් වශයෙන් ආපසු ලබා ගැනීම සඳහා වන පරිපූර්ණ ක්‍රියාවලියක් ද ශ්‍රී ලංකාවට නැත.[6] විදේශීය රටවල අධිකරණ බලය හරහා රාජසන්තක කරන ලද, සොරකම් කරන ලද වත්කම් අත්හිටුවීම සඳහා තිබෙන එකම යාන්ත්‍රණය අන්‍යෝන්‍ය නීති සහාය රාමුව වේ.

---

1. ජීන්*පියෙරෙ බ්‍රන්, ලැරිසා ග්‍රේ, ක්ලයිව් ස්කොට්, කෙවින් එම්. සටිවන්සන්, වත්කම් ආපසු ලබා ගැනීම පිළිබඳ අත්පොත, වෘත්තිකයින් සඳහා වන උපදෙස් සංග්‍රහය, (2011, ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික බැංකුව / ලෝක බැංකුව), 2 වැනි පිටුව
2. එම.
3. ආචාර්ය ජුඇනිටා ඔලායා, කොඩ්ජො ඇටිසො සහ අන්ජා රොත්, දූෂණ සිද්ධීන් නිසා සිදුවන සමාජ හානිය පිලියම් කිරීම - කොස්ටා රිකා රාජ්‍යෙයහි ඇල්කාටෙල් නඩුවෙහි පැහැදිලි කර ඇති පරිදි අවස්ථා සහ අභියෝග, <http://14iacc.org.s3-website.eu-central-1.amazonaws.com/wp-content/uploads/SocialDamagePaper20.01.2011.pdf> 20 වැනි පිටුව - ප්‍රවේශ වූ දිනය - 2019 අගෝස්තු 30
4. සන්කිතා ගුණරත්න, මහේෂි හේරත් සහ අශෝක ඔබේසේකර, ශ්‍රී ලංකාව පිළිබඳ CSO GFAR වාර්තාව <http://www.tisrilanka.org/wp-content/uploads/2017/12/Sri-Lanka-Asset-Recovery-CSO-Report-final.pdf> - ප්‍රවේශ වූ දිනය - 2019 අගෝස්තු 30
5. උදාහරණයක් ලෙස, ශ්‍රී ලංකාවේ අපරාධ නඩු විධාන සංග්‍රහය * 425 සහ 431 වැනි වගන්ති
6. අපරාධ නඩු පැවරීමට අමතරව, සමහර රටවල අපරාධ වලින් උපයා ගත් ධනය ආපසු අයකර ගැනීම සඳහා යොදා ගනු ලබන සොරකම් කරන ලද වත්කම් සිවිල් වශයෙන් ආපසු ලබා ගැනීමේ, නැතහොත් අධිකරණයකින් වරදකරු කිරීම පදනම් කර නොගත් වත්කම් ආපසු ලබා ගැනීමේ යාන්ත්‍රණයකි. මෙම ක්‍රමයෙහිදී සාමාන්‍යයෙන් සාක්ෂි අවශ්‍යතාවය වෙනුවෙන් අඩු වෙහෙසක් දැරීමට සිදු වේ (සම්භාව්‍යතා වැඩිබර සාධන සම්මතය මත අපරාධ ක්‍රියාව තහවුරු කළ යුතු වේ). වැඩිදුර තොරතුරු සඳහා 33 වැනි පාද සටහන බලන්න.

# 2. ශ්‍රී ලංකාවේ වර්තමාන නීතිය සහ එහි දුර්වලතාවය

ශ්‍රී ලංකාව තුළ දේශීය වශයෙන් පරිග්‍රහණය කිරීම, රාජසන්තක කිරීම සහ ප්‍රතිස්ථාපනය කිරීම විවිධ නීති මගින් ආවරණය කෙරෙයි; එහෙත්, සොරකම් කරන ලද වත්කම් ආපසු ලබා ගැනීම සඳහා වන පරිපූර්ණ නීතියක් නැත.[7] 1979 අංක 48 දරණ ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත (6(1)(ඈ)) වැනි වගන්තිය), 2006 අංක 6 දරණ මූල්‍ය ගනුදෙනු වාර්තාකරණ පනත (24, 25 සහ 26 වැනි වගන්ති), බැංකුකරණයට අදාළ නිතී (උදා: 1998 අංක 30 දරණ බැංකු පනතෙහි 57 සහ 67 වැනි වගන්ති), අපරාධ නඩු විධාන සංග්‍රහය සහ 1870 රේගු ආඥා පනත (උදා: රේගු ආඥා පනතෙහි 125 වැනි වගන්තිය) වැනි විශේෂිත නීති මගින් වත්කම් පරිග්‍රහණය කිරීම සඳහා විධිවිධාන සලසා ඇත. උදාහරණයක් ලෙස, යම් පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීම සඳහා වරෙන්තුවක් නිකුත් කර ඇති විට එම පුද්ගලයා අධිකරණය මගහැර සිටින අවස්ථාවක අපරාධ නඩු විධාන සංග්‍රහයෙහි 60 සහ 61 වැනි ව වගන්ති අනුව එම පුද්ගලයාට අයත් වත්කම් පරිග්‍රහණය කිරීමට අධිකරණයට බලය තිබේ. මුදල් විශුද්ධිකරණය කිරීමේ වරදට අදාළව ගත් විට, 2006 අංක 5 දරණ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත (6 - 12 වැනි වගන්ති) මගින් වත්කම් අත්හිටුවීම සඳහා විධිවිධාන සලසා ඇත.[8] පරිග්‍රහණය කිරීම හා සමානවම, රාජසන්තක කිරීම පිළිබඳව ද විශේෂිත නීතියක් නැත. මුදල් විශුද්ධිකරණ වරද සම්බන්ධයෙන් සලකා බැලීමේදී, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත මගින් මුදල් විශුද්ධිකරණ වරදට අදාළ වත්කම් අහිමි කිරීම සම්බන්ධයෙන් විධිවිධාන සලසා ඇත (13 - 16 වැනි වගන්ති). ඉහත සඳහන් කළ පනතට අමතරව, දේශීය වශයෙන් ගත් කල, අපරාධ නඩු විධාන සංග්‍රහ පනතෙහි (1979 අංක 15 දරණ) පොදු විධිවිධාන අපරාධ වලින් උපයාගත් දේපළ රාජසන්තක කිරීමට අදාළ වෙයි (උදා: 29, 426, 431 සහ 433 වැනි වගන්ති).[9]

අපරාධ නඩු විධාන සංග්‍රහය යටතේ දේශීය අපරාධ නඩුවලදී ප්‍රතිස්ථාපනය කිරීම සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන නමුත්, එය දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය මගින් හඳුනාගෙන ඇති ආකාරයට රටවල් අතර අධිකරණපාත්‍රතාවයන් හරහා ප්‍රතිස්ථාපනය කිරීම සම්බන්ධයෙන් සෘජුවම ආමන්ත්‍රණය නොකරයි.[10] අපරාධ නඩුවක් විභාග වෙමින් පවතින අතරතුරදී සහ එයින් අනතුරුව එම අපරාධ නඩු විභාගයෙහි විෂය කරුණ වන, අධිකරණය විසින් තීරණය කරනු ලබන නියම හිමිකරු වෙත ආපසු ලබා දිය යුතු වන දේපළක් සම්බන්ධයෙන් අපරාධ නඩු විධාන සංග්‍රහයෙහි 425 සහ 431 වැනි වගන්ති මගින් විධිවිධාන සලසා ඇත.

ආපසු ලබා ගන්නා ලද වත්කම් කළමනාකරණය කිරීම සඳහා වන යාන්ත්‍රණයක් සම්බන්ධයෙන් වර්තමාන නීතියෙහි ප්‍රතිපාදන නැත. ඉහත සඳහන් කරන ලද විවිධ නීතිවල ස්ථාපිත විවිධ කාර්ය ක්‍රම තිබේ.

7. සොරකම් කළ ධනය, වත්කම් ආපසු ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ඇති හැකියාව, ඩේලි නිව්ස්, <http://www.dailynews.lk/2017/12/20/features/137783/stolen-wealth> - ප්‍රවේශ වූ දිනය - 2019 සැප්තැම්බර් 26
8. සන්කිතා ගුණරත්න, මහේෂි හේරත් සහ අශෝක ඔබේසේකර, ශ්‍රී ලංකාව පිළිබඳ CSO GFAR වාර්තාව <http://www.tisrilanka.org/wp-content/uploads/2017/12/Sri-Lanka-Asset-Recovery-CSO-Report-final.pdf> - ප්‍රවේශ වූ දිනය - 2019 අගෝස්තු 30. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 217 වැනි වගන්තිය අනුව, යම් පුද්ගලයෙකුට විරුද්ධව අධිකරණ ක්‍රියාමාර්ගයක් ගෙන ඇති විට, මුදල් ගෙවන ලෙසට හෝ චංචල හෝ නිශ්චල දේපළ භාර දෙන ලෙසට එම අධිකරණය විසින් එම පුද්ගලයාට නියම කරනු ලැබිය හැක. තීන්දු කළ ණයහිමියා විසින් 217 වැනි වගන්තිය යටතේ වන නියෝගයකට අනුව පරිග්‍රහණය කරනු ලැබීමෙන් නිදහස් කර ඇති ද්‍රව්‍ය එම සංග්‍රහයෙහි 218 වැනි වගන්තියෙහි නිශ්චිතව සඳහන් කර තිබේ (උදා - තීන්දු කළ ණයකරුගේ හෝ ඔහුගේ බිරිඳගේ හෝ දරුවන්ගේ ඇඳීමට ගන්නා ඇඟළුම්, ඇඳන් සහ ඇඳ ඇතිරිලි පරිග්‍රහණය කරනු ලැබීමට යටත් නොවේ).
9. සන්කිත ගුණරත්න, මහේෂි හේරත් සහ අශෝක ඔබේසේකර, ශ්‍රී ලංකාව පිළිබඳ CSO GFAR වාර්තාව <http://www.tisrilanka.org/wp-content/uploads/2017/12/Sri-Lanka-Asset-Recovery-CSO-Report-final.pdf> - ප්‍රවේශ වූ දිනය - 2019 අගෝස්තු 30
10. එම.

# 3. අපරාධ වලින් උපයාගත් දේපළ පිළිබඳ ශ්‍රී ලංකාවේ යෝජිත පනත පිළිබඳ ප්‍රතිපත්තිය සහ නෛතික රාමුවෙහි (ප්‍රතිපත්තිය) පසුබිම

ශ්‍රී ලංකාව දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට අත්සන් කර ඇති රටක් වන බැවින් සහ ඒ සඳහා ඇති කැපවීම ව්‍යවස්ථාමය වශයෙන් පිළිගැනීමේ සුවිශේෂී පියවර ගෙන ඇති නිසා, අපරාධ වලින් උපයා ගත් දේපළ සම්බන්ධ නීතියක් කෙටුම්පත් කිරීමේදී ශ්‍රී ලංකාවට වත්කම් පරිග්‍රහණය කිරීම, රාජසන්තක කිරීම, ආපසු දීම, ප්‍රතිස්ථාපනය කිරීම සහ කළමනාකරණය කිරීම ආවරණය කෙරෙන පරිපූර්ණ යාන්ත්‍රණයක් ස්ථාපිත කෙරෙන බව සහතික කිරීමට අවශ්‍ය වනු ඇත.[11] සොරකම් කරන ලද වත්කම් ආපසු දීම දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියෙහි මූලික ප්‍රතිපත්තියක් ලෙස එම ප්‍රඥප්තිය මගින් පිළිගනු ලබන අතර,[12] අදාළ වගන්තිවලින් බොහොමයක් අනිවාර්යයෙන් ක්‍රියාත්මක කළ යුතු ඒවා වේ.[13]

එම ප්‍රඥප්තිය මගින් අනිවාර්ය සහ අනිවාර්ය නොවන විධිවිධාන වශයෙන් වෙන් කර දක්වමින් බැඳීසිටීම්වල විවිධ මට්ටම් නියම කර තිබේ. අනිවාර්ය විධිවිධාන පරම වශයෙන් හෝ විශේෂිත කොන්දේසි සම්පූර්ණ කර ඇති අවස්ථාවල හෝ නීති පැනවීම සඳහා වන බැඳීම් වලින් සමන්විත වේ.[14] අනිවාර්ය නොවන විධිවිධාන දෙයාකාරයකින් නිරූපණය කර තිබේ - රාජ්‍යය විසින් "සලකා බැලිය යුතු" නොහොත් "අනුගත කර ගැනීමට උත්සාහ දැරිය යුතු" බැඳීම්, සහ සම්පූර්ණයෙන් ම වෛකල්පිත වූ විධිවිධාන වශයෙන් දක්වා ඇති එම බැඳීම් "අනුගත කර ගත හැකිය" යන්නට සමාන යෙදුම් භාවිතා කරමින් සඳහන් කර තිබේ.[15] දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියෙහි 5 වැනි පරිච්ඡේදයෙහි අඩංගු වන වත්කම් ආපසු ලබා ගැනීමට අදාළ අනිවාර්ය විධිවිධානවල සාරාංශයක් පහත දැක්වේ:

- අපරාධ වලින් උපයාගත් දේපළ වෙනත් රාජ්‍යයකට සෘජුවම ආපසු ලබා ගත හැකි වන පරිදි සිය රටෙහි අධිකරණවල සිවිල් ක්‍රියාමාර්ග ගැනීම සඳහා වෙනත් රටකට අවසර ලබා දීම;
- දූෂණය හේතුවෙන් සිදු වී ඇති හානිය වෙනුවෙන් වෙනත් රටවලට වන්දි ගෙවීමට දේශීය අධිකරණවලට බලය ලබා දීම;
- විදේශීය රටකින් නිකුත් කර ඇති අත්හිටුවීමේ, පරිග්‍රහණය කිරීමේ සහ අහිමි කිරීමේ නියෝග පිළිග ැනීමට දේශීය බලධාරීන්ට අවසර දීම;
- රාජසන්තක කරන ලද දේපළ ඒවායෙහි නීත්‍යානුකූල හිමිකරුවන්ට ආපසු ලබා දීම;
- අපරාධ වලින් උපයා ගත් දේපළ ආපසු ලබා ගැනීමට එවැනි සහාය ඉල්ලා සිටින රටවලට සහාය වීම;
- අපරාධ වලින් උපයා ගත් දේපළ බැහැර වීම වැළැක්වීමට සහ බැහැර වීමට එරෙහිව කටයුතු කිරීමට සහ එසේ උපයාගත් දේපළ ආපසු ලබා ගැනීමට අනෙකුත් රාජ්‍යයන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම

දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියෙහි අත්සන්කාර පාර්ශ්වයක් වීමට අමතරව, "අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීම සඳහා කොමිෂන් සභාවක් ස්ථාපිත කිරීමට පාර්ලිමේන්තුව නීති මගින් විධිවිධාන සැලැස්විය යුතු[16] බව සහ එම නීති මගින් දූෂණය එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය සහ ශ්‍රී ලංකාව පාර්ශ්වකරුවෙකු වී සිටින, දූෂණය වැළැක්වීමට සම්බන්ධ වෙනත් ඕනෑම අන්තර්ජාතික සම්මුතයක් ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමට විධිවිධාන සැලැස්විය යුතුය යනුවෙන් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථවෙහි 156 අ(1)(ඇ) වැනි ව්‍යවස්ථාවෙහි සඳහන් වේ.

---

11. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156 අ(1)(ඇ) වැනි ව්‍යවස්ථාව
12. දූෂණයට එරෙහි ප්‍රඥප්තිය - 51 වැනි වගන්තිය <https://www.unodc.org/documents/brussels/UN_Convention_Against_Corruption.pdf> ප්‍රවේශ වූ දිනය - 2018 නොවැම්බර් 18ඃ ගිවිසුම් කටයුතු පිළිබඳ අංශය, මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය, දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වන නීති උපදෙස් සංග්‍රහය (බ 5) 196.
13. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා Pledge Tracker <http://www.tracker.tisrilanka.org/about/ > ප්‍රවේශ වූ දිනය - 2018 නොවැම්බර් 18
14. ගිවිසුම් කටයුතු පිළබඳ අංශය, මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය, දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වන නීති උපදෙස් සංග්‍රහය (දෙවැනි සංශෝධිත සංස්කරණ, 2012) පි.4
15. එම.
16. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156අ වැනි ව්‍යවස්ථාව

ශ්‍රී ලංකාව 2017 වර්ෂයේ පැවති වත්කම් ආපසු ලබා ගැනීම පිළිබඳ ගෝලීය සංසදයෙහි සමාරම්භක හමුවෙහි ප්‍රධාන අවධානය යොමු වූ රටක් විය.[17] එක්සත් රාජධානියේ ලන්ඩන් නුවර පැවති 2016 දූෂණ විරෝධී සමුළුවේදී මහා පරිමාණ දූෂණ, මුදල් විශුද්ධිකරණය සහ සොරකම් කරන ලද වත්කම් ආපසු ලබා ගැනීම සඳහා නඩු පැවරීමට ප්‍රමුඛත්වය දීමේ අභිප්‍රාය අවධාරණය කරමින් ශ්‍රී ලංකාව විසින් ලබා දෙන ලද පොරොන්දු මෙම ගෝලීය අවධානය යොමුවීමට හේතු වූ කරුණ විය.[18] ශ්‍රී ලංකාවට අමතරව, නයිජීරියාව, ටියුනීසියාව සහ යුක්‍රේනය මෙලෙස වත්කම් ආපසු ලබා ගැනීම සම්බන්ධ ගෝලීය සංසදයේ සමාරම්භක සමුළුවේදී අවධානයට යොමු වූ අනෙක් රටවල් විය.

"වත්කම් හඳුනා ගැනීමේ සහ තිබෙන ස්ථාන සොයා ගැනීමේ වගකීම සහ ඒවා නැවත ලබා ගැනීමේදී සහ ආපසු ලබා දීමේදී මූල්‍ය කේන්ද්‍රයන්හි අවශ්‍ය සහයෝගය ලබා ගැනීමේ වගකීම පැවරී ඇති විමර්ශකයින් සහ පැමිණිලි මෙහෙයවන්නන් සවිබල ගැන්වීම සඳහා වේදිකාවක් සපයා දීම" මෙම සංසදයෙහි අරමුණ විය. "අවධානයට යොමු වූ රටවල් හතරෙහි නඩුකර සම්බන්ධ ප්‍රගතිය අතර කර ගැනීම, තාක්ෂණික සැසි හරහා හැකියාවන් වැඩිදියුණු කිරීම, වත්කම් ආපසු ලබා ගැනීමේ නඩුකර ඉදිරියට පවත්වාගෙන යාම සඳහා අලුත් වූ කැපවීම, සහ අදාළ අධිකරණ බලයන් අතර වැඩි දියුණු වූ සහයෝගීතාවය වත්කම් ආපසු ලබා ගැනීම පිළිබඳ ගෝලීය සංසදයෙහි අපේක්ෂිත ප්‍රතිඵලවලට අයත් විය".[19]

මෙම සංසදයෙහිදී ශ්‍රී ලංකා නියෝජිත පිරිස වත්කම් ආපසු ලබා ගැනීමේ නඩුකර ඉදිරියට ගෙන ඒමට සහ අපරාධ වලින් උපයාගත් දේපළ සම්බන්ධ නීතිමය රාමුවක් සම්පාදනය කිරීමට ලබා දී තිබූ පොරන්දුව අලුත් කළහ.[20] සිවිල් සමාජ සංවිධාන මෙම ක්‍රියාවලියෙහි ප්‍රධානතම හවුල්කරුවන් වන බවත්, මෙම රාමුව කෙටුම්පත් කිරීමෙහි කොටස්කරුවන් වනු ඇති බවත් පිළිගන්නා ලදී.[21]

දූෂණ නඩුකර වලදී රාජසන්තක කළ, සොරකම් කරන ලද වත්කම් බැහැර දීම සහ පවරාදීම සඳහා වන, වත්කම් ආපසු ලබා ගැනීම පිළිබඳ ගෝලීය සංසදයෙහි ප්‍රතිපත්ති සම්පාදනය කිරීම එම සමුළුවෙහි වැදගත් ප්‍රතිඵල වලින් එකක් විය.[22] මෙම ප්‍රතිපත්ති 10 මගින් වත්කම් ආපසු ලබා දීමේදී "සම්බන්ධීකරණය සහ සහයෝගීතාවය වැඩිදියුණු කිරීම සඳහා සහ අදාළ ක්‍රියාවලිවල විනිවිදභාවය සහ වගවීම ශක්තිමත් කිරීම සඳහා වන ප්‍රවේශයන්ට සහ යාන්ත්‍රණවලට ආමන්ත්‍රණය කෙරෙයි."[23] මෙම ප්‍රතිපත්ති, ආපසු ලබා ගත්, සොරකම් කරන ලද වත්කම් කළමනාකරණය කිරීමේ යහ පරිචයන් ලෙස ක්‍රමයෙන් ගෝලීය පිළිගැනීමක් අතර කර ගනිමින් පවතී. උදාහරණයක් ලෙස, නයිජීරියාවේ වත්කම් ආපසු ලබා ගැනීම සම්බන්ධයෙන් කටයුතු කරන ප්‍රමුඛතම සිවිල් සමාජ සංවිධානයක් වන සිවිල් සමාජ නීති උපදේශක මධ්‍යස්ථානය මේ වන විට වත්කම් ආපසු ලබා ගැනීම පිළිබඳ ගෝලීය සංසදයෙහි ප්‍රතිපත්තිවලට සාපේක්ෂව නයිජීරියාවේ වත්කම් ආපසු ලබා ගැනීමේ ක්‍රියාවලියෙහි අනුකූලතා මට්ටම ඇගයීම පිණිස එම සංසදයෙහි ප්‍රතිපත්ති පදනම් කර ගත් අධීක්ෂණ යාන්ත්‍රණයක් සකස් කර තිබේ.

2018 ජනවාරි මාසයේදී, රාජ්‍ය වත්කම් ආපසු ලබා ගැනීම පිළිබඳ විශේෂ ජනාධිපති කාර්ය සාධක බලකාය අපරාධ වලින් උපයාගත් දේපළ පිළිබඳ යෝජිත නෛතික සහ ප්‍රතිපත්ති රාමුව කෙටුම්පත් කිරීම ආරම්භ කළේය. කෙටුම්පත් කමිටුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙහි, මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයෙහි, මූල්‍ය බුද්ධි ඒකකයෙහි, විදේශ කටයුතු අමාත්‍යාංශයෙහි, නීතිපති දෙපාර්තමේන්තුවෙහි, ශ්‍රී ලංකා නීතිඥ සංගමයෙහි සහ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා සංවිධානයෙහි නියෝජිතයින්ගෙන් සමන්විත විය. කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලිය 2018 ජුනි මාසයේදී අවසන් කරන ලදී. ඉන් පසුව එම නීති රාමුව අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීම පිණිස රාජ්‍ය වත්කම් ආපසු ලබා ගැනීම පිළිබඳ විශේෂ ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් ශ්‍රී ලංකා ජනාධිපතිවරයා වෙත භාර දෙන ලදී. මෙය ලියන අවස්ථාව වන විටත් එම ප්‍රතිපත්තියට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගත යුතුව තිබෙන අතර, එම අනුමැතිය ලැබීමෙන් අනතුරුව නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් අපරාධ වලින් උපයාගත් දේපළ පිළිබඳ පනත් කෙටුම්පත කෙටුම්පත් කරනු ඇත.

---

17. සොරකම් කරන ලද වත්කම් ආපසු ලබා ගැනීමේ වැඩසටහන, වත්කම් ආපසු ලබා ගැනීම පිළිබඳ ගෝලීය සංසදය, <https://star.worldbank.org/about-us/global-forum-asset-recovery-gfar >
18. එක්සත් රාජධානියේ පැවති දූෂණ විරෝධී සමුළුව, 2016 මැයි 12, ශ්‍රී ලංකාව ලබා දුන් පොරොන්දු, <https://assets.publishing.service.gov.uk/government/uploads/system/uploads/attachment_data/file/522731/Sri_Lanka.pdf> - ප්‍රවේශ වූ දිනය 2019 සැපැතැම්බර් 26
19. සොරකම් කරන ලද වත්කම් ආපසු ලබා ගැනීමේ වැඩසටහන, වත්කම් ආපසු ලබා ගැනීම පිළිබඳ ගෝලීය සංසදය, <https://star.worldbank.org/about-us/global-forum-asset-recovery-gfar>
20. වත්කම් ආපසු ලබා ගැනීම පිළිබඳ ගෝලීය සංසද සමුළුවෙහි වීඩියෝ දර්ශන - මාධ්‍ය හමුව, දෙසැම්බර් 6 වැනි දින, තත්. 14.35 - 15.00 <https://star.worldbank.org/content/gfar-press-conference-december-6>
21. වත්කම් ආපසු ලබා ගැනීම පිළිබඳ ගෝලීය සංසද සමුළුවෙහි වීඩියෝ දර්ශන - සමාප්ත කිරීමේ වට මේස සාකච්ඡාව, දෙසැම්බර් 6 වැනි දින, තත්. 22.42 <https://star.worldbank.org/content/gfar-closing-round-table-december-6>, වත්කම් ආපසු ලබා ගැනීම පිළිබඳ ගෝලීය සංසද සමුළුවෙහි වීඩියෝ දර්ශන, මාධ්‍ය හමුව, දෙසැම්බර් 6 වැනි දින තත්. 14.35 - 15.00 <https://star.worldbank.org/content/gfar-press-conference-december-6>
22. වත්කම් ආපසු ලබා ගැනීම පිළිබඳ ගෝලීය සංසදයෙහි නිල නිවේදනය <https://star.worldbank.org/sites/star/files/20171206_gfar_communique.pdf>
23. එම.පි.4

මෙම ප්‍රතිපත්තිය කෙටුම්පත් කිරීමේදී, කෙටුම්පත් කමිටුව 2018 ජනවාරි සිට ජුනි දක්වා කාලය තුළ සෑම බදාදා දිනකම රැස්විය. ශ්‍රී ලංකාවට අලුත් වූ වත්කම් ආපසු ලබා ගැනීම පිළිබඳ සංකල්ප පැහැදිලි කර ගැනීමේ අවශ්‍යතාවය ඇති වූ විට සොරකම් කළ වත්කම් ආපසු ලබා ගැනීම පිළිබඳ ලෝක බැංකු වැඩසටහනෙහි සහාය ඇතිව විශේෂඥයින් කැඳවීමට  රාජ්‍ය වත්කම් ආපසු ලබා ගැනීම ගැනීම පිළිබඳ විශේෂ ජනාධිපති කාර්ය සාධක බලකායට අවස්ථාව ලැබුණි. ශ්‍රී ලංකාවට නව සංකල්පයක් වන, වරදකරු නොකරන පදනමින් වත්කම් ආපසු ලබා ගැනීමේ ක්‍රමය පිළිබඳව එවැනි එක් සාකච්ඡාවක් පවත්වන ලද අතර එය 4.3 වැනි උප වගන්තියෙහි විස්තරාත්මක ලෙස විමසා බලනු ලැබේ.

මෙම ප්‍රතිපත්තිය සකස් කරන ලද කාලය සහ මෙම වාර්තාව සම්පාදනය කරමින් පවතින කාලය අතරතුර රාජ්‍ය වත්කම් ආපසු ලබා ගැනීම ගැනීම පිළිබඳ විශේෂ ජනාධිපති කාර්ය සාධක බලකායෙහි කළමනාකරණය වෙනස්කම් වලට භාජනය වී ඇත - එම බලකායෙහි මෙම කෙටුම්පත් කිරීමේ ප්‍රයත්නය මෙහෙයවන්නන්, සභාපතිවරයා සහ ලේකම්වරයා තවදුරටත් එම තනතුරුවල කටයුතු නොකරති. 2020 මහ මැතිවරණයට පෙර මෙම නීතිය බලාත්මක කිරීම සම්බන්ධයෙන් තිබෙන දේශපාලන අධිෂ්ඨානය සීමිත බවක් පෙනෙන්නට තිබුණද, රාජ්‍ය වත්කම් ආපසු ලබා ගැනීම ගැනීම පිළිබඳ විශේෂ ජනාධිපති කාර්ය සාධක බලකායෙහි නව කළමනාකරණය මෙම නීතිය ක්‍රියාත්මක කිරීමට කැපවී සිටිති.

වර්ෂ 2021 වන විට ක්‍රියාවට නැංවීමේ අපේක්ෂා සහගත ඉලක්කයක් ඇතිව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් 2019 වර්ෂයේදී දියත් කරන ලද ශ්‍රී ලංකාවේ දූෂණය තුරන් කිරීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්මට මෙම ප්‍රතිපත්තිය ඇතුළත් කර තිබීම වැදගත් කරුණක් වේ.

# 4. නෛතික රාමුවෙහි ඇති ප්‍රධාන විධිවිධාන පිළිබඳ විග්‍රහය

මෙම කොටස මගින් ප්‍රධාන ක්ෂේත්‍ර 11 ක් යටතේ මෙම නීති රාමුව පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණයක් සපයයි. මෙමගින් පහත දැක්වෙන උප කොටස් 20 යටතේ වෙන් කර ඇති, ප්‍රතිපත්තිය පුරාවට ඇති ගැටළු[24] ඒකාබද්ධ කෙරෙයි.

- යෝජිත නීතියේ අරමුණ
- යෝජිත නීතියේ විෂය පථය
- මුදල් විශුද්ධිකරණ වරදක්
- වාර්තා කිරීමේ වගකීම
- වරදකරු කිරීමෙන් පසු රාජසන්තක කිරීම / අහිමි කිරීම
- දීර්ඝ කල රාජසන්තක කිරීම
- රාජසන්තක කිරීමේ කටයුතුවල විෂය පථය
- වරදකරු නොකරන පදනමින් රාජසන්තක කිරීමේ කටයුතු
- රාජසන්තක නොකළ, පරිග්‍රහණය කළ දේපල
- අපරාධ වලින් උපයාගත් දේපළ තහනම් කිරීම, පරිග්‍රහණය කිරීම, පරිපාලනය සහ කළමනාකරණය, සහ සංරක්ෂණය කිරීම
- රාජසන්තක කළ මුදල් අනුපාතනය කිරීම සහ භාර අරමුදලකට මාරු කිරීම
- අපරාධ වලින් උපයාගත් දේපළ ආපසු ලබා ගැනීමේ සහ කළමනාකරණය කිරීම් ශ්‍රී ලංකා අධිකාරිය (අධිකාරිය) සහ ආයතනික වැඩපිළිවෙල
- විමර්ශන බලතල
- පැහැදිලි නොකළ දේපළ උපයා ගත් ආකාරය හෙළි කරන ලෙස නිකුත් කරනු ලබන නියෝගය
- නීති වෘත්තීයමය වරප්‍රසාදය
- කාර්යයන් පැවරීම සඳහා අධිකාරියට පැවරෙන බලතල
- ඒකාබද්ධ විමර්ශන කණ්ඩායම්
- අධිකාරිය සහ ජාත්‍යන්තර සහයෝගීතාව සහ වත්කම් ආපසු ලබා ගැනීම
- අධිකාරියේ සංයුතිය
- දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම
- අර්ථ නිරූපණය

### 4.1. යෝජිත නීතියෙහි අරමුණ සහ විෂය පථය[25]

මෙම කොටස මගින් යෝජිත නීතියෙහි අරමුණු හඳුනා ගැනෙයි - අපරාධ වලින් උපයාගත් දේපළ සම්බන්ධ ලොව පුරා තිබෙන නීතිවල මේ ආකාරයේ විධිවිධාන බෙහෙවින් පොදු ය. එම අරමුණු පහත සඳහන් පරිදි වේ:
(අ). අපරාධකරුවන්ට අයථා ලෙස උපයාගත් වත්කම් (අපරාධ වලින් උපයාගත් දේපළ) අහිමි කිරීම,
(ආ) අපරාධවල වින්දිතයින්ට වන්දි ගෙවීම,
(ඇ). ත්‍රස්තවාදය සහ මූල්‍ය හා ආර්ථික අපරාධ ද ඇතුළුව සංවිධානාත්මක අපරාධ දුර්වල කිරීම,
(ඈ). ආර්ථික වශයෙන් ප්‍රායෝගික වූ, අපරාධ වලින් උපයාගත් දේපළ ආපසු ලබා ගැනීමේ ක්‍රමයක් නිර්මාණය කිරීම,
(ඉ) රාජ්‍යයේ, සමාජයේ සහ අපරාධවල වින්දිතයින්ගේ යහපත උදෙසා, අත්පත් කරගත් හෝ රාජසන්තක කරන ලද වත්කම්වල වටිනාකම ආරක්ෂා කිරීම, සහ
(ඊ). අපරාධ වලින් උපයාගත් දේපළ ආපසු ලබා ගැනීමේ ක්‍රමවේදය පිළිබඳව වගවීම සහ විනිවිදභාවය සහ මහජන විශ්වාසය සහතික කිරීම.

වත්කම් අයකර ගැනීමේ ක්‍රියාවලියේ වගවීම සහ විනිවිදභාවය ප්‍රතිපත්ති ලියවිල්ලෙහි පළමු මූලධර්මය තුළ ම ස්ථාපිත කර තිබීම වැදගත් කරුණක් වේ.

රාජසන්තක කරන ලද වත්කම් සමාජයෙහි සහ වින්දිතයින්ගේ යහපත සඳහා යොදා ගත යුතුය යන ප්‍රතිපත්තිය අරමුණු යටතේ සඳහන් කිරීම ප්‍රගතිශීලී ය - ආපසු ලබා ගත් වත්කම් සමාජයේ යහපත සඳහා යොදා ගැනීම වත්කම් ආපසු ලබා ගැනීම පිළිබඳ ගෝලීය සංසදයෙහි ප්‍රතිපත්තිවල පිළිගත් යහ පරිචයන් වේ.[26] "හැකි සෑම අවස්ථාවකදීම, හඳුනාගත් වින්දිතයින්ට අගතියකින් නොවන පරිදි, දූෂිත නිලධාරීන්ගෙන් ආපසු ලබා ගන්නා ලද වත්කම් මගින් අදාළ දූෂිත ක්‍රියාව හේතුවෙන් හානියට පත් රටවල ජනතාවට ප්‍රතිලාභ සැලසිය යුතුය." යනුවෙන් 5 වැනි ප්‍රතිපත්තියෙහි සඳහන් වේ.[27]

24. ඇමුණුම 01 - ශ්‍රී ලංකාවේ අපරාධ වලින් උපයාගත් දේපළ පිළිබඳ යෝජිත පනතෙහි ප්‍රතිපත්ති සහ නීති රාමුව බලන්න
25.ඇමුණුම 01 - I කොටස-'යෝජිත නීතියෙහි අරමුණු, සහ II කොටස - යෝජිත නීතියෙහි විෂය පථය බලන්න
26.එම, 16 වැනි පාද සටහන
27.වත්කම් ආපසු ලබා ගැනීම පිළිබඳ ගෝලීය සංසදයෙහි නිල නිවේදනය < https://star.worldbank.org/sites/star/files/20171206_gfar_communique.pdf > 5 වැනි පිටුව

ඉහත අරමුණු හැරුණු විට, මෙම නීතිය බලාත්මක කිරීම මගින් දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියෙහි ඇති බැඳීම් සහ දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්ති සමාලෝචන යාන්ත්‍රණය යටතේ එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය විසින් පවත්වන ලද ශ්‍රී ලංකාව සම්බන්ධ සම්පූර්ණ සමාලෝචනය මගින් සොයා ගත් කරුණු සපුරාලනු ඇති බව ද පෙන්වා දෙන අතර,[28] එය මුදල් විශුද්ධිකරණය පිළිබඳව වන ආසියා පැසිෆික් කණ්ඩායම විසින් සිදු කරනු ලබන අන්‍යෝන්‍ය ඇගයීමේ ප්‍රතිඵලයට ද ශ්‍රී ලංකාව අනුකූල කරවනු ඇත. මෙම ඇගයීම් දෙකෙහිදී ම, අපරාධ වලින් උපයාගත් වත්කම් ආපසු ලබා ගැනීම සඳහා කටයුතු කිරීම පිණිස අපරාධ වලින් උපයාගත් ආදායම් පිළිබඳ පරිපූර්ණ නීතියක් නොතිබීම අවධාරණය කර තිබේ.[29]

යෝජිත නීතිය මගින් පහත සඳහන් අවස්ථා ආවරණය කරනු ලැබේ:

- කිසියම් පුද්ගලයෙකු ශ්‍රී ලංකාව තුළදී කිසියම් වරදක් කළ අවස්ථා.
- (i) ශ්‍රී ලාංකික පුරවැසියෙකු, (ii) ශ්‍රී ලංකාවේ ද්විත්ව පුරවැසියෙකු, (iii) ශ්‍රී ලංකාව තුළ පදිංචිව සිටින හෝ හමු වන පුද්ගලයෙකු, ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටතදී කිසියම් වරදක් සිදු කර, ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටතදී එම වරද මගින් උපයාගත් දේපළ (අපරාධ වලින් උපයාගත් දේපළ) සොයා ගනු ලබන අවස්ථා.
- අපරාධ වලින් උපයා ගත් දේපළ ශ්‍රී ලංකාවෙහිදී සොයා ගනු ලබන ඇති අවස්ථා.
- අපරාධ වලින් උපයා ගනු ලබන දේපළ ශ්‍රී ලංකාවට ගෙනවිත්, ශ්‍රී ලංකාවෙන් පිටතට ගෙන ගොස් තිබෙන හෝ ශ්‍රී ලංකාව හරහා රැගෙන යනු ලබන අවස්ථා.

පුරවැසියෙකු විසින් හෝ අන්‍යාකාරයකින් හෝ, අපරාධයක් කිරීමට, අපරාධ වලින් උපයා ගන්නා දේපළ සැඟවීමට හෝ නීති විරෝධී වත්කම් විශුද්ධිකරණය කිරීමට ශ්‍රී ලංකාවේ භූමිය යොදා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ අධිකරණ බලය යොදා ගන්නා කරන අවස්ථා ආවරණය කිරීම මෙම විධිවිධානයේ පරමාර්ථය විය. මෙම කොටසෙහිදී, වාර්තාවෙහි මෙයට පෙර සාකච්ඡා කළ පරිදි, නීතියේ පවතින අඩුපාඩු, එනම් අපරාධ වලින් උපයාගත් දේපළ විදේශීය රටවල සඟවා තැබීම සම්බන්ධ ජාත්‍යන්තර අංගය සාකච්ඡා කෙරෙයි.

එයට අමතරව, මෙම ප්‍රතිපත්තියෙහි 2 වැනි කොටස මගින් නීතියෙහිදී ආමන්ත්‍රණය කරනු ලබන කාර්ය පටිපාටීන් ලුහුඬින් පෙන්වා දී ඇත.

- ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත පිහිටා තිබුණා ද, අපරාධ වලින් උපයාගත් දේපළ අත්පත් කර ගැනීම, ස්ථානගත කිරීම, තබා තිබීම, සංකලනය කිරීම, භාවිතය, පාලනය සහ සන්තකයේ තබා ගැනීම විමර්ශනය කිරීම,
- එවැනි දේපළ හඳුනා ගැනීම, තිබෙන ස්ථානය සොයා ගැනීම සහ අනාවරණය කර ගැනීම,
- රාජසන්තක කරන ලද / තහනම් කරන ලද, අපරාධ වලින් උපයාගත් දේපළ සහ ඒවායෙහි මුදල් වටිනාකම උපලබ්ධි කර ගැනීම ද ඇතුළුව, එවැනි දේපළ පරිග්‍රහණය කිරීම, අත්හිටුවීම (තහනම් කිරීම) පරිපාලනය / කළමනාකරණය කිරීම,
- මෙම නීතිය මගින් පිළිගත් වැරදි විමර්ශනය කිරීම,
- මෙම නීතිය මගින් පිළිගත් අපරාධ සහ වැරදි වලින් උපයාගත් දේපළවලට අදාළ නීතිමය කටයුතු සංස්ථාපනය කිරීම,
- අපරාධ වලින් උපයාගත් දේපළ රාජසන්තක කිරීම / තහනම් කිරීම,
- අපරාධ වලින් උපයාගත් දේපළ බැහැර කිරීම,
- අපරාධවල වින්දිතයින්ට හානිපූරණය කිරීම,
- සද්භාවයෙන් යුතු තෙවන පාර්ශවයන්ගේ අයිතිවාසිකම් පිළිගැනීම,
- අපරාධ වලින් උපයාගත් දේපළ සම්බන්ධයෙන් අන්‍යෝන්‍ය නීතිමය සහාය සඳහා විධිවිධාන සැලසීම,
- පුද්ගලයන්ට සහ විදේශීය රාජ්‍යයන්ට ශ්‍රී ලංකාවේ ස්ථාන ගත කර ඇති අපරාධ වලින් උපයා ගත් දේපළ සෘජුවම ආපසු ලබා ගැනීමට ඉල්ලා සිටීම සඳහා පවත්නා සිවිල් නීති පිළියම පිළිගැනීම.
- පාර්ලිමේන්තුවට වාර්ෂිකව වාර්තා කිරීම සහ කාලීන වශයෙන් මහජනයා වෙත වාර්තා කිරීම සඳහා විධිවිධාන සැලසීම, සහ
- එයට අනුෂංගික වෙනත් කරුණු.

'අපරාධ වලින් උපයාගත් දේපළ යන්න ('අපරාධ' යන යෙදුම 'වරද යන්නට සමාන අර්ථයක් ඇතිව යොදා ඇත) මෙසේ නිර්වචනය කර ඇත: "ශ්‍රී ලංකාව තුළදී හෝ වෙනත් ස්ථානයක දී කිසියම් පුද්ගලයෙකු විසින් සිදුකරන ලද යම් වැරදි ක්‍රියාවකට සම්බන්ධව හෝ යම් වැරදි ක්‍රියාවක ප්‍රතිඵලයක් ලෙස හෝ, සෘජුවම හෝ වක්‍රාකාරයෙන් හෝ, උපයා ගන්නා කිසියම් දේපළක් හෝ දේපළක කොටසක් හෝ, ආදායමක්, සේවාවක්, වාසියක්, ප්‍රතිලාභයක් හෝ, සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ ඉපදවුණු, ලැබුණු, රඳවා ගත්, ඒකාබද්ධ වූ වෙනත් ආර්ථික ලාභයක් අදහස් වන අතර එයට අපරාධවල උපකරණත්ව සහ ඒවායෙහි වටිනාකම ද ඇතුළත් වේ".[30] මෙම නීතිය යටතේ ආවරණය වන වැරදි වසර දෙකක හෝ එයට වැඩි කාලයක සිර දඬුවම් ලැබිය හැකි වැරදි වේ.

28.ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වන දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියෙහි රට පිළිබඳ සමාලෝචන වාර්තාව <https://www.unodc.org/documents/treaties/UNCAC/CountryVisitFinalReports/2018_09_03_Sri_Lanka_Final_Country_Report.pdf > - ඇමුණුම 1 හි 56 වැනි වගන්තිය

29. මුදල් විශුද්ධිකරණයට එරෙහි සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමට එරෙහි ක්‍රියාමාර්ග, ශ්‍රී ලංකා අන්‍යෝන්‍ය ඇගයීම් වාර්තාව, 2015 සැප්තැම්බර්, 61 සහ 118 වැනි පිටු, ප්‍රවේශ වූ දිනය■ 2019 ඔක්තෝබර් <http://www.apgml.org/mutual-evaluations/documents/default.aspx?s=title&pcPage=8;>

දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියෙහි 5 - 14 සහ 51 - 59 වැනි වගන්ති ශ්‍රී ලංකාව විසින් ක්‍රියාත්මක කරනු ලැබීම පිළිබඳ පලවු සහ බෲනල් දරුසලාම් විසින් 2016 - 2021 සමාලෝචන වාරය සඳහා සිදු කරන ලද ශ්‍රී ලංකාව සම්බන්ධ රට පිළිබඳ සමාලෝචන වාර්තාව, 109 වැනි පිටුව - ප්‍රවේශ වූ දිනය- 2019 ඔක්තෝබර් 30 <https://www.unodc.org/documents/treaties/UNCAC/CountryVisitFinalReports/2018_09_03_Sri_Lanka_Final_Country_Report.pdf>

30. ඇමුණුම 01 - 57 වැනි ඡේදය බලන්න

ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණ පනත යටතේ නිශ්චිතව දක්වා ඇති පරිදි මුදල් විශුද්ධිකරණය කිරීමේ වරද ද මෙම ප්‍රතිපත්තිය මගින් නැවත අවධාරණය කරයි.[31] මෙම වරද ඇතුළත් කිරීමෙහි අරමුණ එය මූල්‍ය ක්‍රියාකාරී කාර්ය සාධක බලකායෙහි නිර්දේශයන්ට අනුකූලව ගෙන ඒම බව පෙන්වා දී ඇත.

## 4.2 වරදකරු කරනු ලැබීමෙන් පසු රාජසන්තක කිරීම/අහිමිකරණය සහ දීර්ඝ කළ රාජසන්තක කිරීම[32]

සොරකම් කරන ලද වත්කම්, වරද කළ පුද්ගලයා වරදකරු කිරීමෙන් පසුව ආපසු අයකර ගැනීමේ යාන්ත්‍රණයක් සපයා දීමට යෝජිත නීතිය මගින් අදහස් කරයි. මෙය සාමාන්‍යයෙන් 'පුද්ගල බන්ධක නඩු කටයුතු ලෙස හඳුන්වනු ලබන අතර, ඒ සඳහා අදාළ වරද සිදු කළ පුද්ගලයා සාපරාධී වරදකරු කිරීම අවශ්‍ය වේ.[33] සාපරාධී බවෙහි සාධන භාරය හේතුවෙන් මෙම යාන්ත්‍රණය සඳහා කල් ගතවන අතර, සමහර විට එය වරද හේතුවෙන් අහිමි වී ඇති මුදල් ආපසු අයකර ගැනීම ප්‍රමාණවත් නොවේ (උදා: අපරාධකරුගේ මරණය). සිවිල් වශයෙන් ආපසු අයකර ගැනීමේ යාන්ත්‍රණය යටතේ මෙම ගැටළු වලට ආමන්ත්‍රණය කරනු ලැබේ (4.3 වැනි වන උපවගන්තිය බලන්න).

ප්‍රතිපත්තියට අනුව, අපරාධ වලින් උපයාගත් දේපළවල ප්‍රතිලාභය හෝ වටිනාකම ආපසු අයකර ගැනීම සඳහා වරද සිදු කළ පුද්ගලයා වරදකරු කිරීමෙන් අනතුරුව රාජසන්තක කිරීමේ කටයුතු ආරම්භ කළ යුතුය. කෙසේ වෙතත්, අදාළ කාරණය සුළු කරුණක් වීම පදනම් කර ගෙන හෝ වූදිතයා සතුව හඳුනාගත හැකි වත්කම් නොමැති අවස්ථාවක, අපරාධයේ වින්දිතයාගේ එකඟතාවය මත, මෙම නීතිය යටතේ පිහිටුවා ඇති ආයතනයට වත්කම් ආපසු අයකර ගැනීමේ කටයුතු අත්හැර දැමීමේ අභිමතය ඇත. මෙය ප්‍රායෝගික විධිවිධානයක් වන අතර, එමගින් සුළු කාරණා හේතුවෙන් අධිකරණ පද්ධතියෙහි තදබදයක් ඇති නොවන බව සහතික කෙරෙයි.

දීර්ඝ කරන ලද රාජසන්තක කිරීම[34] ශ්‍රී ලංකාවට නව ක්‍රියාවලියකි - පුද්ගලයෙකු වරදකරුවෙකු කරනු ලැබ ඇති අපරාධයකට සම්බන්ධ නොවන වත්කම් රාජසන්තක කිරීමට මෙයින් බලය ලබා දෙයි.[35] වෙනත් දේපළ නීතිවිරෝධී ක්‍රම වලින් උපයාගෙන තිබිය හැකි බවට පිළිගත හැකි ආකාරයෙන් අධිකරණය සෑහීමකට පත්වීම මත මෙම දේපළ චූදිතයා වරදකරු කරනු ලැබ ඇති වරද සිදු කිරීමට පෙර වසර 7 ක කාලය තුළදී සාපරාධී ක්‍රියාකාරකම් වලින් උපයා ගත් එකක් යැයි අධිකරණයට උපකල්පනය කළ හැකිය.[36] ප්‍රශ්නයට තුඩු දී ඇති වත්කම නීත්‍යානුකූල මාර්ගයෙන් උපයාගෙන ඇති බවට සම්භාව්‍යතා වැඩිබර මත පෙන්වීමට වැරදිකරුට නිදහස තිබේ - එසේ කිරීමට අපොහොසත් වුවහොත් දණ්ඩ විනිශ්චයක් ලබා ගෙන ඇති අවස්ථාවක අදාළ අපරාධයට සම්බන්ධ නොවන දේපළ රාජසන්තක කිරීමට අධිකරණයට බලය තිබේ.

පුද්ගලයාට ගම්‍ය සාපරාධී ජීවන රටාවක් ඇති විට, වෙනත් රටවල් කිහිපයක වත්කම් ආපසු ලබා ගැනීම සඳහා දීර්ඝ කළ රාජසන්තක කිරීමේ ක්‍රියාවලිය භාවිතා කෙරේ. මෙම රටවල් බොහොමයක ත්‍රස්තවාදය, සංවිධානාත්මක අපරාධ, මුදල් විශුද්ධිකරණය හෝ මත්ද්‍රව්‍ය ජාවාරම වැනි බරපතල අපරාධ සඳහා මෙම සංකල්පය යොදා ගනී. "එය වරදකරුට අයත් වත්කම්වලට පමණක් අදාළ වේ.[37] මෙම නිශ්චිත කොටස ට අදාළ වන්නා වූ අපරාධ මොනවාද යන්න ප්‍රතිපත්තියෙහි නිශ්චිතව දක්වා නොමැති අතර, " සාපරාධී ක්‍රියාකාරකම් හේතුවෙන්" යන යෙදුමට අදාළ වන අර්ථය තීරණය කිරීමේදී අදාළ කර ගත යුතු පරීක්ෂණ ක්‍රියාත්මක කර තිබීම අවශ්‍ය වන බව එම කොටස මගින් පෙන්වා දෙයි. මෙම ක්‍රියාවලිය පිළිග න්නේ නම්, එය අනිසි ලෙස භාවිතා කළ හැකි බැවින්, විශේෂයෙන්ම මෙය බරපතල අපරාධවලට පමණක් සීමා කෙරෙන බව සහතික කිරීම සඳහා ආරක්ෂක විධිවිධාන යෙදිය යුතු බව සහ එසේ කිරීමට අපොහොසත් වුව හොත් පුද්ගලයාගේ වත්කම්වලට පහර දීම සඳහා මෙවලමක් ලෙස සුළු වැරදි භාවිතා කළ හැකි බව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා විසින් අවධාරණය කරන ලදී. එමෙන්ම, මෙම නියෝගය අභියාචනා කළ හැකි නියෝගයක් විය යුතු බව ද අවධාරණය කෙරිණි. මෙම ක්ෂේත්‍රය මගින් මූලික අයිතිවාසිකම් පිළිබඳ සැලකිය යුතු ප්‍රතිවිපාක ගෙන දිය හැකි බැවින්, කෙටුම්පත් කර අවසන් කිරීමට පෙර පනත් කෙටුම්පත පිළිබඳ සිදු කරන සිවිල් සමාජ අදහස් විමසීම් මගින් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් කෙටුම්පත් කරන ලද "අපරාධ ක්‍රියාකාරකම් හේතුවෙන්" යන්න තීරණය කෙරෙන පරීක්ෂණවලට ආමන්ත්‍රණය කළ යුතුය.

---

31. ඇමුණුම 01 - 9 වැනි වගන්තිය බලන්න
32. ඇමුණුම 01 - V සහ VI වැනි වගන්ති - වරදකරු කිරීමෙන් පසු රාජසන්තක කිරීම / අහිමි කිරීම සහ දීර්ඝ කළ රාජසන්තක කිරීම බලන්න
33. තියඩෝර් එස්. ග්‍රීන්බර්ග්, ලින්ඩා එම්. සැමුවෙල්, වින්ගට් ග්‍රාන්ට්, ලැරිසා ග්‍රේ, වරදකරු නොකිරීම පදනම් කර ගත් වත්කම් අහිමි කිරීම සඳහා මනා පරිචයන් පිළිබඳ මාර්ගෝපදේශයක්, 13වැනි පිටුව, සියලු දෙනා බැඳී සිටිති යන්න "යම් දෙයකට එරෙහිව□ ලෙස පරිවර්තනය කළ හැකිය. "පුද්ගල බන්ධක" යන්නෙන් පක්ෂයකට එරෙහි කරුණු විනිශ්චය කිරීමට අධිකරණය සතු බලය අදහස් කෙරෙයි. නීති තොරතුරු ආයතනය, කෝර්නෙල් විශ්වවිද්‍යාලය <https://www.law.cornell.edu/wex/in_personam> - ප්‍රවේශ වූ දිනය - 2019 නොවැම්බර් 21
34. ඇමුණුම 01 - VI වන කොටස දීර්ඝ කළ රාජසන්තක කිරීම බලන්න
35. මෙම සංකල්පය පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් සඳහා අපරාධ වලින් උපයා ගත් දේපළ රාජසන්තක කිරීමේ කාර්යයන් සඳහා වන ජාත්‍යන්තර සහයෝගීතාවය පිළිබඳ අත්පොත බලන්න, පිටුව <https://www.un.org/ruleoflaw/files/Confiscation_Manual_Ebook_E.pdf>
36. ඇමුණුම 01- 13 වන කොටස බලන්න
37. ජීන් පියෙරෙ බ්‍රන්, ලැරිසා ග්‍රේ, ක්ලයිව් ස්කොට්, කෙවින් එම්. සටිවන්සන්, වත්කම් ආපසු ලබා ගැනීම පිළිබඳ අත්පොත, වෘත්තිකයින් සඳහා වන උපදෙස් සංග්‍රහය, 117 වැනි පිටුව

## 4.3 වරදකරු නොකිරීම පදනම් කර ගත් රාජසන්තක කිරීමේ කටයුතු[38]

මෙම ප්‍රතිපත්තිය විසින් "වරදකරු නොකිරීම පදනම් කර ගත් වත්කම් ආපසු ලබා ගැනීම" ලෙස හඳුන්වන සියලු දෙනා බැඳී සිටින[39] ක්‍රියාවලිය පිළිගනු ලැබේ. මෙම කාර්ය ක්‍රමය ආරම්භ කිරීම සඳහා, "අපරාධ චෝදනා ස්ථාපිත කර තිබීමේ හෝ දණ්ඩන විනිශ්චයක් ලබා තිබීමේ අවශ්‍යතාවයක් නොමැත."[40] සිවිල් ක්‍රියාවක් වන මෙය සම්භාව්‍යතා වැඩිබර සම්මතය මත වත්කම් ආපසු ලබා ගැනීමට උපකාරී වන අතර, සාපරාධී නඩු කටයුතුවලට සමගාමීව මෙම කටයුතු ක්‍රියාත්මක කළ හැකිය. සාපරාධී නඩු කටයුතු යාන්ත්‍රණය හරහා වත්කම් ආපසු ලබා ගැනීමේදී පවතින අභියෝග ජය ගැනීම සඳහා, විශේෂයෙන්ම සාපරාධී සාක්ෂි සම්මතයකට ගැළපෙන සාක්ෂි නොතිබෙන හෝ වැරදිකරු වෙත ප්‍රවේශ විය නොහැකි අවස්ථාවල (උදා: මියගිය, අපරාධ යුක්තියෙන් පලාගිය, හෝ අපරාධ නඩු පැවරීමෙන් නිර්මුක්තිය සඳහා හිමිකම් පෑම)[41] මෙම ක්‍රියාවලිය බොහෝ රටවල භාවිතා කරනු ලැබේ.

මෙම ප්‍රතිපත්තිය යටතේ, චූදිතයා වරදකරු කර නොමැති වුවද, නීතිය යටතේ පිහිටුවා ඇති ආයතනයට අපරාධ වලින් උපයාගෙන ඇතැයි විශ්වාස කරන දේපළ රාජසන්තක කිරීම සඳහා වරදකරු නොකරන පදනමෙන් වත්කම් අයකර ගැනීමේ කටයුතු ආරම්භ කළ හැකිය. මෙම විධිවිධානය යටතේ සාධන භාරය සම්භාව්‍යතා වැඩි බර වන නිසා වරද සිදු කිරීම සහ හඳුනාගත් වත්කම අතර කාරණාවාචී සම්බන්ධතාවයක් ඔප්පු කිරීමට රජයට සිදු නොවේ. වත්කම් රාජසන්තක කිරීම සඳහා මෙය උපකාරී විය හැකි නමුත්, අපරාධ යුක්ති විනිශ්චය ක්‍රමවේදය තුළ ඇති ප්‍රමාදයන් මගහරිමින්, මෙම ක්‍රියාවලිය අනිසි ලෙස භාවිතා කිරීමේ හැකියාව පිළිබඳව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා සිය අවධානය යොමු කළේය. මෙය ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා විසින් අවශ්‍යතාවය, සමානුපාතිකත්වය සහ පොදු යහපත යන මාර්ගෝපදේශ මූලධර්ම නිර්දේශ කිරීමට එක් හේතුවක් වූ අතර (4.10 වැනි උපවගන්තිය බලන්න) මෙය පුළුල් සිවිල් සමාජ අදහස් විමසීමකට යොමු කළ යුතුය. සාධන භාරයන් ප්‍රතිනමනය කිරීමේ විකල්ප ක්‍රම අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියෙහි දැඩි ලෙස අවශ්‍ය කර ඇති ප්‍රතිසංස්කරණ සඳහා වන කඩිනම් විසඳුමක් ලෙස නොසැලකිය යුතු බව ද ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා සංවිධානය නැවත අවධාරණය කර සිටියි.

## 4.4 පැහැදිලි නොකළ වත්කම් උපයාගත් ආකාරය හෙළි කරන ලෙස අණ කෙරෙන නියෝග[42]

මෙම ප්‍රතිපත්තිය මගින්, එක්සත් රාජධානිය වැනි රටවල භාවිතා කරනු ලබන, පැහැදිලි නොකළ වත්කම් උපයා ගත් ආකාරය හෙළි කරන ලෙස නිකුත් කරනු ලබන නියෝග නැමති සාක්ෂි එක්රැස් කිරීමේ නව මෙවලමක් සඳහා විධිවිධාන සලසයි.[43] යෝජිත ප්‍රතිපත්තියේ දී, සාධාරණ හේතු මත, වසර 5 ක හෝ එයට වැඩි කාලයක සිර දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කර ඇති හෝ අපරාධ වලින් උපයාගත් දේපළ ගනුදෙනු කර ඇති ඕනෑම පුද්ගලයෙකුට එම වත්කම් උත්පාදනය කළ ආකාරය දිවුරුම් ප්‍රකාශ මගින් හෙළි කරන ලෙස නියම කිරීමට අධිකාරියට බලය ඇත. "යෝජිත නීතිය මගින් ඕනෑම පුද්ගලයෙකුට තමා සතු වත්කම් අත්පත් කර ගත් ආකාරය පිළිබඳ දිවුරුම් ප්‍රකාශයක් කරන ලෙස නොතීසියක් නිකුත් කිරීමට අධිකාරියට බලය ලැබෙනු ඇත". පැහැදිලි නොකළ වත්කම් උපයාගත් ආකාරය හෙළි කරන ලෙස නිකුත් කරනු ලබන නියෝගයකට අනුකූලව කටයුතු නොකිරීමෙන් දණ්ඩනීය ප්‍රතිවිපාක ලැබේ.

එක්සත් රාජධානිය හා සංසන්දනය කිරීමේදී, ප්‍රශ්නයට තුඩු දී සිටින පුද්ගලයා "ඔහුගේ ආදායම් ඉක්මවා සැක සහිත දේපළවල හිමිකරුවෙකු විය හැකි බවට විනිසුරුවරයා සෑහීමකට පත්වන්නේ නම් පමණක් සහ පහත සඳහන් සියලු පරීක්ෂණ සපුරා ඇත්නම් මහාධිකරණයකට පැහැදිලි නොකළ වත්කම් උපයාගත් ආකාරය හෙළි කරන ලෙස නියෝගයක් නිකුත් කළ හැක:

1. වගඋත්තරකරු යුරෝපීය ආර්ථික ප්‍රදේශයෙන් පිටත දේශපාලනිකව නිරාවරණය වූ පුද්ගලයෙකි; නැතහොත් වගඋත්තරකරු බරපතල අපරාධවලට සම්බන්ධ වී සිටින හෝ සිටි බවට සැක කිරීමට සාධාරණ හේතු තිබේ;
2. වත්කම ලබා ගැනීමට වගඋත්තරකරුගේ ගම්‍ය ආදායම ප්‍රමාණවත් නොවේ;
3. වත්කමෙහි වටිනාකම පවුම් 50,000 ට වඩා වැඩිය."[44]

38. ඇමුණුම 01 - VIII කොටස - වරදකරු නොකිරීම පදනම් කරගත් රාජසන්තක කිරීමේ කටයුතු බලන්න

39. "සියලු දෙනා බැඳී සිටින" යන්න "යම් දෙයකට එරෙහිව" ලෙස පරිවර්තනය කළ හැකිය. "සියලු දෙනා බැඳී සිටින අධිකරණ පාත්‍රතාව" යන්නෙන් මූර්ත හෝ පුද්ගලික දේපළක් සම්බන්ධයෙන් අධිකරණය සතු බලය අදහස් කෙරෙයි. නීති තොරතුරු ආයතනය, කෝර්නෙල් විශ්වවිද්‍යාලය

40. මෙම සංකල්පය පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් සඳහා අපරාධ වලින් උපයාගත් දේපළ රාජසන්තක කිරීමේ අරමුණු සඳහා වන ජාත්‍යන්තර සහයෝගිතාව පිළිබඳ අත්පොත, 20 වැනි පිටුව බලන්න, ප්‍රවේශ වූ දිනය - 2019 ඔක්තෝබර් 30 <https://www.un.org/ruleoflaw/files/Confiscation_Manual_Ebook_E.pdf>· මුදල් විශුද්ධිකරණයට හා ත්‍රස්තවාදයට හා ව්‍යාප්තියට අරමුදල් සැපයීමට එරෙහිව සටන් කිරීම පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිති, FATF නිර්දේශ, පිටුව 122 ද බලන්න, ප්‍රවේශ වූ දිනය - 2019 ඔක්තෝබර් 30 <http://www.fatf-gafi.org/media/fatf/documents/recommendations/pdfs/FATF%20Recommendations%202012.pdf>

41. මෙම සංකල්පය පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් සඳහා අපරාධ වලින් උපයාගත් දේපළ රාජසන්තක කිරීමේ අරමුණු සඳහා වන ජාත්‍යන්තර සහයෝගිතාව පිළිබඳ අත්පොත, 20 වැනි පිටුව බලන්න, ප්‍රවේශ වූ දිනය - 2019 ඔක්තෝබර් 30 https://www.un.org/ruleoflaw/files/Confiscation_Manual_Ebook_E.pdf

42. ඇමුණුම 01 - XIV කොටස - පැහැදිලි නොකළ වත්කම් උපයාගත් ආකාරය හෙළි කරන ලෙස නිකුත් කරනු ලබන නියෝග බලන්න

43. අපරාධ මුදල් පනත 2017, 1 වැනි පරිච්ඡේදය, පැහැදිලි නොකළ වත්කම් උපයාගත් ආකාරය හෙළි කරන ලෙස නිකුත් කරනු ලබන නියෝග, ප්‍රවේශ වූ දිනය - 2019 ඔක්තෝබර් 30<http://www.legislation.gov.uk/ukpga/2017/22/part/1/chapter/1/crossheading/unexplained-wealth-orders-england-and-wales-and-northern-ireland/enacted?view=interweave>

44. පැහැදිලි නොකළ වත්කම් උපයාගත් ආකාරය හෙළි කරන ලෙස නිකුත් කරනු ලබන නියෝග - සංක්ෂිප්ත මාර්ගෝපදේශයක් - ප්‍රවේශ වූ දිනය - 2019 ඔක්තෝබර් 30 <http://www.legislation.gov.uk/ukpga/2017/22/part/1/chapter/1/crossheading/unexplained-wealth-orders-england-and-wales-and-northern-ireland/enacted?view=interweave>

පැහැදිලි නොකළ වත්කම් උපයාගත් ආකාරය හෙළි කරන ලෙස නියෝග නිකුත් කිරීමට ශ්‍රී ලංකාවේ පහත දැක්වෙන නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට මෙම ප්‍රතිපත්තිය මගින් බලය ලබා දෙයි:

අ. පොලිසිය (අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සහ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය ඇතුළුව)

ආ. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

ඇ. ශ්‍රී ලංකා රේගුව

ඈ. ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව

ඉ. ශ්‍රී ලංකා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

ඊ. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

උ. සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

ඌ. අපරාධ වලින් උපයාගත් දේපළ ආපසු ලබා ගැනීමේ සහ කළමනාකරණය කිරීමේ ශ්‍රී ලංකා අධිකාරිය

එම නියෝග පහත සඳහන් කාරණා පමණක් භාවිතා කළ හැක:

- සිදු කර තිබිය හැකි බරපතල අපරාධ පිළිබඳ අපරාධ පරීක්ෂණ පැවැත්වීමේදී 'විමර්ශන තොරතුරු රැස් කිරීම සඳහා; හෝ
- වරදකරු නොකිරීම පදනම් කරගත් රාජසන්තක කිරීමේ කටයුතු ආරම්භ කිරීම හැකි වීමේ පදනමක් ලෙස.

එකී දිවුරුම් ප්‍රකාශයෙහි අන්තර්ගත කරුණු දිවුරුම් පෙත්සම සාදන්නාට එරෙහිව පසුව සිදු කරනු ලබන අධිකරණ ක්‍රියාමාර්ගයන්හි දී සාක්ෂි ලෙස පිළිගත නොගත යුතුය.

සුළු වැරදි සඳහා පවා පැහැදිලි නොකළ වත්කම් උපයාගත් ආකාරය හෙළි කරන ලෙස නියෝග නිකුත් කරනු ලැබීමට බලය ලැබිය හැකි බැවින්, ඕනෑම වරදක් සඳහා ඕනෑම පුද්ගලයෙකුට එරෙහිව නොව, බරපතල අපරාධ සම්බන්ධයෙන් පමණක් පැහැදිලි නොකළ වත්කම් උපයාගත් ආකාරය හෙළි කරන ලෙස නියෝග නිකුත් කිරීමට අවසර දිය යුතු බව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා හි යෝජනාවක් විය. එසේ වුවද, එම බලතල අනිසි ලෙස භාවිතා කිරීමේ හැකියාව පිළිබඳ අවධානයන් ඉතිරිව තිබෙන අතර, වසර 5 ට වැඩි සිර දඬුවමක් නියම කරනු ලැබිය හැකි වරදක් සිදු කර ඇත්දැයි තීරණය කිරීම සඳහා සාධාරණ පදනමක් සංස්ථාපනය කරන්නේ කුමකින්ද යන්න තීරණය කිරීමේදී නීතිය ක්‍රියාත්මක කරන ආයතන පරීක්ෂා කිරීම සඳහා වන පරීක්ෂණ ස්ථාපිත කළ යුතු වේ.

## 4.5 වාර්තා කිරීමේ වගකීම[45]

අපරාධ වලින් උපයාගත් දේපළ තිබීම පිළිබඳව දන්නා නිශ්චිතව සඳහන් කර ඇති පුද්ගලයින්ට යෝජිත නීතිය යටතේ පිහිටුවා ඇති ආයතනයට එම තොරතුරු හෙළිදරව් කිරීමේ වගකීමක් පවරා තිබේ. මෙම වගකීම මුදල් විශුද්ධිකරණ පනත සහ මූල්‍ය ගනුදෙනු නීතිය යටතේ පැවරී ඇති වාර්තා කිරීමේ වලකීම නැවත අවධාරණය කිරීමක් වේ. නිශ්චිත පුද්ගලයින් නව නීතිය යටතේ නිර්වචනය කරනු ඇති අතර, අවම වශයෙන් එයට මුදල් විශුද්ධිකරණ පනත සහ මූල්‍ය ගනුදෙනු නීතිය යටතේ පිළිගත් පුද්ගලයින් සමූහය සහ ආයතන ඇතුළත් වනු ඇති බව සැලකිල්ලට ගනු ලැබීය. එකතු කළ යුතු තවත් යම් පුද්ගලයින් හෝ කණ්ඩායම්, ඔවුන් ඇතුළත් කිරීම සඳහා වන දැඩි, ලේඛනගත තාර්කිකත්වයන් මත පමණක් ඇතුළත් කළ යුතු වේ.

සාපරාධී ක්‍රියාවක් ඉදිරියට ගෙන යාම සම්බන්ධයෙන් පුද්ගලයෙක් නීතිඥයෙකු සමඟ සන්නිවේදනය කරන විට, සාමාන්‍යයෙන් නීතිඥයා හා සේවාදායකයා අතර ඇති සංනිවේදනයට සම්බන්ධ වෘත්තීය වරප්‍රසාදය සඳහා හිමිකම ඉල්ලා සිටිය නොහැකි බවට වන පොදු නීති ස්ථාවරය ද මෙම ප්‍රතිපත්තිය මගින් පිළිගෙන ඇත.[46] නිසි පරිදි ක්‍රියාත්මක කළ හොත් වෘත්තිකයින් විසින් අපරාධ සඳහා පහසුකම් සැලසීම වැළැක්වීමට මෙම ක්‍රියාමාර්ග මහෝපකාරී වනු ඇත.

## 4.6 සිදු කෙරෙමින් පවතින විමර්ශන ආරක්ෂා කිරීම - රහස්‍යභාවය පිළිබඳ විධිවිධාන සහ තොරතුරු දැනගැනීමේ අයිතිය

දැනට පවත්නා විමර්ශනවලට අදාළ දත්ත ආරක්ෂා කර ගැනීම පිණිස ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය තුළ තිබෙන රහස්‍යභාවය සම්බන්ධ විධිවිධාන මෙම නීතියට ඇතුළත් කිරීමේ අවශ්‍යතාවය රාජ්‍ය නිලධාරීන් විසින් ඉදිරිපත් කරන ලද ප්‍රධාන යෝජනාවක් විය.

වත්කම් ආපසු අයකර ගැනීම පිළිබඳ ගෝලීය සංසදයට පෙර ප්‍රකාශයට පත් කරන ලද වත්කම් ආපසු අය කර ගැනීම පිළිබඳ තම ඡායා වාර්තාවෙහි ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා විසින් අවධාරණය කර ඇති පරිදි, නැතිවූ සහ පරිග්‍රහණය කරන ලද වත්කම් ප්‍රමාණය පිළිබඳව සහ එම වත්කම් පිහිටා ඇති භූගෝලීය ස්ථාන පිළිබඳව තොරතුරු නොමැතිකම ශ්‍රී ලංකාවේ ප්‍රධාන අවධානයන්ගෙන් එකක් වේ.[47] ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා සංවිධානය මෙම නීතියට රහස්‍ය විධිවිධානයක් ඇතුළත් කිරීමට එරෙහිව පෙනී සිටි අතර, දැනට සිදු කෙරෙමින් පවතින විමර්ශනවල තොරතුරු නැවැත්වීමට ප්‍රමාණවත් ආරක්ෂාවන් සපයන, දැනට ක්‍රියාත්මක තොරතුරු

45. ඇමුණුම 01 - IV වැනි වගන්තිය - වාර්තා කිරීමේ වගකීම් බලන්න
46. ඇමුණුම 01 - 44 වැනි වගන්තිය බලන්න
47. ශ්‍රී ලංකාව පිළිබඳ සිවිල් සමාජ සංවිධාන වත්කම් ආපසු ලබා ගැනීම පිළිබඳ ගෝලීය සංසදයේ වාර්තාව, <https://www.tisrilanka.org/wp-content/uploads/2017/12/Sri-Lanka-Asset-Recovery-CSO-Report-final.pdf>

දැනගැනීමේ අයිතිය පිළිබඳ රාමුවට මෙම නීතිය යටත් කරන ලෙස සාමාජිකයින්ට ආරාධනා කළේය. මෙම ආරක්ෂාවන් සැලකිල්ලට ගනිමින් අවසාන ප්‍රතිපත්ති ලේඛනයෙහි රහස්‍ය විධිවිධාන ඇතුළත් කර නොමැත. ඇත්ත වශයෙන්ම, මෙම පනතෙහි "මෙම පනත යටතේ බලයලත් කිසිදු නීතිය ක්‍රියාත්මක කරන නිලධාරියෙකු, (ආ) කිසියම් නීතියකට අනුකූලව කටයුතු කරන්නේ නම් මිස, හෝ තව කිසියම් විමර්ශනයක් අතරතුර එකතු කර ගන්නා ලද හෝ ලැබුණු මොනයම් හෝ තොරතුරක් කිසිදු පුද්ගලයෙකුට හෙළි නොකළ යුතුය." යනුවෙන් සඳහන් කිරීම මගින් මෙම පනත තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීතියට යටත් විය හැකි බව පිළි ගනී.[48]

## 4.7 අපරාධවලින් උපයාගත් දේපළ ආපසු ලබා ගැනීම සහ කළමනාකරණය කිරීම සඳහා වන ශ්‍රී ලංකා අධිකාරිය සහ ආයතනික වැඩපිළිවෙල[49]

මෙම ආයතනය සොරකම් කරන ලද වත්කම් ආපසු ලබා ගැනීම සම්බන්ධ කාරණා සඳහා විශිෂ්ටත්වයේ කේන්ද්‍රස්ථානයක් ලෙස සංවර්ධනය විය යුතු ආයතනයක් බවට අපේක්ෂා කෙරේ. අධිකාරිය පහත සඳහන් පුද්ගලයින්ගෙන් සමන්විත මණ්ඩලයක් විසින් කළමනාකරණය කරනු ලැබේ:

අ. නීතිපති හෝ ඔහු විසින් නම් කරන ලද තැනැත්තා
ආ. පොලිස්පති හෝ ඔහු විසින් නම් කරන ලද තැනැත්තා
ඇ. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් හෝ නම් කරන ලද තැනැත්තා
ඈ. අදාළ ආයතන ප්‍රධානියා විසින් නම් කරනු ලැබ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් පහත සඳහන් එක් එක් ආයතන වලින් පත් කරනු ලබන ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු බැගින්:
  i. ශ්‍රී ලංකා රේගුව
  ii. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
  iii. සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව
  iv. ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය
  v. අධිකරණ අමාත්‍යංශය
  vi. මුදල් අමාත්‍යංශය
  vii. විදේශ කටයුතු අමාත්‍යංශය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් සභාපතිවරයාට අමතරව පහත ක්ෂේත්‍රවල විශේෂඥභාවය සහිත පුද්ගලයින් හතර දෙනෙකු ද පත් කළ යුතුය:

අ. අපරාධ යුක්තිය,
ආ. අපරාධ වලින් උපයාගත් දේපළ පරිපාලනය සහ කළමනාකරණය,
ඇ. ආර්ථිකවිද්‍යාව, මුදල් සහ විගණනය, සහ
ඈ. අදාළ සිවිල් සමාජ ක්‍රියාකාරීත්වය.

අධිකාරිය යනු පහත සඳහන් දෑ සඳහා වන වගකීම් ද ඇතුළුව පුළුල් පරාසයක බලතල සහිත නීතිය ක්‍රියාත්මක කරන ආයතනයකි:

- අනෙකුත් නීති බලාත්මක කිරීමේ ආයතන සමග සම්බන්ධීකරණය.
- අපරාධ වලින් උපයාගත් දේපළ පරිග්‍රහණය, පවරා දීම, කළමනාකරණය කිරීම සහ රාජසන්තක කිරීම / අහිමිකරණය සම්බන්ධ දත්ත සංචිතයක් පවත්වාගෙන යාම.
- වරදකරු නොකිරීම පදනම් කරගත් රාජසන්තක කිරීමේ කටයුතු ආරම්භ කිරීම සඳහා අධිකරණයේ නීතිමය ක්‍රියාමාර්ග ගැනීම.
- මෙම නීතියේ විධිවිධානවලට අදාළ බලාත්මක කිරීමේ අංග පිළිබඳව පර්යේෂණ පැවැත්වීම.
- අනෙකුත් ව්‍යවස්ථාපිත ආයතන සහ නීතිය ක්‍රියාත්මක කරන ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් වලට හා වෙනත් කටයුතු කිරීමේ වැඩපිළිවෙළ වලට එළඹීම.

පහත සඳහන් ආයතන වලට ද ඇතුළුව අනෙකුත් නීතිය ක්‍රියාත්මක කිරීමේ බලධාරීන්ට බලය පැවරීමේ හැකියාව අධිකාරිය සතු වැදගත් බලතලවලින් එකක් වේ:

අ. පොලිසිය (අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සහ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය ඇතුළුව)
ආ. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
ඇ. ශ්‍රී ලංකා රේගුව
ඈ. ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
ඉ. ශ්‍රී ලංකා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
ඊ. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
උ. සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

එමෙන්ම, තිබෙන ස්ථානය සොයා ගැනීමට සහ පරිග්‍රහණය කිරීමට විශේෂ කුසලතාවයන් අවශ්‍ය කරන වත්කම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී දායකත්වය ලබා ගත හැකි බාහිර විශේෂඥයින් ඇතුළු ඒකාබද්ධ විමර්ශන කණ්ඩායම් පිහිටුවීමට ද එයට බලය ඇත.

දේපළ පරිග්‍රහණය කළ පසු, නීතිමය කටයුතු අවසන් වන තෙක් එම දේපළ කළමනාකරණය කිරීම අපරාධවලින් උපයාගත් දේපළ ආපසු ලබා ගැනීම සහ කළමනාකරණය කිරීම සඳහා වන ශ්‍රී ලංකා අධිකාරියෙහි වගකීම වේ. වත්කම් තාවකාලිකව පරිපාලනය කිරීමට

48. ඇමුණුම 01 - 40 වැනි වගන්තිය බලන්න
49. ඇමුණුම 01 - XIII වැනි කොටස - අපරාධවලින් උපයාගත් දේපළ ආපසු ලබා ගැනීම සහ කළමනාකරණය කිරීම සඳහා වන ශ්‍රී ලංකා අධිකාරිය (අධිකාරිය) සහ ආයතනික වැඩපිළිවෙල

අමතරව, අපරාධ වලින් උපයාගත් දේපළ පිළිබඳව විමර්ශන පැවැත්වීම සහ අධිකරණ නියෝග මත ඒවා බැහැර කිරීම ද මෙම ආයතනයට පැවරෙන වගකීමක් වේ. ඔවුන්ගේ නියෝගය ක්‍රියාත්මක කිරීමේදී, වෙනත් ව්‍යවස්ථාපිත ආයතන හා නීතිය ක්‍රියාත්මක කරන ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් වලට සහ වෙනත් වැඩ පිළිවෙල වලට එළඹීමට ඔවුන්ට බලය ඇත.

බලයලත් නීතිය බලාත්මක කිරීමේ ආයතනයක් විසින් යෝජිත නීතිය යටතේ අපරාධ වලින් උපයා ගත් දේපළ පරිග්‍රහණය කරන විට, එම ආයතනය වැඩකරන දින 3 ක් ඇතුළත එම පරිග්‍රහණය කිරීම පිළිබඳව අධිකාරියට දැනුම් දිය යුතු වේ. එම පරිග්‍රහණය කිරීම පිළිබඳ අධිකරණයේ වාර්තාවක් ගොනු කිරීම සඳහා ඔවුන්ට වැඩකරන දින 7 ක කාලයක් ලබා දී ඇත. පරිග්‍රහණය කිරීම බලය ඉක්මවා සිදු නොකරන බව සහතික කිරීම පිණිස සහ යම් අයෙකුගේ වත්කම් පරිග්‍රහණය කළ විට එම අයගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වගවීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වන බවට සහතික කිරීම සඳහා මෙම විධිවිධාන ආරක්ෂක විධිවිධාන ලෙස ඇතුළත් කර ඇත.

අධිකාරිය ඉහළ මට්ටමේ නීතිය ක්‍රියාත්මක කරන ආයතනවල නියෝජිතයින්ගෙන් සමන්විත වන අතර, අධීක්ෂණය කිරීමේදී සිවිල් සමාජය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කිරීමේ විකසනය වෙමින් පවතින ගෝලීය පරිචය පිළිබිඹු කරමින් කමිටුව තුළ සිවිල් සමාජ නියෝජනයක් තිබීමේ අවශ්‍යතාව රාජ්‍ය ක්‍රියාකාරීන් විසින් පිළිගනු ලැබීම දිරිගන්වන සුළු කරුණක් වේ.

## 4.8 රාජසන්තක කරන ලද, අපරාධ වලින් උපයාගත් දේපළ සඳහා වන භාරකාර අරමුදල (අරමුදල)

නීතිමය ක්‍රියාමාර්ග අනුගමනය කිරීමෙන් පසු දේපළ රාජසන්තක කර ඇත්නම්, වින්දිතයින්ට ඔවුන්ගේ අලාභය සඳහා වන්දි ගෙවිය යුතු බවට මෙම නීතිය මගින් විධිවිධාන සලසා ඇත. ඉන් පසු, අත්පත් කරගත් දේපළ පරිපාලනය හා කළමනාකරණය සඳහා අධිකාරිය විසින් දරන ලද සත්‍ය වියදම හෝ දේපළ මගින් ලැබෙන ආදායමෙන් 10% ක් දක්වා වන මුදල යන දෙකෙන් වැඩි වටිනාකමට සමාන මුදලක් අධිකාරිය වෙත ප්‍රතිපූරණය කළ යුතු වේ.

ආපසු ලබා ගත් අරමුදල් කළමනාකරණය කිරීමේ යාන්ත්‍රණය ස්ථාපිත කිරීමේදී කමිටුවේ සමහර සාමාජිකයින් එම වත්කම් පොදු මධ්‍යගත ඒකාබද්ධ රාජ්‍ය අරමුදලක තැන්පත් කිරීමේ අවශ්‍යතාව පෙන්වා දුන්හ. ස්වාධීනව අධීක්ෂණය කරනු ලබන / පාලනය කරනු ලබන අරමුදලක් වෙනුවෙන් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා සංවිධානය දැඩි ලෙස පෙනී සිටියේය. සීමිත අධීක්ෂණයක් සහිතව තැන්පත් කළ මුදල් නැවත සොරකම් කර ඇති අවස්ථා පිළිබඳ උදාහරණ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා විසින් ඉස්මතු කර පෙන්වා දුන්නේය.[50] ජාතික විගණන කාර්යාලය මගින් වරින් වර සමාලෝචනය කරනු ලැබීම සහිතව එම අරමුදල පාර්ලිමේන්තුවේ අධීක්ෂණ යාන්ත්‍රණයට යටත් කිරීමේ වැදගත්කම ද ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා සංවිධානය විසින් පෙන්වා දෙන ලදී. එමෙන්ම, ආපසු ලබා ගන්නා ලද වත්කම් නිසි ලෙස කළමනාකරණය කිරීම අධීක්ෂණය කිරීම සඳහා ස්වාධීන භාරකාර මණ්ඩලයක් තිබීමේ වැදගත්කම ද ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා සංවිධානය පෙන්වා දුන්නේය. රාජසන්තක කරන ලද, අපරාධ වලින් උපයාගත් දේපළ සඳහා භාරකාර මණ්ඩලයක් විසින් අධීක්ෂණය කරනු ලබන භාරකාර අරමුදලක් තිබිය යුතු බවට කමිටුව එකඟ විය.

එම අරමුදල සාමාජිකයින් හත් දෙනෙකුගෙන් සමන්විත වනු ඇති අතර එම සාමාජිකයින් "යුක්තිය පසිඳලීම, නීතිය ක්‍රියාත්මක කිරීම, රාජ්‍ය මූල්‍යය, මූල්‍ය කළමනාකරණය, ව්‍යාපාර කළමනාකරණය, විගණනය සහ ඒ හා සම්බන්ධ සිවිල් සමාජ ක්‍රියාකාරීත්වය යන ක්ෂේත්‍රවල විශේෂඥතාවයෙන් හෙබි පුද්ගලයන් විය යුතුය. එම පුද්ගලයින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් පත් කරනු ලැබේ." අරමුදල විනිවිදභාවයකින් යුක්ත විය යුතු අතර, මහජනතාව විසින් පරීක්ෂා කරනු ලැබීම සඳහා විවෘත විය යුතුය. එමෙන්ම, එය ජාතික විගණන කාර්යාලය විසින් විගණනය කළ යුතු අතර, විගණනය කරන ලද ගිණුම් ප්‍රසිද්ධියේ පළ කර, වාර්ෂිකව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය.

ක්‍රියාවලියෙහි ආරම්භක අවධියේ සිටම සිවිල් සමාජ සංවිධාන වත්කම් කළමනාකරණය කිරීමෙහි කොටසක් බවට පත් කළ යුතු බවට වූ යෝජනාව පිළිගෙන ප්‍රතිපත්තියට ඇතුළත් කර තිබීම ඉතාමත් දිරිගන්වන සුළු ය. ආපසු ලබා දුන් වත්කම් කළමනාකරණය හා බැහැර කිරීම සඳහා සිවිල් සමාජ සංවිධානවල සම්බන්ධ වීම වත්කම් ආපසු ලබා ගැනීම පිළිබඳ ගෝලීය සංසදයේ ප්‍රතිපත්තිවල යහ පරිචයක් ලෙස පිළිගෙන ඇත.[51]

50. ඇමුණුම 01 - XIII වැනි කොටස - අපරාධවලින් උපයාගත් දේපළ ආපසු ලබා ගැනීම සහ කළමනාකරණය කිරීම සඳහා වන ශ්‍රී ලංකා අධිකාරිය (අධිකාරිය) සහ ආයතනික වැඩපිළිවෙල
51. 22 වැනි පාද සටහන, 10 වැනි ප්‍රතිපත්තිය බලන්න

## 4.9 පරිග්‍රහණය කරන ලද සහ රාජසන්තක කරන ලද වත්කම් කළමනාකාරණය[52]

රාජසන්තක කරන ලද වත්කම් භාවිතය සඳහා පහත සඳහන් අරමුණු ((අ) - (ඊ)) ඇතුළත් කළ යුතු බව කමිටුවේ රාජ්‍ය නියෝජිතයින් තරයේ කියා සිටියහ (ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා සංවිධානයෙහි ඉදිරිපත් කිරීම්වලට අනුව (උ) පසුව එකතු කරන ලදී):

(අ) අපරාධ වලින් උපයාගත් දේපළ ආපසු ලබා ගැනීම සඳහා වන සිය උත්සාහයන් තුළ නීතිය ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කිරීම;

(ආ) යුක්තිය පසිඳලීම ශක්තිමත් කිරීම;

(ඇ).අපරාධවල වින්දිතයින්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම;

(ඈ). අපරාධ වැළැක්වීමේ ක්‍රියාමාර්ග සංවර්ධනය කිරීම හා පවත්වාගෙන යාම;

(ඉ). මෙම නීතියෙහි විධිවිධාන බලාත්මක කිරීම හා සම්බන්ධ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ට නීත්‍යානුකූල දිරිදීමනා ලබා දීම;

(ඊ). තොරතුරු ලබා දෙන්නන් සඳහා පරිත්‍යාග අරමුදලී නමින් අරමුදලක් ශක්තිමත් කිරීම;

(උ). තිරසර සංවර්ධන ඉලක්කවල අරමුණු සපුරා ගැනීම.

යෝජිත නීතිය අපරාධ වැළැක්වීම සහ අපරාධ යුක්ති විනිශ්චය පද්ධතිය ශක්තිමත් කිරීම කෙරෙහි වැඩි නැඹුරුවක් දක්වන බවත්, ආපසු ලබා ගන්නා ලද වත්කම් එම වත්කම් සොරකම් කිරීමට පෙර අයිතිව තිබූ ශ්‍රී ලංකාවේ වින්දිතයින්ගේ ප්‍රතිලාභය සඳහා යොදා ගනු ලබන බව සහතික කිරීම කෙරෙහි අඩු අවධානයක් යොමු කර ඇති බවත් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා පෙන්වා දුන්නේය. කමිටුව විසින් ලොව පුරා සිදු කරනු ලබන පරිදි සමාජ සංවර්ධන යෝජනා ක්‍රම සඳහා අරමුදල් භාවිතා කිරීමේ යහ පරිචයන් අනුගමනය කළ යුතු යැයි ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා තරයේ කියා සිටියේය. ළමයින්ගේ හා තරුණයින්ගේ ප්‍රයෝජනය සඳහා අරමුදල් භාවිතා කරන කසකස්තානයේ බෝටා පදනම් ආකෘතිය ආපසු ලබා ගත් වත්කම් ජනතාවගේ යහපත සඳහා, එනම් සමාජ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා භාවිතා කරන අවස්ථාවකට එක් ප්‍රකට උදාහරණයක් වේ.[53]

දූෂණයෙහි වින්දිතයින්ට වන්දි ගෙවිය යුතුය යන්න පිළිගත් මූලධර්මයකි.[54] අල්ලස හා දූෂණය ද ඇතුළු අපරාධ මගින් හඳුනාගත හැකි පුද්ගලයින්ට, පුද්ගල කණ්ඩායම්වලට සහ පුළුල් සමාජයට හානි සිදු විය හැකිය. මුලින් සඳහන් කරන ලද කණ්ඩායම් දෙක වින්දිතයින් ලෙස සහ වන්දි ලැබිය යුතු කණ්ඩායම් ලෙස හඳුනාගත හැකි අතර, සමාජ මට්ටමින් සිදු වූ හානිය අලුත්වැඩියා කිරීම ද වැදගත් වේ. එවැනි ආකාරයේ හානි මගින් සෞඛ්‍ය, අධ්‍යාපනය සහ ආරක්ෂාව වැනි සාමූහික මූලික අයිතිවාසිකම් කෙරෙහි බලපෑම් ඇති කළ හැකිය. මෙවැනි හානි මැනීම දුෂ්කර බැවින් එය බොහෝ විට වැදගත් නොවන සහ ප්‍රායෝගිකව කළ නොහැකි දෙයක් ලෙස නොසලකා හරිනු ලබන බව කමිටුවේ අවධානයට යොමු කළේය.

තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම සමාජයට සිදුවන හානිය සමනය කිරීම සඳහා වැදගත් වන ක්‍රම වලින් එකක් වේ. තිරසර සංවර්ධන ඉලක්ක යන යෙදුම ප්‍රකාශිතවම යොදා ගෙන නොමැති නමුත්, ආපසු ලබා ගත් වත්කම් කළමනාකරණ කිරීමේදී එම වත්කම් ප්‍රභව රටවල ප්‍රජා සුභසාධනය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති සඳහා යොදා ගැනීම ලොව පුරා තිබෙන ප්‍රවණතාවය බව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා පෙන්වා දුන්නේය.

නිදසුනක් වශයෙන්, ඉතාලියෙහි නීතියට අනුව, ආපසු ලබාගත් වත්කම් නීතිය ක්‍රියාත්මක කිරීමේ සහ සිවිල් ආරක්ෂණ කාර්යයන් සඳහා භාවිතා කිරීමේ හැකියාවට අමතරව සමාජ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ද යොදා ගත හැකිය.[55] රාජසන්තක කරන ලද වත්කම් පොදු යහපත සහ සමාජ අරමුණු සඳහා භාවිතා කරන ලෙසට අංක 2014/42/ඊ යු දරණ යුරෝපා සංගම් නියෝගය මගින් සිය සාමාජික රටවල් දිරිගන්වනු ලැබේ.

මෙම ප්‍රතිපත්තියට අනුව, ආපසු ලබාගත් අරමුදල් භාවිතා කළ හැකි ක්ෂේත්‍ර ලෙස තිරසර සංවර්ධන ඉලක්ක යටතේ වන ප්‍රමුඛතා ඉලක්ක හඳුනා ගැනීමේ අවශ්‍යතාවය ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා දැඩිව අවධාරණය කළේ ය. ප්‍රමුඛතා සැලකිල්ල අවශ්‍ය වන්නේ කුමන අරමුණු සඳහාද යන්න තීරණය කිරීමේ අභිමතය අරමුදලේ භාරකාර මණ්ඩලය සතු විය යුතුය. කෙටුම්පත් කමිටුව මෙම යෝජනාව පිළිගෙන එය ඉහත (උ) උප වගන්තියට ඇතුළත් කරන ලදී.

මෙම ප්‍රතිපත්තියට අනුව, පරිග්‍රහණය කරනු ලබන, එහෙත් එරෙහිව නඩු කටයුතු ආරම්භ නොකෙරෙන වත්කම් (වරදකරු කිරීමෙන් පසුව රාජසන්තක කිරීමේ, වරදකරු නොකිරීම පදනම් කරගත් ආපසු ලබා ගැනීමේ හෝ දීර්ඝ කළ රාජසන්තක කිරීමේ ක්‍රියාමාර්ග) ලබන්නා වීම සඳහා සුදුසුකම ඇතැයි අධිකරණ සෑහීමකට පත් කළ හැකි පුද්ගලයාට/පුද්ගලයින්ට අධිකරණ නියෝගයක් මගින් ආපසු ලබා දිය යුතුය. සිදු විය හැකි දේපළ අයිතිවාසිකම් ආක්‍රමණය කිරීම්

52.ඇමුණුම 01 IX කොටස - රාජසන්තක කර නොමැති පරිග්‍රහණය කළ දේපළ, XI කොටස - රාජසන්තක කළ දේපළ අනුපාතනය කිරීම සහ භාර අරමුදලකට මාරු කිරීම් බලන්න

53. BOTA පදනම <https://www.irex.org/resource/bota-foundation-final-report> ප්‍රවේශ වූ දිනය - 2019 සැප්තැම්බර් 10

54. දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය, 32 වැනි වගන්තිය, 57(3)(ඇ) වගන්තිය, සහ වත්කම් ආපසු ලබා ගැනීම පිළිබඳ ගෝලීය සංසදයෙහි ප්‍රතිපත්ති

55. ඉතාලි නීතිය 109/1996

වලට එරෙහි ආරක්ෂණයක් ලෙස මෙය ඇතුළත් කරන ලදී. එවැනි බලපෑම් අවම කිරීම සඳහා වන මෙම පියවරයන් ඇතුළත් කර ඇති නමුත්, ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ආරක්ෂා කර ඇති මූලික අයිතිවාසිකම් වලට අනුකූල වීම සහතික කිරීම පිණිස, අධිකාරියේ අවසාන අයිතිවාසිකම් සහ බලතල පිළිබඳව, විශේෂයෙන්ම කෙටුම්පත් කර ඇති පනත් කෙටුම්පතක ඇතුළත් විය හැකි පරිග්‍රහණය කිරීමේ බලතලවල යම් දීර්ඝ කිරීමකදී, පුළුල් සිවිල් සමාජ අදහස් විමසීමක් සිදු කර, ඉදිරිපත් වන අදහස් දැඩි ලෙස සලකා බැලිය යුතුය.

## 4.10 අන්තර්ජාතික සහයෝගීතාවය

විදේශ රටවල නීතිය ක්‍රියාත්මක කරන ආයතන සහ විශේෂඥයින් ද ඇතුළත් විය හැකි ඒකාබද්ධ විමර්ශන කණ්ඩායම් කැඳවීමට අධිකාරියට බලය ඇති බව ප්‍රතිපත්තියේ සඳහන් වේ.[56] අපරාධ වලින් උපයාගත් දේපළ පරිග්‍රහණය කරන ලෙස, රාජසන්තක කරන ලෙස සහ ඒවායෙහි වටිනාකම ආපසු එවන ලෙස ඉල්ලා සිටිමින් විදේශ අධිකරණ හා නීතිය බලාත්මක කිරීමේ බලධාරීන් වෙත අයදුම්පත් ඉදිරිපත් කිරීමටත්, වෙනත් රටවලට අයත්, අපරාධ වලින් උපයා ගත් දේපළ ශ්‍රී ලංකා භූමියෙහි තිබී සොයාගත් විට වෙනත් රටවලින් ලැබෙන එවැනි ඉල්ලීම් භාර ගැනීමටත්, අපරාධ වලින් උපයාගත් දේපළ පවරා දීම සහ/හෝ බෙදා ගැනීම සඳහා අරමුදලෙහි අනුමැතිය ඇතිව විදේශීය රාජ්‍යයන් හෝ සංවිධාන සමඟ ගිවිසුම්වලට එළඹීමටත් අධිකාරියට බලය පැවරෙනු ඇත.[57]

මෙම සියලු විධිවිධාන සොරකම් කළ වත්කම් සාර්ථක ලෙස ආපසු ලබා ගැනීමේදී ඉතාමත් වැදගත් වන අන්තර්ජාතික සහයෝගීතාවයට අවශ්‍ය පදනම සපයයි. එවැනි ඉල්ලීම් නිසි වේලාවට හා ඵලදායී ලෙස ගලා ඒම අපරාධ වලින් උපයා ගත් දේපළ ආපසු ලබා ගැනීම ආරම්භ කිරීම සඳහා ඉතා වැදගත් සාධකයක් වේ. දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියෙහි 55 වැනි වගන්තිය මගින් අන්තර්ජාතික සහයෝගීතාවයෙහි වැදගත්කම අවධාරණය කර තිබේ.[58]

## 4.11 මූලික අයිතිවාසිකම් පිළිබඳ අවධානයන් සහ වත්කම් ආපසු ලබා ගැනීම සඳහා වන වින්දිත කේන්ද්‍රීය ප්‍රවේශය

සොරකම් කළ වත්කම් ආපසු ලබා ගැනීම සඳහා වින්දිතයින් කේන්ද්‍ර කරගත් ප්‍රවේශයක් අනුගමනය කිරීමේ අවශ්‍යතාවය ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා සංවිධානය ඉදිරිපත් කල ප්‍රධාන ප්‍රතිපත්තියක් විය. වත්කම් ආපසු ලබා ගැනීමේ ක්‍රියාවලියෙහි සෑම අදියරකදී ම මෙම ප්‍රවේශය අනුගමනය කරනු ලැබීම සහතික කිරීම පිණිස, අපරාධ යුක්තියෙහි අරමුණු සාක්ෂාත් කර ගැනීමට අමතරව, අවශ්‍යතාවය, සමානුපාතිකතාව සහ පොදු යහපත නැමති නීතියෙහි නියමු මූලධර්ම තුනක් හඳුනා ගත යුතු බව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා යෝජනා කළේය. එමෙන්ම, විස්තෘත වින්දිතයින්, එනම් ශ්‍රී ලංකාවේ පුරවැසියන් ද සලකා බලා භාරකාර අරමුදල යොදා ගනිමින් ඔවුන්ට වන්දි ගෙවිය යුතු බව ද ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා යෝජනා කළේය.[59] (ආපසු ලබාගත් වත්කම් කළමනාකරණය යටතේ ඉහත සඳහන් විස්තර බලන්න).

නීතියට ඇතුළත් කර ඇති, වින්දිතයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කළ හැකි තවත් විධිවිධාන තිබේ. නිදසුනක් ලෙස, වරදකරු කිරීමෙන් පසුව රාජසන්තක කිරීමේ පියවරයන් අත්හැර දැමීමේ අවස්ථා වලදී (උදා: හඳුනාගත් අපරාධ වලින් උපයාගත් දේපළ හෝ එහි වටිනාකම ඉතා සුළු වීම, හෝ චූදිතයාට හඳුනාගත හැකි වත්කම් නොමැති විට), අධිකාරිය විසින් වින්දිතයාගේ එකඟතාවය ලබා ගත යුතු යැයි අපේක්ෂා කෙරේ. එයට අමතරව, සිදු විය හැකි රාජසන්තක කිරීමක් පිළිබඳව වින්දිතයාට දැන ගැනීම පිණිස, එවැනි රාජසන්තක කිරීමක් පිළිබඳ තොරතුරු අඩංගු නොතීසියක් නිකුත් කිරීමට අධිකාරිය නීත්‍යානුකූලව බැඳී සිටී. රාජසන්තක කරන ලද, අපරාධවලින් උපයාගත් දේපළ වලින් වින්දිතයාට දැනටමත් වන්දි ලැබී තිබුණද, සිවිල් නඩු විභාගයක් හරහා වන්දි ඉල්ලා සිටීමට ද වින්දිතයාට අයිතියක් ඇත.

56. ඇමුණුම 01 * 46 වැනි වගන්තිය බලන්න
57. ඇමුණුම 01 * 47, 48 සහ 49 වැනි වගන්ති බලන්න
58. ඇමුණුම 01 * 55 වැනි වගන්තිය බලන්න
59. ඇමුණුම 01 * 7 වැනි වගන්තිය බලන්න

# 5. සමාප්තිය

අපරාධ වලින් උපයාගත් දේපළ පිළිබඳ නීති රාමුව කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලිය ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා සංවිධානයට නව ගතික කාර්ය ක්ෂේත්‍රයක් වූ අතර, මෙම විශ්ලේෂණාත්මක සංක්ෂිප්තය ඉතා වැදගත් සැලකිලිමත්වීම් පිළිබඳව දැන ගැනීමට මෙන්ම 2018 වර්ෂයේ ප්‍රතිපත්ති විචාරණාවල ස්වභාවය සහ අන්තර්ගතය අවබෝධ කර ගැනීමට ද කැමති අයට ප්‍රයෝජනවත් මෙවලමක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

අවම වශයෙන් යම් සිවිල් සමාජ සහභාගීත්වයක් සහිතව මෙම ප්‍රතිපත්තිය කෙටුම්පත් කිරීම ප්‍රතිපත්ති සම්පාදනයේදී සිවිල් සමාජ සංවිධානවල නියැළීම තුළින් රාජ්‍ය ප්‍රතිපත්තිය ශක්තිමත් වන බවට කදිම නිදසුනකි. යෝජනාවල ඇතැම් කරුණු සම්බන්ධයෙන් මතභේද පැවතුන ද, විවිධ කරුණු සහ විකල්ප අදහස් ඉදිරිපත් කර සාකච්ඡා කරන ලද බව එයින් සහතික කරන ලදී. ඇතැම් විට, වත්කම් ආපසු ලබා ගැනීම සඳහා වින්දිතයා කේන්ද්‍ර කරගත් හා විනිවිද පෙනෙන ප්‍රවේශයක් වෙනුවට සාකච්ඡාව නීතිය බලාත්මක කිරීමේ කෝණය දෙසට නැඹුරු වූ විට ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා සංවිධානය මධ්‍යස්ථභාවයෙහි හඬ විය. කෙසේ වෙතත්, මෙම නීතිය මගින් හඳුන්වා දෙනු ලබන සංකල්ප අතරින් සමහරක් සංකල්ප (උදා: දීර්ඝ කළ රාජසන්තක කිරීම, වරදකරු නොකිරීම පදනම් කරගත් වත්කම් ප්‍රතිසාධනය), මානව හිමිකම් ක්ෂේත්‍රයේ කටයුතු කරන වෘත්තීයවේදීන් ද ඇතුළුව, පුළුල් සිවිල් සමාජ සංවිධාන සහ අනෙකුත් පාර්ශවකරුවන් සමඟ සද්භාවයෙන් සාකච්ඡා කිරීමෙන් පසුව නිසි ලෙස සම්පාදනය නොකළ හොත් ඒවා අයථා ලෙස භාවිතා කිරීමේ හැකියාව තවමත් තිබේ. එබැවින්, නීතිය අවභාවිතා කිරීමේ හැකියාව තවදුරටත් අවම කිරීම සඳහා, මෙම නීතියෙහි සැබෑ විධිවිධාන කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියේදී එවැනි සංවිධාන සහ පුද්ගලයින්ගේ අදහස් විමසමින් ඉදිරියට යාමේ වැදගත්කම ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා නැවත අවධාරණය කරයි. එයට අමතරව, මෙම නීතිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියේ පුළුල් ප්‍රතිසංස්කරණ සිදු කිරීම ද ඉතා වැදගත් වනු ඇත.

විනිවිදභාවය, වගවීම සහ වගකීමෙන් යුතු වත්කම් ආපසු ලබා දීමක් සහතික කිරීම පිණිස, මෙම ප්‍රතිපත්තිය මත පදනම්ව කෙටුම්පත් කරනු ලබන අපරාධ වලින් උපයාගත් දේපළ පිළිබඳ නීතියකට අන්තර්ගත කළ යුතු ප්‍රධාන අංග අතරින් කිහිපයක් පහත දැක්වෙන පරිදි විය යුතු බව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා පෙන්වා දෙයි:

- මෙම නීතිය තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ රාමුවට යටත් කිරීම,
- අධිකාරියෙහි සහ අරමුදලේ භාරකාර මණ්ඩලයෙහි සංයුතිය තුළ සිවිල් සමාජ නියෝජනය සහතික කිරීම,
- ආපසු ලබාගත් වත්කම් තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා උපයෝගී කර ගැනීම,
- අරමුදලෙහි ගිණුම් ජාතික විගණන කාර්යාලය විසින් විගණනය කළ යුතු අතර, ඒවා ප්‍රසිද්ධියේ පළකර කර පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබිය යුතුය,
- අරමුදලෙහි කළමනාකරණය හා පරිපාලනය විනිවිදභාවයෙන් යුතු බව සහ මහජනයා විසින් පරීක්ෂා කරනු ලැබීමට විවෘතව වන බව සහතික කිරීම.
- යෝජිත නීතිය බලාත්මක කිරීමේදී සහ අර්ථ නිරූපණය කිරීමේදී අවශ්‍යතාවය, සමානුපාතිකත්වය සහ පොදු යහපත යන මූලධර්ම නියමු මූලධර්ම ලෙස පිළිගනු ලබන බව සහතික කිරීම.

අපරාධ වලින් උපයාගත් දේපළ පිළිබඳ අනාගත පනත් කෙටුම්පතක් බලාත්මක කිරීම සඳහා ඇති දේශපාලන අධිෂ්ඨානය නුදුරු අනාගතයේ දී දිරිමත් නොවනු ඇත. කෙසේ වෙතත්, අපරාධ වලින් උපයාගත් දේපළ පිළිබඳ පනත් කෙටුම්පත ඉදිරියට ගෙන යන්නේ නම්, මෙම සංක්ෂිප්තය මගින් නීති සම්පාදකයින් සහ ප්‍රතිපත්ති සම්පාදකයින් දැනුවත් කරනු ඇතැයි ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා බලාපොරොත්තු වෙයි. ඒ අනුව, නීතිවිරෝධී මූල්‍ය ප්‍රවාහයන්ට එරෙහිව සටන් කිරීමේදී ශ්‍රී ලංකාව සිය අන්තර්ජාතික සහ දේශීය බැඳීම්වලට අනුකූල වන බව මෙයින් සහතික කෙරෙනු ඇත.

# ඇමුණුම 1

## අපරාධ වලින් උපයාගත් දේපළ පිළිබඳ ශ්‍රී ලංකාවේ යෝජිත පනතෙහි ප්‍රතිපත්ති සහ නීති රාමුව

### I වැනි කොටස යෝජිත නීතියෙහි අරමුණඃ

1. යෝජිත නීතියෙහි අරමුණ (ප්‍රතිපත්ති අරමුණ) පහත සඳහන් පරිදි වේ:
අ. අපරාධකරුවන්ට අයථා ලෙස උපයාගත් වත්කම් (අපරාධ වලින් උපයා ගත් දේපළ) අහිමි කිරීම,
ආ. අපරාධවල වින්දිතයින්ට වන්දි ගෙවීම,
ඇ. ත්‍රස්තවාදය සහ මූල්‍ය හා ආර්ථික අපරාධ ඇතුළු සංවිධානාත්මක අපරාධ දුර්වල කිරීම,
ඈ. අපරාධ වලින් උපයාගත් දේපළ ආපසු ලබා ගැනීම සඳහා ආර්ථික වශයෙන් ප්‍රායෝගික ක්‍රමවේදයක් නිර්මාණය කිරීම,
ඉ. රාජ්‍යයෙහි, සමාජයෙහි සහ අපරාධවල වින්දිතයින්ගේ ප්‍රතිලාභය උදෙසා පරිග්‍රහණය කරන ලද හෝ රාජසන්තක කරන ලද වත්කම්වල වටිනාකම ආරක්ෂා කිරීම;
ඊ. අපරාධ වලින් උපයාගත් දේපළ ආපසු ලබා ගැනීමේ ක්‍රමවේදයෙහි වගවීම සහ විනිවිදභාවය සහ ඒ පිළිබඳ ඇති මහජන විශ්වාසය සහතික කිරීම.

2. මෙම නීතිය අනුගත කර ගැනීම මගින් දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය ප්‍රකාරව එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය විසින් ශ්‍රී ලංකාවට අදාළව පවත්වන ලද සම්පූරු සමාලෝචනය මගින් 'සොරකම් කරන ලද වත්කම් ආපසු ලබා ගැනීම් පිළිබඳව ඉදිරිපත් කරන ඇති නිර්දේශ මෙන්ම මුදල් විශුද්ධිකරණය පිළිබඳව වන ආසියා පැසිෆික් කණ්ඩායම විසින් සිදු කරනු ලබන අන්‍යෝන්‍ය ඇගයීමෙහි ප්‍රතිඵලය ද සපුරාලනු ඇත.

### II වැනි කොටසඃ යෝජිත නීතියෙහි විෂය පථය

3. මෙම නීතිය පහත සඳහන් අවස්ථාවන්ට අදාළ වනු ඇතඃ
අ. යම් පුද්ගලයෙක් ශ්‍රී ලංකාව තුළදී කිසියම් වරදක් කළ විට,
ආ. ශ්‍රී ලාංකික පුරවැසියෙක්, ශ්‍රී ලංකාවේ ද්විත්ව පුරවැසියෙක්, ශ්‍රී ලංකාව තුළ පදිංචිව සිටින හෝ හමු වන පුද්ගලයෙක්, ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත කිසියම් වරදක් සිදු කර, එම වරද මගින් ශ්‍රී ලංකාව තුළදී හෝ ඉන් පිටතදී සොයා ගනු ලබන දේපළ (අපරාධ වලින් උපයා ගත් දේපළ) උපයාගෙන ඇති විට,
ඇ. අපරාධ වලින් උපයාගත් දේපළ ශ්‍රී ලංකාව තුළ තිබෙන විට,
ඈ. අපරාධ වලින් උපයාගත් දේපළ ශ්‍රී ලංකාවට රැගෙන විත්, ඉන් පිටතට ගෙන ගොස් හෝ ශ්‍රී ලංකාව හරහා රැගෙන ගොස් ඇති විට,

4. යෝජිත නීතිය මඟින් පහත සඳහන් දෑ සඳහා ඵලදායී හා කඩිනම් කාර්ය පටිපාටියක් සඳහා විධිවිධාන සලසනු ඇතඃ:
අ. ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත පිහිටා තිබෙන්නේද යන්න නොසලකා අපරාධ වලින් උපයා ගත් දේපළ අත්පත් කර ගැනීම, ස්ථානගත කිරීම, තබා තිබීම, සංකලනය කිරීම, භාවිතා කිරීම, පාලනය කිරීම සහ සන්තකයේ තබා ගැනීම විමර්ශනය කිරීම,
ආ. එවැනි වත්කම් හඳුනා ගැනීම, තිබෙන ස්ථානය සොයා ගැනීම සහ අනාවරණය කර ගැනීම,
ඇ. රාජසන්තක කරන ලද / තහනම් කරන ලද, අපරාධ වලින් උපයාගත් දේපළ ද ඇතුළුව එවැනි දේපළ පරිග්‍රහණය කිරීම, අත්හිටුවීම (තහනම් කිරීම), පරිපාලනය / කළමනාකරණය කිරීම, සහ එම දේපළවල මුදල්මය වටිනාකම උපලබ්ධි කිරීම,
ඈ. මෙම නීතිය මගින් පිළිගත් වැරදි විමර්ශනය කිරීම,
ඉ. මෙම නීතිය මගින් පිළිගත් අපරාධ සහ වැරදි වලින් උපයාගත් දේපළවලට අදාළ නීතිමය කටයුතු සංස්ථාපනය කිරීම,
ඊ. අපරාධ වලින් උපයාගත් දේපළ රාජසන්තක කිරීම / තහනම් කිරීම,
උ. අපරාධ වලින් උපයාගත් දේපළ බැහැර කිරීම,
ඌ. අපරාධවල වින්දිතයින්ට හානිපූරණය කිරීම,
එ. සද්භාවයෙන් යුතු තෙවන පාර්ශවයන්ගේ අයිතිවාසිකම් පිළිගැනීම,
ඒ. අපරාධ වලින් උපයාගත් දේපළ සම්බන්ධයෙන් අන්‍යෝන්‍ය නීතිමය සහාය සඳහා විධිවිධාන සැලසීම,
ඔ. පුද්ගලයන්ට සහ විදේශීය රාජ්‍යයන්ට ශ්‍රී ලංකාවේ ස්ථාන ගත කර ඇති අපරාධ වලින් උපයා ගත් දේපළ සෘජුවම

ආපසු ලබා ගැනීමට ඉල්ලා සිටීම සඳහා පවත්නා සිවිල් නීති පිළියම පිළිගැනීම.
ඕ. පාර්ලිමේන්තුවට වාර්ෂිකව වාර්තා කිරීම සහ කාලීන වශයෙන් මහජනව වෙත වාර්තා කිරීම සඳහා විධිවිධාන සැලසීම, සහ
ක. එයට අනුෂංගික වෙනත් කාරණා.

5. එමෙන්ම යෝජිත නීතිය:
අනෙකුත් කරුණු අතර, ස්වාභාවික පුද්ගලයන් සහ සංස්ථාපිත ආයතන සතු හෝ සන්තකයේ ඇති අපරාධවලින් උපයා ගත් දේපළවලට අදාළ වේ;
යෝජිත නීතියෙහි අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යවස්ථාපිත ආයතනයක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලසීම සහ එම ව්‍යවස්ථාපිත අධිකාරිය අපරාධ වලින් උපයාගත් දේපළ ආපසු ලබා ගැනීමේ සහ කළමනාකරණය කිරීමේ ශ්‍රී ලංකා අධිකාරිය (මෙයින් පසු 'අධිකාරියී හඳුන්වනු ලබන) ලෙස නම් කිරීම.

6. දේපළ හිමිකම දැරීම සඳහා නීතියෙන් හිමිකම ඇති / එවැනි දේපළ අයිතිව තිබෙන පුද්ගලයින් සතු දේපළ ඔවුන් අයිතිය / නීත්‍යානුකූල හිමිකම දරන කාල සීමාව තුළදී සාපරාධීත්වයට යටත් වූ විට, අවශ්‍ය විමර්ශන සහ අධිකරණමය විභාග කිරීම් අතරතුරදී එම හිමිකරුවන් / හිමිකම දැරීම සඳහා නීත්‍යානුකූල හිමිකම ඇතැයි කියාපාන පුද්ගලයින් විසින් එකී අයිතිය / නීත්‍යානුකූල හිමිකාරීත්වය සනාථ කළ පසු, එම දේපළ රාජසන්තක කිරීම / අත්හිටුවීම සම්බන්ධයෙන් මෙහි අඩංගු වන ක්‍රමවේදයට යටත් නොවී එම පුද්ගලයින්ට එකී දේපළවල සන්තකය සහ පාලනය කඩිනමින් ආපසු ලබා ගැනීමට හිමිකම තිබිය යුතුය. කෙසේ වෙතත්, එම විමර්ශන සහ අධිකරණ විභාග කිරීම් සඳහා කාලය ගත වන්නේ නම්, අධිකරණ විභාග කිරීමෙන් පසුව, විමර්ශන නිම කෙරෙන තෙක්, එසේ හිමිකම්පාන පුද්ගලයා විසින් එම දේපළට ආරක්ෂාව සපයා දීමේ පදනම මත එම පුද්ගලයාට එකී දේපළෙහි හිමිකාරීත්වය දැරීමට හිමිකම ඇත.

7. යෝජිත නීතියෙහි විධිවිධාන බලාත්මක කිරීමේදී සහ අර්ථ නිරූපණය කිරීමේදී පහත සඳහන් මූලධර්ම මාර්ගෙ ්පදේශ මූලධර්ම ලෙස සලකනු ලැබේ:
අ. අපරාධ යුක්තියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම
ආ. අවශ්‍යතාවය
ඇ. සමානුපාතිකත්වය
ඈ. පොදු යහපත

8. (අ) අදාළ අවස්ථාවලදී, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතෙහි, අල්ලස් පනතෙහි සහ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතෙහි අඩංගු, මුදල් විශුද්ධිකරණය මගින් උපයාගත් දේපළ පරිග්‍රහණය කිරීමට, අත්හිටුවීමට, කළමනාකරණය කිරීමට සහ රාජසන්තක කිරීමට අදාළ විධිවිධාන යෝජිත නීතියෙහි විධිවිධාන මගින් අවලංගු කර ප්‍රතිස්ථාපනය කරනු ලැබේ.
(ආ) රේගු ආඥා පනත, සුරාබදු ආඥා පනත, බැංකු ආඥා පනත සහ දේශීය ආදායම් පනත වැනි වෙනත් යම් නීතියක ඇති එවැනි විධිවිධාන සංශෝධනය කිරීමට හෝ අවලංගු කිරීමට යෝජිත නීතිය මගින් බලපෑමක් නැත.
(ඇ) පොලිස් ආඥා පනත, අපරාධ නඩු විධාන සංග්‍රහ පනත, අල්ලස් පනත, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභා පනත, රේගු ආඥා පනත වැනි වෙනත් නීති මගින් බලතල ලැබී ඇති නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ට අපරාධ වලින් උපයාගත් දේපළ පරිග්‍රහණය කිරීම, අත්හිටුවීම, කළමනාකරණය කිරීම සහ රාජසන්තක කිරීම සඳහා යෝජිත නීතියේ විධිවිධාන භාවිතා කිරීමට අයිතිය තිබිය යුතුය. කෙසේ වෙතත්, යෝජිත නීතියට අනුකූලව අපරාධ වලින් උපයාගත් දේපළ පරිග්‍රහණය කරන්නේ නම්, අපරාධ වලින් උපයාගත් දේපළ කළමනාකරණය සහ එම දේපළ රාජසන්තක කිරීම සම්බන්ධ ඊළඟ පියවරයන්ට මෙම නීතිය බලපානු ඇත.

## III වැනි කොටස: මුදල් විශුද්ධිකරණය පිළිබඳ වරදක්

9. අපරාධ වලින් උපයාගත් දේපළ සන්තකයේ තබා ගැනීම, පාලනය කිරීම, පවරා දීම, ආයෝජනය කිරීම, භාර ගැනීම, තෑගි කිරීම, පිළිවෙල කිරීම, ව්‍යාජය, අර්ථලාභී පාලනයක් හෝ හිමිකාරීත්වයක් දැරීම, සැඟවීම හෝ බැහැර කිරීම, හෝ එකී දේපළ අපරාධවලින් උපයා ගත් දේපළක් වන බව, හෝ එවැනි දේපළක් නියෝජනය කරන බව දැන හෝ එසේ විශ්වාස කිරීමට සාධාරණ හේතු තිබියදී, එම දේපළ වෙනත් ගනුදෙනුවක යෙදවීම වරදක් වේ. මෙම වරද සඳහා මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතෙහි මුදල් විශුද්ධිකරණය කිරීමේ වරදට හිමි දණ්ඩනයට සමාන දණ්ඩණයක් හිමි විය යුතුය.

## IV වන කොටස: වාර්තා කිරීමේ වගකීම

10. අපරාධ වලින් උපයාගත් දේපළ හෝ අපරාධ වලින් උපයාගත් මුදල් වලින් උත්පාදනය කර ගත් දේපළ තිබීම පිළිබඳව මෙහි නිශ්චිතව සඳහන් කර ඇති පුද්ගලයින් දැන සිටින විට එම තොරතුරු අධිකාරියට දැනුම් දීම එකී පුද්ගලයින්ගේ වගකීම වේ. එම වගකීම පැහැර හැරීම වරදක් වේ.

## V වැනි කොටසඃ වරදකරු කිරීමෙන් පසු රාජසන්තක කිරීම / අත්හිටුවීම

11. කිසියම් පුද්ගලයකු සිදු කරන ලද වරදකට එරෙහිව නඩු පවරා වරදකරු කිරීමෙන් අනතුරුව, අපරාධ වලින් උපයාගත් දේපළවල ප්‍රතිලාභය / වටිනාකම රාජසන්තක කිරීම / අත්හිටුවීම සඳහා යෝජිත නීතිය මඟින් විධිවිධාන සලසනු ඇත.

12. යම් පුද්ගලයකු වරදක් කර ඇති බවට වරදකරු වීමෙන් පසුව, අධිකාරිය විසින් අපරාධයට අදාළ වින්දිතයාගේ (කිසිවෙකු වින්දිතයන් වී තිබේ නම් සහ එම වින්දිතයින් සිටින්නේ නම්) සහ අදාළ නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනයේ එකඟත්වය ලබා ගැනීමෙන් අනතුරුව සිදු කරනු ලබන අයැදුමකට අනුව (අපරාධ වලින් උපයාගත් බවට හඳුනාගත් දේපළ හෝ එම දේපළවල වටිනාකම ඉතා සුළු වීම හේතුවෙන් හෝ චූදිතයා සතුව හඳුනාගත හැකි වත්කම් නොමැති විට) අධිකරණය අදාළ දේපළ රාජසන්තක කිරීමේ කටයුතු අත්හැර නොදමන්නේ නම්, එම වරද සිදු කිරීමට අදාළ නඩු විභාගය හා සම්බන්ධ රාජසන්තක කිරීමේ කටයුතු (චූදිතයා වරදකරු කිරීමට අදාළ වූ අපරාධයට සම්බන්ධ අපාරාධ වලින් උපයා ගත් දේපළ සම්බන්ධයෙන්) ආරම්භ කිරීම අනිවාර්යයෙන් සිදු කළ යුතු වේ. රාජසන්තක කිරීම සඳහා වන නියෝගයකට එරෙහිව අභියාචනා කළ හැකි විය යුතුය.

## VI වන කොටසඃ දීර්ඝ කළ රාජසන්තක කිරීම : විස්තාරණය කිරීම

13. යම් වරදක් සම්බන්ධයෙන් පුද්ගලයෙකු වරදකරු කිරීමෙන් පසුව, එසේ වැරදිකරු වන පුද්ගලයා සතු අනෙකුත් දේපළ රාජසන්තක කිරීම සඳහා (පෙර ඡේදයේ සඳහන් කර ඇති පරිදි, එම පුද්ගලයා වරදකරු කරනු ලැබීමට අදාළ අපරාධ වලින් උපයා ගත් දේපළ රාජසන්තක කිරීමට අමතරව) නීතිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන අයැදුමකට අනුව අධිකරණ විභාගයක් පැවැත්වීම සඳහා ද යෝජිත නීතිය මඟින් විධිවිධාන සලසනු ඇත. එවැනි දේපළ නීති විරෝධී ලෙස උපයාගෙන ඇති බවට නීතිපතිවරයා විසින් අධිකරණය සෑහීමකට පත්වන ආකාරයෙන් කරුණු දැක්වීමෙන් පසුව, එම දේපළ චූදිතයා වරදකරු කිරීමට අදාළ වූ වරද සිදු කිරීමට පෙර වසර 7 ක කාලය තුළදී සිදු කරන ලද අපරාධ ක්‍රියා මගින් උපයා ගෙන ඇති බවට අධිකරණය උපකල්පනය කළ යුතුය. දීර්ඝ කල රාජසන්තක කිරීමක් සඳහා එසේ කටයුතු කරනු ලැබීමේදී, වැරදිකරු වූ චූදිතයාට සම්භාව්‍යතා වැඩිබර මත පදනම්ව, අධිකරණය එසේ උපකල්පනය නොකළ යුතු බව සහ, එම නිසා අදාළ දේපළ රාජසන්තක නොකළ යුතු බව පෙන්වා දීමට අයිතිය තිබිය යුතුය. මෙම නියෝගය අභියාචනයකට ද යටත් විය යුතුය.

## VII කොටසඃ රාජසන්තක කිරීමේ කටයුතු වල විෂය පථය

14. අපරාධ නඩු විධාන සංග්‍රහයෙහි 136(1)(අ) වගන්තිය (පුද්ගලික පැමිණිලි) අනුව වුවද රාජසන්තක කිරීමේ කටයුතු සිදු කළ හැක. එවැනි නඩු වලදී, වරදකරු කිරීමෙන් පසු රාජසන්තක කිරීමේ කටයුතු අපරාධ නඩු පැවරූ පැමිණිලිකරු විසින් මෙහෙය විය යුතු වේ.

## VIII කොටසඃ වරදකරු නොකිරීම පදනම් කරගත් රාජසන්තක කිරීමේ කටයුතු

15. යෝජිත නීතිය මගින් අපරාධ වලින් උපයා ගත් දේපළ වරදකරු නොකිරීම පදනම් කරගත් දේපළ රාජසන්තක කිරීම/අත්හිටුවීම (සමහර අවස්ථාවල ලෝකයටම බලපාන පරිදි සිදුකරන රාජසන්තක කිරීම ලෙස ද හැඳින්වේ) පිණිස වන ඵලදායී හා කඩිනම් අධිකරණ ක්‍රියා පටිපාටියක් සඳහා විධිවිධාන සලසනු ලැබේ. අධිකාරිය සහ එහි බලයලත් නියෝජිතායතන (නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් - පොලීසිය, ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකාවේ සුරාබදු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වැනි) විසින් පමණක් එම එම නඩු කටයුතු ආරම්භ කරනු ලැබිය හැකි අතර, එය යම් පුද්ගලයෙකු වරදක් කර තිබීම හේතුවෙන් නඩු පැවරීම හෝ වරදකරු කිරීම මත තත්වාරෝපිත නොවනු ඇත. යම් පුද්ගලයකු වරදක් කර ඇති බවට නඩු පවරනු ලැබ ඇති තත්තවයක් තුළ පවා, චූදිතයා වරදකරු කර නොතිබුණද, අපරාධ වලින් උපයාගෙන ඇතැයි විශ්වාස කරනු ලබන දේපළ හෝ එහි වටිනාකම/ප්‍රතිලාභ රාජසන්තක කිරීම සඳහා වරදකරු නොකිරීම පදනම් කරගත් රාජසන්තක කිරීමේ කටයුතු ආරම්භ කළ හැකි විය යුතුය. රාජසන්තක කිරීම සඳහා එවැනි නියෝගයකට එරෙහිව අභියාචනා කළ හැකි විය යුතුය.

16. නීතිවිරෝධී ලෙස උපයාගෙන ඇතැයි සම්භාව්‍යතා වැඩිබර මත පෙන්විය හැකි යම් දේපලක් හෝ එවැනි යම් දෙපළක අර්ථලාභී බැඳියාවක් 'වරදකරු නොකිරීම පදනම් කරගත් රාජසන්තක කිරීමේ ක්‍රියාවලියකී මගින් රාජසන්තක කිරීමට යටත් කරනු ලැබිය හැකි බව යෝජිත නීතිය මගින් පිළිගනු ලැබේ. (සැකය දුරු කිරීම සඳහා, කිසියම් වරදක් සිදු කිරීම සහ හඳුනාගත් වත්කම අතර කාරණවාචී සම්බන්ධතාවයක් තිබෙන බව ඔප්පු කිරීමට මෙම භාරය මගින් රජයට නියම නොකරන බව පිළිගනු ලැබේ.)

## IX වැනි කොටස: රාජසන්තක කර නොමැති පරිග්‍රහණය කළ දේපළ

17. දේපළ පරිග්‍රහණය කර, ඒ හා සම්බන්ධ අපරාධ පරීක්ෂණ සහ නඩු පැවරීම් (තිබේ නම්) නිම කිරීමෙන් පසු, මෙහි සඳහන් කර ඇති යාන්ත්‍රණ තුනෙන් එකකට (එනම්, වරදකරු කිරීමෙන් පසු රාජසන්තක කිරීම, දීර්ඝ කළ රාජසන්තක කිරීම සහ වරදකරු නොකිරීම පදනම් කර ගත් රාජසන්තක කිරීම) අනුව සාධාරණ කාල පරිච්ඡේදයක් ඇතුළත නඩු කටයුතු ආරම්භ නොකරන්නේ නම්, එම දේපළ රාජසන්තක කිරීම ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා, පරිග්‍රහණය කරන විට එම දේපළවල භාරකාරත්වය තිබූ පුද්ගලයා විසින් සිදු කරනු ලබන අයැදුමකට අනුව, අධිකරණ පරීක්ෂණයෙන් පසුව ලබා දෙන අධිකරණ නියෝගයකට අනුව එම දේපළ එම පුද්ගලයාට හෝ එම දේපළ තමන් වෙත ආපසු ලබා දිය යුතු යැයි අධිකරණය සෑහීමකට පත්වන අයුරින් කරුණු දැක්විය හැකි වෙන යම් පුද්ගලයෙකු සිටියි නම් එම තෙවැනි පාර්ශ්වයට ආපසු ලබා දිය යුතු වේ.

## X වන කොටස: අපරාධ වලින් උපයා ගත් දේපළ තහනම් කිරීම, පරිග්‍රහණය කිරීම, පරිපාලනය සහ කළමනාකරණය, සහ ආරක්ෂා කිරීම

18. යෝජිත නීතිය මගින් අපරාධ වලින් උපයා ගත් දේපළ තහනම් කිරීම, පරිග්‍රහණය කිරීම, පරිපාලනය සහ කළමනාකරණය (රාජසන්තක කිරීම/අහිමි කිරීම සිදු කරන තුරු), සහ ආරක්ෂා කිරීම සඳහා ඵලදායී හා කඩිනම් නීතිය බලාත්මක කිරීමක් සහ අධිකරණ ක්‍රියාපටිපාටීන් සඳහා විධිවිධාන සලසනු ලැබේ.

19. යෝජිත නීතිය මගින් පහත සඳහන් දෑ සඳහා ද විධිවිධාන සලසා ඇත:
අ. අපරාධ වලින් උපයාගත් දේපළ පරිග්‍රහණය කරනු ලැබිය හැකි ආකාරය,
ආ. දේපළ පරිග්‍රහණය කිරීමට බලය ඇති නීතිය ක්‍රියාත්මක කරන පුද්ගලයින්,
ඇ. අධිකරණ ක්‍රියාමාර්ග සිදු කරන තුරු සහ සිදු කරන අතරතුර, පරිග්‍රහණය කළ දේපළ පරිපාලනය / කළමනාකරණය කළ යුතු නිසි කඩිසරකම සහ සද්භාවය ද ඇතුළුව, අපරාධ වලින් උපයා ගත් දේපළ කළමනාකරණය / පරිපාලනය කළ යුතු ආකාරය (බාහිර විශේෂඥයින් යොදා ගැනීම ද ඇතුළුව),
ඈ. අපරාධ වලින් උපයා ගත් ඉක්මනින් නරක් වන ද්‍රව්‍ය වැනි යම් භාණ්ඩ රාජසන්තක කිරීමට පෙර අලෙවි කිරීම / බැහැර කිරීම,
ඉ. රාජසන්තක නොකළ එවැනි දේපළ බැහැර කිරීම, සහ
ඊ. දේපළ රාජසන්තක කර ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස සිදුවූ හෝ ඒ හා සම්බන්ධ වූ අලාභයක් සඳහා වන හිමිකම් පෑම් සම්බන්ධයෙන් තීරණය කළ යුතු ආකාර.

20. යෝජිත නීතියට තෙවන පාර්ශවීය හිමිකම්පාන්නන්ගේ සද්භාවයෙන් යුතු අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ප්‍රමාණවත් ආරක්ෂණ ඇතුළත් වනු ඇත.

## XI වැනි කොටස: රාජසන්තක කළ දේපළ අනුපාතනය කිරීම සහ භාර අරමුදලකට මාරු කිරීම

21. විදේශීය රටවල අධිකරණ / නීතිය ක්‍රියාත්මක කිරීමේ බලධාරීන් විසින් රාජසන්තක කිරීමෙන් / අහිමිකරණය කිරීමෙන් පසුව ශ්‍රී ලංකාවට සම්ප්‍රේෂණය කරනු ලබන අපරාධ වලින් උපයාගත් දේපළ ද ඇතුළුව, වරදකරු කිරීමෙන් පසුව රාජසන්තක කිරීමේ, දීර්ඝ කළ රාජසන්තක කිරීමේ, සහ වරදකරු නොකිරීම් පදනම් කර ගත් රාජසන්තක කිරීමේ කටයුතු වලින් පසුව රාජසන්තක කරනු ලබන අපරාධ වලින් උපයාගත් දේපළ හෝ ඒවායෙහි වටිනාකම, වෙනත් යම් නීතියක මෙයට පටහැනිව කුමක් සඳහන් වුවද, අධිකාරිය විසින් අධිකරණයට අයැදුම් කිරීමෙන් පසුව, අදාළ අපරාධයෙහි වින්දිතයින්ට (රජය ද ඇතුළත්ව) හානිපූරණය කිරීම පිණිස එම අධිකරණය විසින් හිමිකම්පාන්නන්ට (සිටින්නේ නම්) අනුපාතනය කළ යුතු වේ. අත්පත් කරගත් දේපළ පරිපාලනය හා කළමනාකරණය සඳහා අධිකාරිය විසින් දරන ලද සත්‍ය වියදම හෝ දේපළ මගින් ලැබෙන ආදායමෙන් 10% ක් දක්වා වන මුදල යන දෙකෙන් වැඩි වටිනාකමට සමාන මුදලක ප්‍රතිපූරණයක් ලැබීමට අධිකරණයට හිමිකම තිබිය යුතුය. එයින් අනතුරුව, ඉතිරිවී තිබෙන යම් වත්කමක් තිබේ නම, එම වත්කම් අහිමිකරණය කර, පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු සහ පාර්ලිමේන්තුවේ අධීක්ෂණය යටතේ පවතින ස්වාධීන භාරකාර අරමුදලකට ('රාජසන්තක කරන ලද, අපරාධ වලින් උපයාගත් දේපළ සඳහා වන භාරකාර අරමුදල) මාරු කළ යුතුය.

22. ඉහත ඡේදයට අනුව අධිකරණයට සිය හිමිකම්පෑම් ඉදිරිපත් කිරීම සඳහා අපරාධවල වින්දිතයින්ට පහසුකම් සැලසීම පිණිස, අපරාධ වලින් උපයාගත් දේපළ ශ්‍රී ලංකාවේ අධිකරණයක් විසින් රාජසන්තක කිරීමෙන් හෝ, අපරාධ වලින් උපයාගත් දේපළ විදේශීය රටක් විසින් ආපසු එවනු ලැබීමෙන් පසුව, අපරාධයේ වින්දිතයින්ට එම රාජසන්ත කිරීම හෝ අපරාධ මගින් උපයාගත් දේපළ ශ්‍රී ලංකාවට ආපසු එවීම පිළිබඳව දැන ගැනීමට හැකි වන පරිදි සහ ඔවුන්ට අවශ්‍ය නම් සිය හිමිකම් පෑම් අධිකරණයට ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි අධිකාරිය විසින් එම රාජසන්තක කිරීම පිළිබඳව සහ අපරාධ වලින් උපයා ගෙන ඇති බවට හඳුනාගත් දේපළ වලට සහ එම වත්කම් උපයා ගැනීම ප්‍රතිඵල වූ අපරාධය සිදු කිරීම කෙරෙහි එහි තිබිය හැකි කාරණාවාචී සම්බන්ධය පිළිබඳ තොරතුරු ඇතුළත් කළ නොතීසියක් පළ කිරීමට සැලැස්විය යුතුය.

23. අපරාධයක වින්දිතයෙකුට රාජසන්තක කරන ලද අපරාධ වලින් උපයාගත් දේපළ වලින් වන්දි ලැබී තිබීම මගින් අපරාධකාරීත්වයට භාජනය වූ අදාළ දේපළෙහි මුල් අලාභයට අදාළ හානි වන්දි සහ හානිපූරණය ඉල්ලා සිටිමින් සිවිල් නඩු පැවරීමේ අයිතිය වින්දිතයින්ට අහිමි නොවිය යුතුය.

24. භාරය විසින් පහත සඳහන් අරමුණු සඳහා එහි අරමුදල භාවිතා කළ යුතුය:
අ. නීතිය ක්‍රියාත්මක කිරීම, විශේෂයෙන් ම, අපරාධ වලින් උපයාගත් දේපළ ආපසු අයකර ගැනීම සඳහා එය දරන ප්‍රයත්නයන්හිදී නීතිය ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කිරීම,
ආ. යුක්තිය පසිඳලීම ශක්තිමත් කිරීම,
ඇ. අපරාධවලට ගොදුරු වූවන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම,
ඈ. අපරාධ වැළැක්වීමේ ක්‍රියාමාර්ග වැඩිදියුණු කිරීම හා නඩත්තු කිරීම සඳහා,
ඉ. මෙම නීතියෙහි විධිවිධාන බලාත්මක කිරීම හා සම්බන්ධ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ට නීත්‍යානුකූල දිරි දීමනා ලබා දීම,
ඊ. 'දැනුම් දෙන්නන්ගේ පරිත්‍යාග අරමුදලී නමින් අරමුදලක් ශක්තිමත් කිරීම, සහ
උ. තිරසර සංවර්ධන ඉලක්කවල අභිප්‍රායයන් සපුරා ගැනීම.

25. භාරකාර මණ්ඩලය සාමාජිකයින් හත් දෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර, එම සාමාජිකයින් "යුක්තිය පසිඳලීම, නීතිය ක්‍රියාත්මක කිරීම, රාජ්‍ය මූල්‍යය, මූල්‍ය කළමනාකරණය, ව්‍යාපාර කළමනාකරණය, අදාළ සිවිල් සමාජ ක්‍රියාකාරීත්වය සහ විගණනය යන ක්ෂේත්‍රවල විශේෂඥතාවයෙන් හෙබි පුද්ගලයන් විය යුතුය. භාරකාර අරමුදලෙහි සභාපතිවරයා ඇතුළු එහි භාරකරුවන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් පත් කරනු ලැබිය යුතුය.

26. අරමුදලෙහි කළමනාකරණය සහ පරිපාලනය විනිවිදභාවයකින් යුක්ත විය යුතු අතර, මහජනතාව විසින් පරීක්ෂා කරනු ලැබීම සඳහා විවෘත විය යුතුය.

27. එමෙන්ම, භාරකාර අරමුදලෙහි ගිණුම් විගණකාධිපතිවරයා විසින් විගණනය කළ යුතුය. විගණනය කරන ලද ගිණුම් ප්‍රසිද්ධියේ පළ කර, වාර්ෂිකව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය.

## XII වැනි කොටස - අපරාධ වලින් උපයාගත් දේපළ ආපසු ලබා ගැනීම සහ කළමනාකරණය කිරීම සඳහා වන ශ්‍රී ලංකා අධිකාරිය සහ ආයතනික වැඩපිළිවෙල

28. විශේෂයෙන්ම (අ) අපාරාධ වලින් උපයාගත් දේපළ පිළිබඳ විමර්ශන පැවැත්වීම, (ආ) අධිකරණ නියෝගයකින් ලැබුණු බලතල අනුව අපරාධ වලින් උපයා ගත් දේපළ අනාවරණය කර ගැනීම, පරිග්‍රහණය කිරීම, තාවකාලික පරිපාලනය, පවරාදීම සහ (ඇ) බැහැර කිරීම ඇතුළුව යෝජිත නීතියෙහි විධිවිධාන බලාත්මක කිරීම සඳහා එම නීතිය මගින් 'අපරාධ වලින් උපයාගත් දේපළ ආපසු ලබා ගැනීම සහ කළමනාකරණය කිරීම සඳහා වන ශ්‍රී ලංකා අධිකාරිය' නම් වූ ව්‍යවස්ථාපිත ආයතනයක් නිර්මාණය කරනු ලැබේ.

29. එම අධිකාරියට එහි නමින් නඩු පැවරීමට සහ නඩු පවරනු ලැබීමට හිමිකම ඇත්තේය.

30. එම අධිකාරියට (අ) අපරාධ වලින් උපයා ගත් දේපළ සම්බන්ධ නීතිය ක්‍රියාත්මක කිරීමට අදාළ ගැටළු සහ (ආ) අපරාධ වලින් උපයාගත් දේපළ පරිග්‍රහණය කිරීම, පවරා දීම සහ පරිග්‍රහණය කළ දේපළ කළමනාකරණය කිරීම සම්බන්ධීකරණය කිරීමට බලය ඇත්තේය.

31. අපරාධ වලින් උපයාගත් දේපළ හඳුනා ගැනීම, අනාවරණය කර ගැනීම, පරිග්‍රහණය කිරීම සහ විමර්ශනය කිරීම සම්බන්ධයෙන් මෙම අධිකාරියට නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනයකට පැවරෙන බලතලවලට සමාන බලතල පැවරෙන්නේය. එමගින් මෙහි සදහන් කර ඇති අනෙකුත් නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනවලට දැනට පැවරී තිබෙන බලතල සීමා නොකෙරෙයි. එයට අමතරව, මෙම අධිකාරියට පහත සඳහන් කාර්යයන් සඳහා ද බලතල සහ විධිනියෝග ඇත්තේය:
අ. අපරාධ වලින් උපයාගත් දේපළ සම්බන්ධයෙන් විශිෂ්ඨත්වයේ කේන්ද්‍රස්ථානයක් වීම සහ අපරාධ වලින් උපයාගත් දේපළ හඳුනා ගැනීම, අනාවරණය කර ගැනීම, විමර්ශනය කිරීම, පරිග්‍රහණය කිරීම, පරිපාලනය සහ කළමනාකරණය සම්බන්ධ යහ පරිචයන් පවරා දීම,
ආ. අනෙකුත් නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන අතර සම්බන්ධීකරණය කිරීම,
ඇ. අපරාධ වලින් උපයාගත් දේපළ පරිග්‍රහණය, පවරා දීම, කළමනාකරණය කිරීම සහ රාජසන්තක කිරීම / අහිමිකරණය සම්බන්ධ දත්ත සංචිතයක් පවත්වාගෙන යාම,
ඈ. වරදකරු නොකිරීම පදනම් කරගත් රාජසන්තක කිරීමේ කටයුතු ආරම්භ කිරීම සඳහා අධිකරණයේ නීතිමය ක්‍රියාමාර්ග ගැනීම,
ඉ. මෙම නීතියෙහි විධිවිධානවලට අදාළ බලාත්මක කිරීමේ අංග පිළිබඳව පර්යේෂණ පැවැත්වීම
ඊ. අනෙකුත් ව්‍යවස්ථාපිත ආයතන සහ නීතිය ක්‍රියාත්මක කරන ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් වලට හා වෙනත් කටයුතු කිරීමේ වැඩපිළිවෙළ වලට එළඹීම

32. අධිකාරිය විසින් පොදුවේ හෝ සිද්ධියෙන් සිද්ධිය පදනමින් බලය ලබා දී නැත්තේ නම්, යෝජිත නීතියට අනුව, අපරාධ වලින් උපයා ගත් දේපළ රාජසන්තක කිරීම / අහිමි කිරීම සම්බන්ධ අවසන් අධිකරණ නියෝගය ලැබෙන තුරු පරිග්‍රහණය කළ අපරාධ වලින් උපයාගත් දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා නීත්‍යානුකූල බලය පැවරුණු එකම රාජ්‍ය ආයතනය මෙම අධිකාරිය විය යුතුය.

33. වරදකරු නොකිරීම පදනම් කර ගත් රාජසන්තක කිරීමේ කටයුතු ආරම්භ කිරීමට පෙර (හේතු වාර්තා කර ගැනීම සඳහා), අධිකාරිය අපරාධ වලින් උපයා ගත් අදාළ දේපළ පරිග්‍රහණය කිරීමට සැලැස්වූ අදාළ නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනයෙහි අදහස් විමසිය යුතුය.

34. අපරාධ වලින් උපයා ගත් දේපළ හඳුනා ගැනීම, අනාවරණය කර ගැනීම, විමර්ශනය කිරීම සහ පරිග්‍රහණය කිරීම, සහ වත්කම් සම්බන්ධ ප්‍රකාශ ලබා දෙන ලෙස ඉල්ලා නියෝග නිකුත් කිරීම (පැහැදිලි නොකළ වත්කම් උපයාගත් ආකරය හෙළි කරන ලෙස අන කෙරෙන නියෝග) සම්බන්ධයෙන් මෙහි දක්වා ඇති බලතල සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමට පහත සඳහන් නීතිය ක්‍රියාත්මක කිරීමේ රාජ්‍ය ආයතනවලට මෙම නීතිය මගින් බලය ලැබේ:

අ. පොලීසිය (අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සහ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය ද ඇතුළු)
ආ. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
ඇ. රේගු දෙපාර්තමේන්තුව
ඈ. සුරාබදු දෙපාර්තමේන්තුව
ඉ. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
ඊ. වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව
උ. සුරැකුම්පත් සහ විනිමය කොමිසම

35. ඉහත ඡේදයෙහි සඳහන් කරන ලද නීතිය ක්‍රියාත්මක කිරීමේ බලධාරීන්ට (නීතිපතිවරයාගේ සහාය ඇතිව සහ අධිකාරියට දැනුම් දීමෙන් පසුව) තම ආයතනය විසින් පරිග්‍රහණය කරන ලද අපරාධ වලින් උපයාගත් වත්කම් වරදකරු කිරීමෙන් පසු රාජසන්තක කිරීම සහ වරදකරු නොකිරීම පදනම් කර ගත් රාජසන්තක කිරීම සඳහා අධිකරණයට යෝජනා කිරීමට ද (වරදකරු කිරීමෙන් පසුව) හිමිකම ලැබෙනු ඇත. කෙසේ වෙතත්, අන්තර් කාලපරිච්ඡේදය තුළදී, එකී අපරාධ වලින් උපයාගත් දේපළ අධිකාරිය විසින් කළමනාකරණය / පරිපාලනය කළ යුතුය.

36. ආපරාධ වලින් උපයාගත් දේපළ පරිග්‍රහණය කිරීම සඳහා මෙම නීතියට මගින් බලය පැවරී ඇති නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනයක් විසින් එසේ පරිග්‍රහණය කිරීමෙන් පසුව, එම ආයතනය වැඩකරන දින 3 ක් ඇතුළත එම පරිග්‍රහණය කිරීම පිළිබඳව, මධ්‍යම දත්ත සංචිතය ලෙස ක්‍රියාත්මක වන ආයතනය වූ, අධිකාරියට දැනුම් දී එසේ පරිග්‍රහණය කරන ලද අපරාධ වලින් උපයාගත් දේපළ කළමනාකරණය /පරිපාලනය කිරීම ආරම්භ කිරීම සඳහා අධිකාරියට පහසුකම් සැලසිය යුතු වේ. එමෙන්ම අදාළ ආයතනය වැඩකරන දින 7 ක කාලයක් ඇතුළත එම පරිග්‍රහණය කිරීම පිළිබඳව නිසි අධිකරණ පාත්‍රතාවය සහිත අධිකරණයක වාර්තාවක් ගොනු කළ යුතු වේ.

37. නීතිය හිතාමතාම නොසලකා හැරීම මගින්, හෝ ද්වේෂ සහගත ලෙස හෝ සමපාර්ශ්වීය අරමුණක් සඳහා හෝ නොසැලකිලිමත් ලෙස සිදුකරන ඕනෑම ක්‍රියාවක් හෝ අතපසු කිරීමක් සඳහා අධිකාරිය වගකිව යුතු වේ.

38. නීතියට අනුකූලව, අධිකරණ නියෝගයකට අනුව හෝ වෙනත් ආකාරයකින් සද්භාවයෙන් යුතුව සිදු කරනු ලබන මොනයම් හෝ ක්‍රියාවක් සඳහා අධිකාරියේ කිසිදු නිලධාරියෙකු, වෙනත් සේවකයෙකු, අනුශාසකයෙකු හෝ උපදේශකයෙකු වගකිව යුතු නොවේ.

## XIII වැනි කොටසඃ විමර්ශන බලතල

39. අධිකාරියට සහ යෝජිත නීතිය මගින් පිළිගත් අනෙකුත් නීතිය බලාත්මක කිරීමේ බලධාරීන්ට, යෝජිත නීතියට අනුව, පහත සඳහන් බලතල තිබිය යුතුය:
අ. යෝජිත නීතිය ප්‍රකාරව බලයලත් නීතිය ක්‍රියාත්මක කිරීමේ බලධාරියෙකුට මහේස්ත්‍රාත් නියෝගයක් ලබාගෙන පහත සඳහන් බලතල ක්‍රියාත්මක කිරීමට බලය ඇත:
i. යම් පරිශ්‍රයක භාරකරු එම පරිශ්‍රය පරීක්ෂා කිරීම සඳහා කැමැත්ත ලබා නොදෙන්නේ නම්, එම පරිශ්‍රය සෝදිසි කිරීමට,
ii. අධිකරණ නියෝගයෙහි නිශ්චිතව දක්වා ඇති කාල සීමාවක් සඳහා එම දේපළෙහි භාරකරු වෙත සෝදිසි කිරීම පිළිබඳව හෙළි නොකර එම පරිශ්‍රය සෝදිසි කිරීමට,
iii. පෞද්ගලිකත්වයට සහ රහස්‍යභාවයට නිසි ගරුත්වය සහිතව, සජීවී දුරකථන සන්නිවේදනයන් ග්‍රහණය කර ගැනීමට,

iv. පාලිත බෙදාහැරීම් සිදු කිරීමට,
v. ගමන් සීමාවන් පැනවීමට,
vi. පාර්ශව අතර සන්නිවේදනයන් පටිගත කිරීමට,
vii. දේපළ, අරමුදල් හෝ යම් අර්ථලාභයක් පැවරීම තහනම් කිරීමට / වැළැක්වීමට,
viii. බැංකු ගිණුම් අත්හිටුවීමට,
ix. පුද්ගලයන්ගේ පෞද්ගලිකත්වයට අනුබලයක් ඇතිවන අයුරින් සෝදිසි කිරීම් සිදු කිරීම.

ආ. යෝජිත නීතිය ප්‍රකාරව බලයලත් නීතිය ක්‍රියාත්මක කරීමේ නිලධාරීන්ට පහත සඳහන් බලතල සෘජුවම ක්‍රියාත්මක කිරීමට බලය ඇතඃ
i. මෙම නීතිය ප්‍රකාරව වරදක් සිදුකළ බවට සැක කෙරෙන හෝ එයට සම්බන්ධයක් ඇති ඕනෑම පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීමට සැලැස්වීමට,
සස. අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී ඕනෑම පුද්ගලයෙකු සෝදිසි කිරීමට,
iii. ඕනෑම පුද්ගලයෙකුට ඔහු වෙත නිකුත් කරන ලද නිවේදනයක නිශ්චිතව දක්වා ඇති තොරතුරු ඇතුළත් දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට. එම නියමයට අනුකූල නොවීම සහ සාවද්‍ය තොරතුරු සැපයීම වරදක් වේ. මෙම විධිවිධානය ප්‍රකාරව, ව්‍යාජ තොරතුරු අඩංගු දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමේ චෝදනාවක් සනාථ කිරීමේ කාර්යය සඳහා හැර, දිවුරුම් ප්‍රකාශය ලබා දෙන්නාට එරෙහිව පසුව ගනු ලබන අධිකරණ ක්‍රියාමාර්ගවල දී එම දිවුරුම් ප්‍රකාශයේ අන්තර්ගත කරුණු 'සාක්ෂි නොවිය යුතුය.
iv. දේශීය ආදායම් පනතෙහි සහ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතෙහි කුමක් සඳහන්ව තිබුණද, සෑම වර්ගයකම බැංකු වාර්තා, ආදායම් බදු වාර්තා සහ වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉල්ලා සිටීමට,
v. විදුලි සංදේශ වාර්තා කැඳවීමට,
ඩස. ඕනෑම ව්‍යවස්ථාපිත අධිකාරියකින් හෝ වෙනත් වාර්තා තබා ගැනීමේ ආයතනයකින් ඕනෑම වාර්තාවක් ඉල්ලා සිටීමට,
vii. සම්මුඛ සාකච්ඡා කිරීම සඳහා ඕනෑම පුද්ගලයෙකු කැඳවීමට,
viii. ඕනෑම පුද්ගලයෙකු සමග සම්මුඛ සාකච්ඡා කර ප්‍රකාශ වාර්තා කර ගැනීමට,
ix. විමර්ශන කටයුතු සඳහා අවශ්‍ය වෙනත් ඕනෑම දෙයක්,
x. පරිගණක සහ වෙනත් ස්වයංක්‍රීය පද්ධති සඳහා ප්‍රවේශය,
xi. සාමාන්‍ය සෝදිසි කිරීම් සිදු කිරීමට.

40. මෙම පනත යටතේ බලය පැවරුණු කිසිදු නීතිය ක්‍රියාත්මක කිරීමේ නිලධාරියෙකු, (අ) අධිකරණ නියෝග යක් මත කටයුතු කරන්නේ නම් මිස, (ආ) කිසියම් නීතියකට අනුකූලව කටයුතු කරන්නේ නම් මිස, හෝ (ඇ) මෙම නීතියෙහි අරමුණු ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා මිස, කිසියම් විමර්ශනයක් අතරතුරදී එක්රැස් කර ගන්නා හෝ ලැබෙන තොරතුරු කිසිවක් කිසිදු පුද්ගලයෙකුට හෙළි නොකළ යුතුය. මෙම තහනම් කිරීම උල්ලංඝනය කිරීම වරදක් වන්නේය.

## XIV වැනි කොටසඃ පැහැදිලි නොකළ වත්කම් උපයා ගත් ආකාරය හෙළ කරන ලෙස අණ කෙරෙන නියෝගය

41. කිසියම් පුද්ගලයෙක් සන්තකයේ පැහැදිලි කළ නොහැකි යැයි මෙම නීතිය යටතේ බලය පැවරී ඇති නීතිය ක්‍රියාත්මක කිරීමේ නිලධාරියෙකුට පෙනී යන දේපළ තිබෙන බව සොයා ගනු ලැබුවහොත් එම වත්කම් උපයා ගත් ආකාරය පිළිබඳ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරන ලෙස එම පුද්ගලයාට නියම කෙරෙන නියෝගයක් නිකුත් කරනු ලැබීම සඳහා යෝජිත නීතිය මගින් විධිවිධාන සලසනු ලැබේ.
(අ) එම නියෝගයට අනුකූලව කටයුතු නොකිරීමෙහි සහ සාවද්‍ය ප්‍රකාශ නිකුත් කිරීමෙහි ප්‍රතිවිපාක සම්බන්ධයෙන් ද මෙම නීතියෙහි විධිවිධාන සලසා තිබේ.
(ආ) යම් පුද්ගලයෙක් දෙයාකාරයෙන් කවර ආකාරයක හෝ වසර 5 ක හෝ එයට වැඩි ගණනක සිරදඬුවමක් මගින් දඬුවම් කරනු ලැබිය හැකි වරදක් (බරපතල සාපරාධී වැරදි) කර ඇති බවට හෝ එවැනි වරදක් කිරීමේ අපේක්ෂාවෙන් සිට ඇති බවට, හෝ අපරාධ මගින් උපයා ගත් දේපළ ගනුදෙනු කර ඇති බවට සාධාරණ හේතු පවතින විට, ඔහුගේ වත්කම් පිළිබඳව දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරන ලෙස (නිශ්චිතව දක්වා ඇති ආකෘතියට අනුව) ඔහුට නියම කිරීමට යෝජිත නීතිය මගින් අධිකාරියට බලය පවරනු ලැබේ.
(ඇ) ඕනෑම පුද්ගලයෙකුට තමා සතු වත්කම් අත්පත් කර ගත් ආකාරය පිළිබඳ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරන ලෙස දැනුම් දීමක් කිරීමට ද යෝජිත නීතිය මගින් අධිකාරියට බලය ලැබේ
(ඈ) ඇතැම් වත්කම් අත්පත් කර ගත් ආකාරය හෝ ගනුදෙනු සිදු කළ ආකාරය පිළිබඳ සාක්ෂි සපයන ලෙස අධිකාරිය විසින් වගඋත්තරකරුට නියම කරනු ලැබිය හැකිය.

42., පෙර ඡේදය අනුව ඉදිරිපත් කළ දිවුරුම් ප්‍රකාශයක අඩංගු කරුණු සාවද්‍ය බව හෝ එහි අඩංගු කරුණු අසත්‍ය හෝ අසම්භාව්‍ය බවට හේතු සහිතව අධිකාරිය විසින් හෝ මෙම නීතිය යටතේ බලය පැවරුණු නීතිය ක්‍රියාත්මක

කිරීමේ නිලධාරීන් විසින් සොයා ගනු ලැබුව හොත්, අධිකාරිය හෝ මෙම නීතිය අනුව බලය පැවරී ඇති කිසිදු නීතිය ක්‍රියාත්මක කිරීමේ නිලධාරියෙක් එම දිවුරුම් ප්‍රකාශය සත්‍ය බව පිළිගැනීමට බැඳී නොසිටිය යුතුය.

43. එවැනි ප්‍රකාශයක අඩංගු තොරතුරු පහත සඳහන් අරමුණු සඳහා භාවිතා කළ හැකිය:
අ. බරපතල අපරාධ සිදු කර තිබිය හැකි බවට අපරාධ පරීක්ෂණ පැවැත්වීමේදී 'විමර්ශන ද්‍රව්‍ය' ලෙස,
ආ. වරදකරු නොකිරීම පදනම් කරගත් රාජසන්තක කිරීමේ කටයුතු ආරම්භ කිරීමට හැකි පදනමක් ලෙස, හෝ
ඇ. ව්‍යාජ තොරතුරු අඩංගු දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමේ චෝදනාවක් ඔප්පු කිරීමේ කාර්යය සඳහා හැර, එවැනි දිවුරුම් ප්‍රකාශයක අන්තර්ගතය දිවුරුම් ප්‍රකාශය ඉදිරිපත් කළ තැනැත්තාට එරෙහිව පසුව ගනු ලබන අධිකරණ ක්‍රියාමාර්ගවල 'සාක්ෂි' නොවිය යුතු ය.

## XV වැනි කොටස: නීතිමය වෘත්තීය වරප්‍රසාදය

43. සැක දුරු කිරීම සඳහා, නීතිඥයෙකු සමඟ සන්නිවේදනය කරන පුද්ගලයෙක්, සාපරාධී ක්‍රියාවක් ඉදිරියට ගෙන යාම සඳහා එවැනි සන්නිවේදනයක් සිදු කරන්නේ නම්, වෘත්තීය වරප්‍රසාදය සඳහා හිමිකම් පෑමට නොහැක්කේ ය යන පොදු නීති ස්ථාවරය මෙම යෝජිත නීතිය මගින් ඉස්මතු කර පෙන්වයි.

## XVI වැනි කොටස: කාර්යයන් පැවරීම සඳහා අධිකාරිය සතු බලය

45. නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන වලට අධිකාරිය විසින් පවරා දෙනු ලබන කර්තව්‍යයන් අධිකාරියෙහි මගපෙන්වීම සහ අධීක්ෂණය යටතේ ඉටු කිරීමට හැකි වන පරිදි, අධිකාරියෙහි ඇතැම් කර්තව්‍යයන් පොදුවේ හෝ සිද්ධියෙන් සිද්ධිය පදනමෙන් පහත සඳහන් ආයතන ද ඇතුළු නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනවලට පවරා දීමටත්, හේතු වාර්තා කරමින් එම පවරාදීම් ඉවත් කිරීමටත් අධිකාරියට බලය ලැබෙනු ඇත.
අ.පොලිසිය (අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සහ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය ඇතුළුව)
ආ.අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
ඇ.ශ්‍රී ලංකා රේගුව
ඈ.ඩසුරාබදු දෙපාර්තමේන්තුව
ඉ. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
ඊ. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
උ. සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

ඒකාබද්ධ විමර්ශන කණ්ඩායම්

46. අධිකාරිය වෙනුවෙන් කටයුතු කිරීම පිණිස අධිකාරියට නම් කරන ලද විදේශීය නීති ක්‍රියාත්මක කරන ආයතන සහ අධිකාරිය විසින් පත් කරනු ලබන විශේෂඥයින් ඇතුළත් ඒකාබද්ධ විමර්ශන කණ්ඩායම් පිහිටුවීමට බලය ලැබේ.

## XVII කොටස: අධිකාරිය සහ අන්තර්ජාතික සහයෝගීතාවය සහ වත්කම් ආපසු ලබා ගැනීම

47. 'රාජසන්තක කරන ලද අපරාධ වලින් උපයාගත් දේපළ සඳහා වන භාරකාර අරමුදලෙහි' එකඟත්වය ඇතිව අධිකාරියට අපරාධ වලින් උපයාගත් දේපළ හෝ ඒවායෙහි වටිනාකම පවරා දීම / හුවමාරු කර ගැනීම සඳහා විදේශීය රාජ්‍යයන් සහ අධිකාරියට සමාන විදේශීය ආයතන සමඟ ගිවිසුම්වලට එළඹීමට බලය ලැබේ.

48. ශ්‍රී ලංකාව තුළ සිදු කරන ලද අපරාධ වලට අදාළව වෙනත් රටවල පිහිටා ඇති අපරාධ වලින් උපයාගත් දේපළ පරිග්‍රහණය කරන ලෙස, රාජසන්තක කරන ලෙස සහ ආපසු ලබා දෙන ලෙස ඉල්ලා විදේශීය අධිකරණ හා නීතිය ක්‍රියාත්මක කිරීමේ බලධාරීන්ට අයැදුම් කිරීමට අධිකාරියට බලය ලැබේ. අධිකාරියට සිය විෂය පථයට අයත් යම් විමර්ශනයක් සම්බන්ධයෙන් වෙනත් අධිකරණ බල ප්‍රදේශයක පිහිටි ඕනෑම ද්‍රව්‍යකට ප්‍රවේශ වීමට සහ ඕනෑම ද්‍රව්‍යයක් ලබා ගැනීමට බලය තිබේ.

49. විදේශීය රටවලදී (ශ්‍රී ලංකාව අන්‍යෝන්‍ය හෝ බහුපාර්ශ්වික ගිවිසුම්වලට එළඹ ඇති රටවලදී) සිදු කරන ලද අපරාධවලට අදාළ දේපළ ශ්‍රී ලංකාව තුළ පිහිටා තිබෙන විට එම දේපළ පරිග්‍රහණය කරන ලෙස, රාජසන්තක කරන ලෙස සහ එම රටවලට ආපසු ලබා දෙන ලෙස ඉල්ලා හෝ වරදකරු නොකිරීම පදනම් කර ගත් දේපළ අත්හිටුවීම් සඳහා එම රටවලින් ලැබෙන ඉල්ලීම් භාර ගැනීමට ද අධිකාරියට බලය ලැබේ.

## XVIII කොටසඃ අධිකාරියෙහි සංයුතිය

50. අධිකාරියෙහි සභාපතිවරයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් පත් කරනු ලැබිය යුතුය. සභාපතිවරයා වසර 5 ක කාලයක් සිය ධූරය හෙබවිය යුතුය.

51. අධිකාරියට කළමනාකරණ මණ්ඩලයක් තිබිය යුතුය. එය අධිකාරියෙහි ප්‍රධානතම තීරණ ගැනීමේ මණ්ඩලය විය යුතුය. කළමනාකරණ මණ්ඩලය පහත සඳහන් පුද්ගලයින්ගෙන් සමන්විත විය යුතුයඃ
අ. නීතිපතිවරයා හෝ ඔහු විසින් නම් කරන ලද තැනැත්තා
ආ. පොලිස්පතිවරයා හෝ ඔහු විසින් නම් කරන ලද තැනැත්තා
ඇ. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහු විසින් නම් කරන ලද තැනැත්තා
ඈ. අදාළ ආයතන ප්‍රධානියා විසින් නම් කරනු ලැබ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් පහත සඳහන් එක් එක් ආයතන වලින් පත් කරනු ලබන ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු බැගින්ඃ
i. ශ්‍රී ලංකා රේගුව
ii. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
iii. සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව
iv. ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය
v. අධිකරණ අමාත්‍යංශය
vi. මුදල් අමාත්‍යංශය
vii. විදේශ කටයුතු අමාත්‍යංශය

52. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් සභාපතිවරයාට අමතරව පහත ක්ෂේත්‍රවල විශේෂඥභාවය සහිත පුද්ගලයින් හතර දෙනෙකු ද පත් කළ යුතුයඃ
අ. අපරාධ යුක්තිය,
ආ. අපරාධ වලින් උපයාගත් දේපළ පරිපාලනය සහ කළමනාකරණය,
ඇ. ආර්ථික විද්‍යාව, මුදල් සහ විගණනය, සහ
ඈ. අදාළ සිවිල් සමාජ ක්‍රියාකාරීත්වය.

53. අධිකාරියට ප්‍රධාන විධායක නිලධාරියෙකු සිටිය යුතු අතර ඔහු කළමනාකරණ මණ්ඩලය විසින් පත් කරනු ලැබිය යුතුය.

54. මෙම පනතෙහි විධිවිධාන බලාත්මක කිරීම පිණිස අධිකාරියට බලයලත් නිලධාරීන් සිටිය යුතු අතර ඔවුන්ට පොලිස් බලතල තිබිය යුතුය.

55. අධිකාරියේ මුදල් විගණකාධිපති විසින් විගණනය කළ යුතුය.

## XIX කොටසඃ දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම

56. යෝජිත නීතිය මගින්, අනෙකුත් කරුණු අතර, දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියෙහි අඩංගු ප්‍රතිමානයන්ට එම සම්මුතියෙහි ඒ වැනි පරිච්ඡේදයට අනුව ව්‍යවස්ථාපිත බලය ලබා දිය යුතුය.

## XX වැනි කොටසඃ අර්ථ නිරූපණය

57. අපරාධ වලින් උපයාගත් දේපළ - 'අපරාධ වලින් උපයාගත් දේපළී යන්නෙන් ශ්‍රී ලංකාව තුළදී හෝ වෙනත් ස්ථානයක දී කිසියම් පුද්ගලයෙකු විසින් සිදුකරන ලද යම් වැරදි ක්‍රියාවකට සම්බන්ධව හෝ යම් වැරදි ක්‍රියාවක ප්‍රතිඵලයක් ලෙස හෝ, ඍජුවම හෝ වක්‍රාකාරයෙන් හෝ, උපයා ගන්නා කිසියම් දේපළක් හෝ දේපළක කොටසක් හෝ, ආදායමක්, සේවාවක්, වාසියක්, ප්‍රතිලාභයක් හෝ, සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ ඉපදවුණු, ලැබුණු, රඳවා ගත්, ඒකාබද්ධ වූ වෙනත් ආර්ථික ලාභයක් අදහස් වන අතර එයට අපරාධවල උපකරණත්ව සහ ඒවායෙහි වටිනාකම ද ඇතුළත් වනු ඇත යන්න අදහස් කෙරෙයි. 'අපරාධයී යන යෙදුම 'වරදී යන යෙදුමට සමාන අර්ථය ඇතිව යොදනු ලබන අතර, වසර දෙකක හෝ එයට වැඩි ගණනක සිරදඬුවමක් ලැබිය හැකි, ශ්‍රී ලංකාවේ නීතිය විසින් පිළිගෙන ඇති සියලු වැරදි වලට සහ ශ්‍රී ලංකාවේ නීතිය විසින් පිළිගන්නා ලද වරදක් සංස්ථාපනය කරන ශ්‍රී ලංකාවෙන් පිටතදී සිදු කරන ලද වරදකට අදාළ වනු ඇත. 'වරද යන යෙදුමට දණ්ඩ නීති සංග්‍රහයෙහි දක්වා ඇති එම අර්ථයම තිබිය යුතුය.

# ඇමුණුම 2

## දූෂණ නඩු වලදී රාජසන්තක කරන ලද සොරකම් කළ වත්කම් බැහැර කිරීම හා පවරා දීම සඳහා වන වත්කම් ආපසු ලබා ගැනීම පිළිබඳ ගෝලීය සංසදයෙහි ප්‍රතිපත්ති

වත්කම් ආපසු ලබා ගැනීම පිළිබඳ ගෝලීය සංසදයෙහි සම සත්කාරක රටවල් සහ ඉලක්කගත රටවල් හතර දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියෙහි සඳහන් කර ඇති පරිදි රාජසනක්තක කරන ලද සොරකම් කළ වත්කම් ආපසු ලබා දීම සහ බැහැර දීම සඳහා තම රටවල ඇති කැපවීම යළි තහවුරු කළේය. සාර්ථක වත්කම් අයකර ගැනීමක් සහ බැහැර කිරීමක් සහතික කිරීම සඳහා තාක්ෂණික සහාය ලබා දීමේ වැදගත්කම ඔවුහු අවධාරණය කළහ. වත්කම් ආපසු ලබා දීම පිළිබඳ පෙර අවස්ථාවලින් ඔවුන් ලබා ගත් අත්දැකීම් ද, ගම්‍යමාන වෙමින් පවතින පාඩම් පිළිබඳව ද ඔවුන් තවදුරටත් මෙනෙහි කළහ. මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලයෙහි අනුග්‍රහය යටතේ දැනට සිදු කෙරෙමින් පවතින කාර්යයන් පිළිබඳව සහ වත්කම් ආපසු ලබා දීම පිළිබඳව යහපත් පරිචයන් සකස් කිරීම සඳහා අඩිස් අබබා ක්‍රියාකාරී න්‍යාය පත්‍රය මගින් අන්තර්ජාතික ප්‍රජාව වෙත කරන ලද ආමන්ත්‍රණය පිළිබඳ දැනුවත් භාවයෙන් යුක්තව, වත්කම් ආපසු ලබා ගැනීම පිළිබඳ ගෝලීය සංසදයට සහභාගිවූවන් සාර්ථක වත්කම් ආපසු ලබා දීමක් ප්‍රවර්ධනය කෙරෙන ප්‍රතිපත්ති සඳහා සැලකිල්ලට ගත යුතු පහත සඳහන් කරුණු ඉදිරිපත් කළහ. මෙම ප්‍රතිපත්ති මගින් සම්බන්ධීකරණය හා සහයෝගීතාව වැඩි දියුණු කිරීම සඳහා සහ එයට සම්බන්ධ ක්‍රියාවලීන්හි විනිවිදභාවය සහ වගවීම ශක්තිමත් කිරීම සඳහා වන ප්‍රවේශයන්ට සහ යාන්ත්‍රණයන්ට ආමන්ත්‍රණය කරනු ලැබේ. මෙම ප්‍රතිපත්තිවල අඩංගු කිසිවක් මගින් ජාතික ස්වෛරීභාවය හෝ දේශීය නීතියෙහි මූලධර්ම කිසිවක් උල්ලංඝනය කිරීමට අදහස් නොකෙරෙයි.

දූෂණ සිද්ධීන් සම්බන්ධ නඩුවලදී රාජසන්තක කරන ලද සොරකම් කළ වත්කම් බැහැර කිරීම හා පවරා දීම සඳහා වන වත්කම් ආපසු ලබා ගැනීම පිළිබඳ ගෝලීය සංසදයෙහි ප්‍රතිපත්ති:

**1 වැනි ප්‍රතිපත්තිය:** හවුල්කාරිත්වය. සොරකම් කළ වත්කම් සාර්ථකව ආපසු ලබා දීම මූලික වශයෙන් ම එම වත්කම් පවරා දෙන සහ ලබා ගන්නා රටවල් අතර ශක්තිමත් හවුල්කාරිත්වයක් පැවතීම මත පදනම්වන බව පිළිගනු ලැබේ. එවැනි හවුල්කාරිත්වයක් මගින් විශ්වාසය සහ පැහැදීම වැඩිදියුණු කරයි.

**2 වැනි ප්‍රතිපත්තිය:** අන්‍යෝන්‍ය ලැදියාවන්. පවරා දෙන සහ ලබා ගන්නා යන රටවල් දෙකටම සාර්ථක ප්‍රතිඵලයක් පිළිබඳ පොදු ලැදියාවන් තිබෙන බව පිළිගනු ලැබේ. එබැවින්, අන්‍යෝන්‍ය එකඟතාවයකින් යුතුව පවරාදීම් සිදු කිරීම සඳහා වන වැඩපිළිවෙළ ස්ථාපිත කිරීමට රටවල් එකට එක්ව කටයුතු කළ යුතුය.

**3 වැනි ප්‍රතිපත්තිය:** මුලින් සංවාද කිරීම. ක්‍රියාවලියෙහි හැකි මුල්ම අවස්ථාවේදී ම පවරා දෙන සහ ලබා ගන්නා රටවල් අතර සංවාදය ආරම්භ කිරීම සහ ක්‍රියාවලිය පුරාම අඛණ්ඩ සංවාදයක් පැවතීම දැඩි ලෙස අවශ්‍ය වේ.

**4 වැනි ප්‍රතිපත්තිය:** විනිවිදභාවය හා වගවීම: ආපසු ලබා ගන්නා ලද වත්කම් ආපසු ලබා දීමේදී සහ බැහැර කිරීමේදී එම වත්කම් පවරා දෙන සහ ලබා ගන්නා රටවල් විසින් විනිවිදභාවය සහ වගවීම සහතික කරනු ඇත. ආපසු ලබා දුන් වත්කම් පවරාදීම සහ පරිපාලනය පිළිබඳ තොරතුරු ප්‍රසිද්ධ කළ යුතු අතර එම තොරතුරු වත්කම් පවරා දෙන සහ ලබා ගන්නා රටවල ජනතාවට ලබා ගත හැකි වන පරිදි තිබිය යුතුය. නිශ්චිතව සඳහන් කර නැති හෝ අසම්භාව්‍ය ගාස්තු වැඩපිළිවෙල භාවිත කිරීම අධෛර්යමත් කළ යුතුය.

**5 වැනි ප්‍රතිපත්තිය:** ප්‍රතිලාභීන්. හැකි සෑම අවස්ථාවකදීම, හඳුනාගත් වින්දිතයින්ට අගතියක් නොවන පරිදි, දූෂිත නිලධාරීන්ගෙන් ආපසු ලබා ගන්නා ලද සොරකම් කළ වත්කම් අදාළ දූෂිත ක්‍රියාව හේතුවෙන් හානියට පත් ජාතීන්හි ජනතාවගේ ප්‍රතිලාභය පිණිස විය යුතුය.

**6 වැනි ප්‍රතිපත්තිය:** දූෂණයට එරෙහි සටන සහ සංවර්ධනය ශක්තිමක් කිරීම. හැකි සෑම අවස්ථාවකදීම, රාජසන්තක කරන ලද දේපළ අවසාන වශයෙන් භාවිතා කිරීමේදී, දූෂණයට එරෙහිව සටන් කිරීම, දූෂණය හේතුවෙන් සිදු වූ හානිය අළුත්වැඩියා කිරීම සහ සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම යන දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියෙහි මූලධර්ම සාක්ෂාත් කර ගැනීම දිරිමත් කෙරෙන ක්‍රියාකාරකම් පිළිබඳව ද සැලකිල්ල යොමු කළ යුතු වේ.

**7 වැනි ප්‍රතිපත්තිය:** සිද්ධි විශේෂිත සැලකිල්ල. රාජසන්තක කරන ලද අපරාධ වලින් උපයාගත් දේපළ බැහැර කිරීම සිද්ධි විශේෂිත ආකාරයකින් සලකා බැලිය යුතුය.

**8 වැනි ප්‍රතිපත්තිය:** දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියෙහි 57(5) වගන්තිය අනුව ගිවිසුමක් භාවිතා කිරීම සලකා බැලීම. පවරා දෙන සහ ලබා ගන්නා යන රාජ්‍යයන් දෙකම එකඟත්වයට එළඹෙන අවස්ථාවලදී, ආපසු ලබා දෙන ලද වත්කම් විනිවිදභාවයෙන් යුතුව සහ ඵලදායී ලෙස භාවිත කිරීම, පරිපාලනය සහ අධීක්ෂණය සහතික කිරීමට උපකාරී වන සිද්ධි විශේෂිත ගිවිසුම් හෝ වැඩපිළිවෙල නියම කර ගත යුතුය. හැකි සෑම අවස්ථාවකදීම, පවරා දීමේ යාන්ත්‍රණය (යාන්ත්‍රණ) සඳහා පවත්නා දේශපාලන හා ආයතනික රාමු භාවිතා කළ යුතු අතර, ගැළපීම සහතික කිරීම, ද්විකරණය වැළැක්වීම සහ කාර්යක්ෂමතාවය ප්‍රශස්ත කිරීම පිණිස එය රටෙහි සංවර්ධන උපාය මාර්ගයට අනුකූල විය යුතුය.

**9 වැනි ප්‍රතිපත්තිය:** වරදකරුවන්ට ප්‍රතිලාභ ලැබීම අවහිර කිරීම. රාජසන්තක කරන ලද අපරාධවලින් උපයාගත් දේපළ බැහැර කිරීමේදී, වරද/වැරදි ක්‍රියාවලට සම්බන්ධ පුද්ගලයින්ට ප්‍රතිලාභයක් නොලැබෙන බව සහතික කිරීම සඳහා අවශ්‍ය සඳහා සියලු පියවර ගත යුතුය.

**10 වැනි ප්‍රතිපත්තිය:** රාජ්‍ය නොවන පාර්ශ්වකරුවන් ඇතුළත් කිරීම. නීතියට අනුව යෝග්‍ය සහ අවසර තිබෙන තාක් දුරට, සිවිල් සමාජය, රාජ්‍ය නොවන සංවිධාන සහ ප්‍රජා මූල සංවිධාන වැනි රාජ්‍ය අංශයෙන් පරිබාහිර පුද්ගලයින් සහ කණ්ඩායම් හානියට පිළියම් යෙදිය හැකි ආකාර හඳුනා ගැනීමට උපකාර කිරීම, වත්කම් ආපසු ලබා දීම සහ බැහැර කිරීම පිළිබඳ තීරණ වලට දායක වීම, සහ ආපසු ලබා ගත් වත්කම් පැවරීමේදී, බැහැර කිරීමේදී සහ පරිපාලනය කිරීමේදී විනිවිදභාවය සහ වගවීම වැඩිදියුණු කිරීම මගින් ද ඇතුළුව වත්කම් ආපසු ලබා දීමේ ක්‍රියාවලියට සහභාගී වීම සඳහා දිරිමත් කළ යුතුය.
වොෂිංටන්, ඩී.සී. 2017 දෙසැම්බර් 1, සංවර්ධනය සඳහා මූල්‍යකරණය සමුළුව, 2015 ජූලි, 25 වැනි ඡේදය

# ඇමුණුම 3

## දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියෙහි වත්කම් ආපසු ලබා ගැනීම පිළිබඳ පරිච්ඡේදය

### 5 වැනි පරිච්ඡේදය

### 51 වැනි වගන්තිය. පොදු විධිවිධානය

මෙම පරිච්ඡේදයට අනුකූලව වත්කම් ආපසු ලබා දීම මෙම සම්මුතියෙහි මූලික ප්‍රතිපත්තියක් වන අතර, මේ සම්බන්ධයෙන් රාජ්‍ය පාර්ශවයන් එකිනෙකාට සහයෝගීත්වය සහ සහාය ලබා දීමේ පුළුල්ම ක්‍රියාමාර්ග සැලසිය යුතු වේ.

### 52 වැනි වගන්තිය. අපරාධ වලින් උපයාගත් දේපළ පවරා දීම වැළැක්වීම සහ අනාවරණය කර ගැනීම

1. මෙම ප්‍රඥප්තියෙහි 14 වැනි වගන්තියට අගතියක් නොවන පරිදි, සෑම රාජ්‍ය පාර්ශ්වයක්ම ස්වකීය දේශීය නීතියට අනුව, ස්වකීය අධිකරණ බලය යටතේ තිබෙන මූල්‍ය ආයතනවලට සිය ගණුදෙනුකරුවන්ගේ අනන්‍යතාවය තහවුරු කර ගන්නා ලෙස නියම කිරීමටත්, ඉහළ වටිනාකම් ගිණුම්වල තැන්පත් කරනු ලබන අරමුදල්වල අර්ථලාභී හිමිකරුවන්ගේ අනන්‍යතාවය තීරණය කිරීම සඳහා අවශ්‍ය සාධාරණ පියවර ගැනීමටත්, ප්‍රමුඛතම පොදු කර්තව්‍යයන් පවරා ඇති හෝ පවරා තිබූ පුද්ගලයින්, ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සහ සමීපතමයින් විසින් හෝ ඔවුන් වෙනුවෙන් ඉල්ලා සිටිනු ලබන හෝ නඩත්තු කරනු ලබන ගිණුම් පිළිබඳ දැඩි කළ නිරීක්ෂණ සිදු කිරීමටත් අවශ්‍ය පරිදි පියවර ගත යුතුය. එසේ දැඩි කළ නිරීක්ෂණ නිසි බලධාරීන්ට වාර්තා කිරීමේ කාර්යය සඳහා සැක සහිත ගනුදෙනු අනාවරණය කර ගැනීම පිණිස සෑහෙන පරිදි සැලසුම් කර තිබිය යුතු අතර, එය මූල්‍ය ආයතන විසින් යම් නීත්‍යානුකූල ගනුදෙනුකරුවෙකු සමග ව්‍යාපාර කටයුතු සිදු කිරීම අධෛර්යමත් කිරීම සඳහා හෝ තහනම් කිරීම සඳහා සිදු කරනු ලබන ක්‍රියාවක් ලෙස වටහා නොගත යුතුය.

2. මෙම වගන්තියෙහි 1 වැනි ඡේදයෙන් විධිවිධාන සලසා ඇති ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම පිණිස, සෑම රාජ්‍ය පාර්ශ්වයක් ම ස්වකීය දේශීය නීතියට අනුව සහ මුදල් විශුද්ධිකරණයට එරෙහි කලාපීය, අන්තර් කලාපීය සහ බහුපාර්ශ්වීය සංවිධානවල අදාළ වැඩසටහන්වලින් පෙළඹවීම් ලැබ පහත සඳහන් ක්‍රියාමාර්ග ගත යුතුය:
(අ). ස්වකීය අධිකරණ බලතල තුළ තිබෙන මූල්‍ය ආයතන විසින් දැඩි කළ නිරීක්ෂණයක් යෙදිය යුතු යැයි අපේක්ෂා කරනු ලබන්නේ කවර වර්ගවල ස්වභාවික හෝ නෛතික පුද්ලයින්ගේ ගිණුම් සම්බන්ධයෙන්ද, විශේෂ අවධානය යොමු කළ යුත්තේ කවර වර්ගවල ගිණුම් සහ ගණුදෙනු සම්බන්ධයෙන්ද සහ එවැනි ගිණුම් සම්බන්ධයෙන් ගත යුතු නිසි ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ සහ වාර්තා තබා ගැනීමේ ක්‍රියාමාර්ග මොනවාද යන්න සම්බන්ධයෙන් උපදෙස් නිකුත් කළ යුතුය; සහ
(ආ) යෝග්‍ය අවස්ථාවලදී, වෙනත් රාජ්‍ය පාර්ශ්වයක ඉල්ලීම මත හෝ ස්වකීය සැලැස්මකට අනුව, ස්වකීය අධිකරණ බලතල යටතේ තිබෙන මූල්‍ය ආයතන විසින් අන්‍යාකාරයෙන් හඳුනා ගනු ලබන දැඩි කළ නිරීක්ෂණයක් යෙදි යුතු ගිණුම් හිමි ස්වභාවික හෝ නෛතික පුද්ගලයින්ට අමතරව, එම මූල්‍ය ආයතන විසින් එවැනි නිරීක්ෂණයක් සිදු කළ යුතු ගිණුම් හිමි විශේෂ ස්වභාවික හෝ නෛතික පුද්ගලයින්ගේ අනන්‍යතාවය එම මූල්‍ය ආයතනවලට දැනුම් දිය යුතුය.

3. මෙම වගන්තියෙහි 2(අ) ඡේදයෙහි සංදර්භය තුළ, සෑම රාජ්‍ය පාර්ශ්වයක්ම ස්වකීය මූල්‍ය ආයතන විසින් නිසි කාල පරිච්ඡේදයක් පුරා මෙම වගන්තියෙහි 1 වැනි ඡේදයෙහි සඳහන් කර ඇති පුද්ගලයින්ගේ ගිණුම් සහ ඔවුන් සම්බන්ධ ගනුදෙනු පිළිබඳව, අවම වශයෙන් ගනුදෙනුකරුගේ සහ, හැකි තාක් දුරට, අර්ථලාභී හිමිකරුගේ අනන්‍යතාවයට අදාළ තොරතුරු අඩංගු වන, ප්‍රමාණවත් වාර්තා පවත්වාගෙන යනු ලබන බවට සහතික කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග යෙදිය යුතු වේ.

4. මෙම ප්‍රඥප්තියට අනුව පනවා ඇති වැරදි ක්‍රියා මගින් උපයා ගනු ලබන දේපළ පවරා දීම වැළැක්වීමේ සහ අනාවරණය කර ගැනීමේ අරමුණ ඇතිව, සෑම රාජ්‍ය පාර්ශ්වයක්ම භෞතික පැවැත්මක් නොමැති සහ නියාමනයට

ලක් වන මූල්‍ය සමූහයකට අනුබද්ධ නොවන බැංකු පිහිටුවීම වැළැක්වීම සඳහා ස්වකීය නියාමන සහ අධීක්ෂණ ආයතනවල සහාය ඇතිව යෝග්‍ය සහ ඵලදායී ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළ යුතුය. එමෙන්ම, එවැනි ආයතන සමග නියෝජිත බැංකු සම්බන්ධතාවයකට එළඹීම හෝ එවැනි සම්බබන්ධතාවයක් පවත්වාගෙන යාම ප්‍රතික්ෂේප කරන ලෙසට සහ තම ගිණුම් භෞතික පැවැත්මක් නොමැති සහ නියාමනයට ලක් වන මූල්‍ය සමූහයකට අනුබද්ධ නොවන බැංකු විසින් භාවිතා කරනු ලැබීමට අවසර දෙන විදේශීය මූල්‍ය ආයතන සමග සම්බන්ධතා ඇති කර ගැනීමට එරෙහිව ආරක්ෂණ යෙදීමට ස්වකීය මූල්‍ය ආයතනවලට නියම කිරීම සලකා බැලිය හැක.

5. සෑම රාජ්‍ය පාර්ශ්වයක්ම ස්වකීය දේශීය නීතියට අනුව නිසි රාජ්‍ය නිලධාරීන් සඳහා ඵලදායී මූල්‍ය අනාවරණ ක්‍රමවේද ස්ථාපිත කිරීම සලකා බැලිය යුතු අතර, එයට අනුකූල නොවීම සම්බන්ධයෙන් නිසි දඬුවම් ලබා දීම සඳහා විධිවිධාන සැලැස්විය යුතුය. එමෙන්ම, සෑම රාජ්‍ය පාර්ශ්වයක්ම මෙම ප්‍රඥප්තියට අනුව ස්ථාපනය කර ඇති වැරදි වලින් උපයාගත් දේපළ පිළිබඳ විමර්ශනය කිරීමට, හිමිකම් පෑමට සහ ආපසු ලබා ගැනීමට වෙනත් රාජ්‍ය පාර්ශ්ව වල නිසි බලධාරීන්ට අවශ්‍ය විට එම තොරතුරු ලබා දීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට ස්වකීය රටෙහි නිසි බලධාරීන්ට අවසර ලබා දීම පිළිබඳව ද සලකා බැලිය යුතුය.

6. සෑම රාජ්‍ය පාර්ශ්වයක්ම, ස්වකීය දේශීය නීතියට අනුව, විදේශීය රටක මුදල් ගිණුමක් පිළිබඳ උනන්දුවක් හෝ අත්සනක් හෝ වෙනත් අධිකාරියක් ඇති නිසි රාජ්‍ය නිලධාරීන්ට එම සම්බන්ධකම් නිසි බලධාරීන් වෙත වාර්තා කරන ලෙස සහ එවැනි ගිණුම් පිළිබඳ නිසි වාර්තා පවත්වා ගන්නා ලෙස නියම කිරීමට අවශ්‍ය විය හැකි ක්‍රියාමාර්ග ගැනීම සලකා බැලිය යුතුය. එම නියෝගවලට අනුකූලව කටයුතු නොකිරීමට එරෙහිව දඬුවම් ලබා දීම සඳහා ද එම ක්‍රියාමාර්ග මගින් විධිවිධාන සැලසිය යුතු වේ.

## 53 වැනි වගන්තිය. දේපළ සෘජුවම ආපසු ලබා ගැනීම සඳහා වන ක්‍රියාමාර්ග

සෑම රාජ්‍ය පාර්ශ්වයක්ම ස්වකීය දේශීය නීතියට අනුව:
(අ) මෙම ප්‍රඥප්තියට අනුව ස්ථාපනය කර ඇති වරදක් සිදු කිරීම මගින් අත්පත් කර ගන්නා ලද දේපළක හිමිකම හෝ අයිතිය සනාථ කිරීම පිණිස ස්වකීය අධිකරණවල සිවිල් නඩු පැවරීම සඳහා වෙනත් රාජ්‍ය පාර්ශ්වයකට අවසර දීමට අවශ්‍ය විය හැකි පරිදි ක්‍රියාමාර්ග ගත යුතුය;
(ආ) එවැනි වැරදි මගින් හානියට පත් වී ඇති වෙනත් රාජ්‍ය පාර්ශ්වයකට වන්දි හෝ හානිපූරණ ගෙවන ලෙසට මෙම ප්‍රඥප්තියට අනුව ස්ථාපනය කර ඇති වැරදි සිදු කරනු ලබන පුද්ගලයින්ට නියෝග නිකුත් කිරීමට සිය අධිකරණවලට අවසර දීමට අවශ්‍ය විය හැකි පරිදි ක්‍රියා මාර්ග ගත යුතුය; සහ
(ඇ) මෙම ප්‍රඥප්තියට අනුව ස්ථාපනය කර ඇති වරදක් සිදු කිරීම මගින් අත්පත් කර ගන්නා ලද දේපළක් රාජසන්තක කිරීම පිළිබඳ තීරණය කිරීමට ඇති විට, එම දේපළෙහි නීත්‍යානුකූල හිමිකරුවෙක් ලෙස වෙනත් රාජ්‍ය පාර්ශ්වයක් විසින් ඉදිරිපත් කරනු ලබන හිමිකම් පෑම පිළිගැනීමට සිය අධිකරණවලට හෝ නිසි බලධාරීන්ට අවසර දීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි ක්‍රියාමාර්ග ගත යුතුය.

## 54 වැනි වගන්තිය. රාජසන්තක කිරීමේදී අන්තර්ජාතික සහයෝගීත්වය හරහා දේපළ ආපසු ලබා ගැනීම සඳහා වන යාන්ත්‍රණ

1. සෑම රාජ්‍ය පාර්ශ්වයක්ම, මෙම ප්‍රඥප්තියට අනුව ස්ථාපනය කරන ලද වරදක් සිදු කිරීම හරහා අත්පත් කර ගන්නා ලද හෝ එවැනි වරදකට සම්බන්ධ වී ඇති දේපළ සම්බන්ධයෙන් ස්වකීය දේශීය නීතියට අනුකූලව මෙම ප්‍රඥප්තියෙහි 55 වැනි වගන්තියට අනුව අන්‍යෝන්‍ය නීති සහාය සපයා දීම පිණිස:
(අ) වෙනත් රාජ්‍ය පාර්ශ්වයක අධිකරණයක් විසින් නිකුත් කරනු ලැබ ඇති රාජසන්තක කිරීමේ නියෝගයක් බලාත්මක කිරීම සඳහා ස්වකීය නිසි බලධාරීන්ට අවසර දීමට අවශ්‍ය විය හැකි පරිදි ක්‍රියාමාර්ග ගත යුතුය;
(ආ) මුදල් විශුද්ධිකරණ වරදක් හෝ එවැනි වෙනත් වරදක් පිළිබඳ ස්වකීය අධිකරණපාත්‍රතාවය ඇතුළත හෝ ස්වකීය දේශීය නීතිය යටතේ බලය ලබා දී ඇති වෙනත් ක්‍රියාපටිපාටියක් හරහා විනිශ්චය ලබා දීම මගින් විදේශීය ප්‍රභවය සහිත එවැනි දේපළක් රාජසන්තක කිරීම සඳහා නියෝග කිරීමට ස්වකීය නිසි බලධාරීන්ට අධිකරණ බලය ඇති විට ඒ සඳහා අවසර දීමට අවශ්‍ය විය හැකි පරිදි ක්‍රියාමාර්ග ගත යුතුය; සහ
(ඇ) වරදකරුගේ මරණය, පලායාම හෝ නොසිටීම හේතුවෙන් වරදකරුට එරෙහිව නඩුපැවරිය නොහැකි අවස්ථාවලදී හෝ වෙනත් යෝග්‍ය අවස්ථාවලදී සාපරාධී වරදකරු කිරීමකින් තොරව එම දේපළ රාජසන්තක කිරීම සඳහා අවසර දීමට අවශ්‍ය විය හැකි පරිදි ක්‍රියාමාර්ග ගැනීම සලකා බැලිය යුතුය.

2. මෙම ප්‍රඥප්තියෙහි 55 වැනි වගන්තියෙහි 2 වැනි ඡේදයට අනුව සිදු කරනු ලබන ඉල්ලීමකට අනුව අන්‍යෝන්‍ය නීති සහාය සපයා දීම පිණිස සෑම රාජ්‍ය පාර්ශ්වයක්ම ස්වකීය දේශීය නීතියට අනුව:
(අ) වත්කමක් අත්හිටුවීම හෝ පරිග්‍රහණය කිරීම සඳහා ප්‍රමාණවත් හේතු තිබෙන බව සහ අවසානයේ මෙම වගන්තියෙහි 1(අ) ඡේදයෙහි කාර්යයන් සඳහා එම දේපළ රාජසන්තක කිරීමේ නියෝගයකට යටත් විය හැකි බව විශ්වාස කිරීම සඳහා ඉල්ලීම ලබන රාජ්‍ය පාර්ශ්වයට සාධාරණ පදනමක් සපයා දෙන, ඉල්ලීම සිදු කරනු ලබන

රාජ්‍ය පාර්ශ්වයක අධිකරණයක් හෝ නිසි බලධාරියෙක් විසින් නිකුත් කරනු ලබන අත්හිටුවීමේ හෝ පරිග්‍රහණය කිරීමේ නියෝගයකට අනුව එම දේපළ අත්හිටුවීම හෝ පරිග්‍රහණය කිරීම සඳහා ස්වකීය නිසි බලධාරීන්ට අවසර ලබා දීමට අවශ්‍ය විය හැකි පරිදි ක්‍රියා මාර්ග ගත යුතුය;
(ආ) වත්කමක් අත්හිටුවීම හෝ පරිග්‍රහණය කිරීම සඳහා ප්‍රමාණවත් හේතු තිබෙන බව සහ අවසානයේ මෙම වගන්තියෙහි 1(අ) ඡේදයෙහි කාර්යයන් සඳහා එම දේපළ රාජසන්තක කිරීමේ නියෝගයකට යටත් විය හැකි බව විශ්වාස කිරීම සඳහා ඉල්ලීම ලබන රාජ්‍ය පාර්ශ්වයට සාධාරණ පදනමක් සපයා දෙන, ඉල්ලීමකට අනුව එම දේපළ අත්හිටුවීම හෝ පරිග්‍රහණය කිරීම සඳහා ස්වකීය නිසි බලධාරීන්ට අවසර ලබා දීමට අවශ්‍ය විය හැකි පරිදි ක්‍රියා මාර්ග ගත යුතුය; සහ
(ඇ) එවැනි දේපළක් විදේශීය පාර්ශ්වයක් විසින් අත්අඩංගුවට ගැනීමක් හෝ එවැනි දේපළක් අත්පත් කර ගැනීමට අදාළ සාපරාධී චෝදනාවක් වැනි හේතු පදනමින් දේපළ රාජසන්තක කිරීම සඳහා ආරක්ෂා කිරීමට ස්වකීය නිසි බලධාරීන්ට අවසර ලබා දීම සඳහා අවශ්‍ය අමතර ක්‍රියාමාර්ග ගැනීම සලකා බැලිය යුතුය.

## 55 වැනි වගන්තිය. රාජසන්තක කිරීමේ කාර්යයන් සඳහා අන්තර්ජාතික සහයෝගීතාවය

1. ස්වකීය භූමි ප්‍රදේශය තුළ පිහිටා තිබෙන, මෙම ප්‍රඥප්තියෙහි 31 වැනි වගන්තියෙහි 1 වැනි ඡේදයෙහි සඳහන් කර ඇති, අපරාධ වලින් උපයාගත් වත්කම්, දේපළ, උපකරණ හෝ වෙනත් උපකරණත්ව රාජසන්තක කිරීම සඳහා මෙම ප්‍රඥප්තියට අනුව ස්ථාපනය කර ඇති වරදක් සම්බන්ධයෙන් අධිකරණ බලය තිබෙන වෙනත් රාජ්‍ය පාර්ශ්වයකින් ඉල්ලීමක් ලැබී ඇති රාජ්‍ය පාර්ශ්වයක් විසින් ස්වකීය දේශීය නීති පද්ධතිය ඇතුළත සිදු කළ හැකි උපරිම මට්ටමට:
(අ) රාජසන්තක කිරීමේ නියෝගයක් ලබා ගැනීම සඳහා එම ඉල්ලීම සිය නිසි බලධාරීන්ට ලබා දිය යුතු අතර, එවැනි නියෝගයක් ලබා දුන හොත් එය බලාත්මක කළ යුතුය; නැතහොත්
(ආ) එම දේපළ ඉල්ලීම ලබන රාජ්‍ය පාර්ශ්වයෙහි භූමි ප්‍රදේශය තුළ පිහිටා තිබෙන, මෙම ප්‍රඥප්තියෙහි 31 වැනි වගන්තියෙහි 1 වැනි ඡේදයෙහි සඳහන් කර ඇති, අපරාධ වලින් උපයාගත් වත්කම්, දේපළ, උපකරණ හෝ වෙනත් උපකරණත්ව වලට අදාළ වන තාක් දුරට, ඉල්ලා සිටින මට්ටමට එම ඉල්ලීම ක්‍රියාවෙහි යෙදවීමේ අරමුණ ඇතිව, මෙම ප්‍රඥප්තියෙහි 31 වැනි වගන්තියෙහි 1 වැනි ඡේදයට සහ 54 වැනි වගන්තියෙහි 1(අ) ඡේදයට අනුකූලව ඉල්ලීම කරනු ලබන රාජ්‍ය පාර්ශ්වයෙහි භූමි ප්‍රදේශය තුළ පිහිටි අධිකරණයක් විසින් නිකුත් කරනු ලබන රාජසන්තක කිරීමේ නියෝගයක් ස්වකීය නිසි බලධාරීන්ට ලබා දිය යුතුය.

2. මෙම ප්‍රඥප්තියට අනුව ස්ථාපනය කර ඇති වරදක් සම්බන්ධයෙන් අධිකරණ බලය තිබෙන වෙනත් රාජ්‍ය පාර්ශ්වයක් විසින් කරනු ලබන ඉල්ලීමක් ලැබීමෙන් පසුව, ඉල්ලීම කරනු ලබන රාජ්‍ය පාර්ශ්වය විසින් හෝ, මෙම වගන්තියෙහි 1 වැනි ඡේදය යටතේ වන ඉල්ලීමකට අනුව, ඉල්ලීම ලබන රාජ්‍ය පාර්ශ්වය විසින් අවසානයේ රාජසන්තක කිරීමට නියෝග කරනු ලැබීමේ කාර්යය සඳහා, ඉල්ලීම ලබන රාජ්‍ය පාර්ශ්වය විසින්, මෙම ප්‍රඥප්තියෙහි 31 වැනි වගන්තියෙහි 1 වැනි ඡේදයෙහි සඳහන් කර ඇති, අපරාධ වලින් උපයාගත් වත්කම්, දේපළ, උපකරණ හෝ වෙනත් උපකරණත්ව හඳුනා ගැනීම, සොයා ගැනීම සහ අත්හිටුවීම හෝ පරිග්‍රහණය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

3. මෙම ප්‍රඥප්තියෙහි 46 වැනි වගන්තියෙහි සඳහන් විධිවිධාන, අවශ්‍ය වෙනස්කම් සහිතව, මෙම වගන්තියට අදාළ වේ. 46 වැනි වගන්තියෙහි 15 වැනි ඡේදයෙහි නිශ්චිතව දක්වා ඇති තොරතුරුවලට අමතරව, මෙම වගන්තියට අනුව සිදු කරනු ලබන ඉල්ලීම් වල පහත සඳහන් තොරතුරු අඩංගු විය යුතුය:
(අ) මෙම වගන්තියෙහි 1(අ) ඡේදය අනුව කරනු ලබන ඉල්ලීමක් සම්බන්ධයෙන් ගත් විට, හැකි තාක් දුරට, අදාළ දේපළ පිහිටි ස්ථානය පිළිබඳව, සහ, අදාළ අවස්ථා වලදී, දේපළෙහි ඇස්තමේන්තු කළ වටිනාකම, සහ ඉල්ලීම ලබන රාජ්‍ය පාර්ශ්වයට ස්වකීය දේශීය නීතිය යටතේ අදාළ නියෝගය ඉල්ලා සිටීමට හැකි වීම සඳහා ප්‍රමාණවත් තරමට, ඉල්ලීම කරනු ලබන රාජ්‍ය පාර්ශ්වය විසින් විශ්වාසය තබන ලද කරුණු පිළිබඳ ප්‍රකාශයක්ද ඇතුළුව රාජසන්තක කළ යුතුව තිබෙන දේපළ පිළිබඳ විස්තරයක්;
(ආ) මෙම වගන්තියෙහි 1(ආ) ඡේදය අනුව කරනු ලබන ඉල්ලීමක් සම්බන්ධයෙන් ගත් විට, ඉල්ලීම කරනු ලබන පාර්ශ්වය විසින් නිකුත් කරන ලද, එම ඉල්ලීමට පදනම් වූ රාජසන්තක කිරීමේ නියෝගයක නීත්‍යානුකූලව පිළිගත හැකි පිටපතක්, එම නියෝගය ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලා සිටිනු ලබන මට්ටමෙහි තරමට අදාළ කරුණු සහ තොරතුරු ප්‍රකාශයක්, ඉල්ලීම කරනු ලබන රාජ්‍ය පාර්ශ්වය විසින් සද්භාවයෙන් යුතු තුන්වන පාර්ශ්වයන් වෙත ප්‍රමාණවත් දැනුම් දීම් සිදු කිරීම සඳහා සහ නිසි ක්‍රියාවලින් සහතික කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග නිශ්චිතව දැක්වෙන ප්‍රකාශයක්, සහ රාජසන්තක කිරීමේ නියෝගය අවසානාත්මක බව සඳහන් ප්‍රකාශයක්;
(ඇ) මෙම වගන්තියෙහි 2 වැනි ඡේදයට අනුව කරනු ලබන ඉල්ලීමක් සම්බන්ධයෙන් ගත් විට, ඉල්ලීම කරනු ලබන රාජ්‍ය පාර්ශ්වය විසින් විශ්වාසය තබන ලද කරුණු පිළිබඳ ප්‍රකාශයක් සහ ඉල්ලා සිටින ක්‍රියාමාර්ග පිළිබඳ විස්තරයක්, සහ, තිබෙන්නේ නම්, ඉල්ලීමට පදනම් වූ නියෝගයක නීත්‍යානුකූල වශයෙන් පිළිගත හැකි පිටපතක්.

4. ඉල්ලීම ලබන රාජ්‍ය පාර්ශ්වය විසින් ස්වකීය දේශීය නීතියට සහ එහි කාර්ය පටිපාටිමය නීතිවලට හෝ ඉල්ලීම කරනු ලබන රාජ්‍ය පාර්ශ්වයට අදාළව තමන් විසින් බැඳී සිටින යම් ද්විපාර්ශ්වික හෝ බහුපාර්ශ්වික ගිවිසුමකට හෝ වැඩපිළිවෙලකට අනුකූලව සහ එහි විධිවිධානයන්ට යටත්ව, මෙම වගන්තියෙහි 1 වැනි සහ 2 වැනි ඡේදවල විධිවිධාන සලසා ඇති තීරණ සහ ක්‍රියාමාර්ග ගත යුතුය.

5. සෑම රාජ්‍ය පාර්ශ්වයක් විසින් ම මෙම වගන්තිය බලාත්මක කිරීම සඳහා වන ස්වකීය නීති සහ නියමන්හි පිටපත් සහ එම නීති සහ නියමයන්ට පසුව සිදු කරනු ලබන යම් සංශෝධන වේ නම් ඒවායෙහි පිටපත් හෝ විස්තරයක් ද එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයා වෙත ලබා දිය යුතු වේ.

6. රාජ්‍ය පාර්ශ්වයක් අදාළ ගිවිසුමක් පැවතීමේ කොන්දේසික බව මත මෙම වගන්තියෙහි 1 වැනි සහ 2 වැනි ඡේදවල සඳහන් කර ඇති ක්‍රියාමාර්ග ගැනීමට තීරණය කරන්නේ නම්, එම රාජ්‍ය පාර්ශ්වය මෙම ප්‍රඥප්තිය අවශ්‍ය සහ ප්‍රමාණවත් ගිවිසුම් පදනම ලෙස සැලකිය යුතුය.

7. ඉල්ලීම ලබන රාජ්‍ය පාර්ශ්වයට නියමිත කාලයේදී ප්‍රමාණවත් සාක්ෂි නොලැබෙන්නේ නම් හෝ අදාළ දේපළෙහි වටිනාකම ඉතා සුළු නම් හෝ මෙම වගන්තිය යටතේ සහයෝගය ලබා දීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැක, නැතහොත් තාවකාලික ක්‍රියාමාර්ග ඉවත් කරනු ලැබිය හැක.

8. මෙම වගන්තියට අනුව ගෙන ඇති යම් තාවකාලික ක්‍රියාමාර්ගයක් ඉවත් කිරීමට පෙර, ඉල්ලීම ලබන රාජ්‍ය පාර්ශ්වය, හැකි සෑම අවස්ථාවකදීම, එම ක්‍රියාමාර්ගය ඉදිරියටත් පවත්වාගෙන යාමට පක්ෂව හේතු ඉදිරිපත් කිරීම සඳහා ඉල්ලීම කරනු ලබන රාජ්‍ය පාර්ශ්වයට අවස්ථාවක් ලබා දිය යුතුය.

9. මෙම වගන්තියෙහි සඳහන් විධිවිධාන සද්භාවයෙන් යුතු තුන්වන පාර්ශ්වයන්ගේ අයිතිවාසිකම්වලට අගතිශීලී වන ලෙසට නිර්වචනය නොකළ යුතුය.

## 56 වැනි වගන්තිය. විශේෂ සහයෝගීතාවය

සෑම රාජ්‍ය පාර්ශ්වයක්ම, ස්වකීය දේශීය නීතියට අගතියක් නොවන පරිදි, මෙම ප්‍රඥප්තියට අනුව ස්ථාපනය කර ඇති වැරදි මගින් උපයාගත් දේපළ පිළිබඳ තොරතුරු වෙනත් රාජ්‍ය පාර්ශ්වයකට හෙළි කිරීම මගින් එම තොරතුරු ලබා ගන්නා රාජ්‍යයට විමර්ශන, නඩු පැවරීම් හෝ අධිකරණ ක්‍රියාමාර්ග ආරම්භ කිරීම සඳහා හෝ පවත්වාගෙන යාම සඳහා එම තොරතුරු උපකාරී වනු ඇතැයි, හෝ එම රාජ්‍යය විසින් ප්‍රඥප්තියෙහි මෙම පරිච්ඡේදය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට එම තොරතුරු හේතු වනු ඇතැයි සලකනු ලබන විට, ස්වකීය රාජ්‍යය විසින් සිදුකරනු ලබන විමර්ශන, නඩුපැවරීම් හෝ අධිකරණ ක්‍රියාමාර්ග වලට අගතියක් නොවන පරිදි, පූර්ව ඉල්ලීමක් නොමැතිව වෙනත් රාජ්‍ය පාර්ශ්වයකට එම තොරතුරු ලබා දීම සඳහා අවසර දීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට උත්සාහ කළ යුතුය.

## 57 වැනි වගන්තිය. වත්කම් ආපසු ලබා දීම සහ බැහැර කිරීම

1. මෙම සම්මුතියෙහි 31 වැනි හෝ 55 වැනි වගන්තියට අනුව රාජ්‍ය පාර්ශ්වයක් විසින් රාජසන්තක කරනු ලබන දේපළ, මෙම ප්‍රඥප්තියෙහි විධිවිධානයන්ට සහ ස්වකීය දේශීය නීතියට අනුකූලව එම රාජ්‍ය පාර්ශ්වය විසින්, මෙම වගන්තියෙහි 3 වැනි ඡේදයට අනුව, එම දේපළවල පෙර නීත්‍යානුකූල හිමිකරුවන්ට ආපසු ලබා දීම මගින් ද ඇතුළුව බැහැර කළ යුතුය.

2. වෙනත් රාජ්‍ය පාර්ශ්වයක් විසින් මෙම ප්‍රඥප්තියට අනුව සිදු කරනු ලබන ඉල්ලීමකට අනුව කටයුතු කරන විට සෑම රාජ්‍ය පාර්ශ්වයක්ම, සද්භාවයෙන් යුතු තුන්වන පාර්ශ්වයන්ගේ අයිතිවාසිකම් සැලකිල්ලට ගනිමින්, ස්වකීය නිසි බලධාරීන්ට රාජසන්තක කරන ලද දේපළ ආපසු ලබා දීමට හැකිවීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි ස්වකීය දේශීය නීතියෙහි මූලික මූලධර්මවලට අනුව අවශ්‍ය ව්‍යවස්ථාදායකමය සහ අනෙකුත් ක්‍රියාමාර්ග අනුගත කර ගත යුතුය.

3. මෙම ප්‍රඥප්තියෙහි 46 වැනි සහ 55 වැනි වගන්තිවලට සහ මෙම වගන්තියෙහි 1 වැනි සහ 2 වැනි ඡේදවලට අනුව, ඉල්ලීම ලබන රාජ්‍ය පාර්ශ්වය විසින්:
(අ) රාජ්‍ය අරමුදල් දුර්උපයෝජනයක් සිදු කර ඇති හෝ මෙම සම්මුතියෙහි 17 වැනි සහ 23 වැනි වගන්තිවලට අනුව දුර්උපයෝජනය කරන ලද රාජ්‍ය අරමුදල් විශුද්ධිකරණය කර ඇති අවස්ථාවක් සම්බන්ධයෙන් ගත් කල, ඉල්ලීම ලබන රාජ්‍ය පාර්ශ්වය විසින් අත්හැරිය හැකි අවශ්‍යකතාවයක් වන, මෙම ප්‍රඥප්තියෙහි 55 වැනි වගන්තියට අනුව සහ ඉල්ලීම කරනු ලබන රාජ්‍ය පාර්ශ්වයෙහි අවසන් විනිශ්චයක් පදනම් කර ගෙන රාජසන්තක කිරීමක් ක්‍රියාත්මක කළ විට, රාජසන්තක කරන ලද දේපළ ඉල්ලීම කරනු ලබන රාජ්‍ය පාර්ශ්වය වෙත ආපසු ලබා දිය යුතුය.
(ආ) මෙම ප්‍රඥප්තිය මගින් ආවරණය කරනු ලබන වෙන යම් වරදක් මගින් උපයාගත් දේපළ සම්බන්ධයෙන් ගත් කල, ඉල්ලීම ලබන රාජ්‍ය පාර්ශ්වය විසින් අත්හැරිය හැකි අවස්ථාවක් වන, මෙම ප්‍රඥප්තියෙහි 55 වැනි වගන්තියට අනුව සහ ඉල්ලීම කරනු ලබන රාජ්‍ය පාර්ශ්වයෙහි අවසන් විනිශ්චයක් පදනම් කර ගෙන රාජසන්තක කිරීමක් ක්‍රියාත්මක කළ විට, ඉල්ලීම කරන රාජ්‍ය පාර්ශ්වය එසේ රාජසන්තක කරන ලද දේපළ පිළිබඳ තමන් සතු පෙර හිමිකාරීත්වය ඉල්ලීම ලබන රාජ්‍ය පාර්ශ්වයට හේතුසහගත ලෙස සනාථ කළ පසු, හෝ ඉල්ලීම කරනු ලබන රාජ්‍ය පාර්ශ්වයට සිදුවී ඇති හානිය එසේ රාජසන්තක කරන ලද දේපළ ආපසු ලබා දීම සඳහා වන පදනමක් ලෙස ඉල්ලීම ලබන රාජ්‍ය පාර්ශ්වය විසින් පිළිගනු ලබන විට, එම රාජසන්තක කළ දේපළ ඉල්ලීම කරනු ලබන රාජ්‍ය පාර්ශ්වයට ආපසු ලබා දිය යුතුය; සහ

(ඇ) අනෙකුත් සියලුම අවස්ථාවන්හිදී, එම රාජසන්තක කරන ලද දේපළ ඉල්ලීම කරනු ලබන රාජ්‍ය පාර්ශ්වයට ආපසු ලබා දීමට, එම දේපළවල පෙර නීත්‍යානුකූල හිමිකරුවන්ට එම දේපළ ආපසු ලබා දීමට හෝ අපරාධයේ වින්දිතයින්ට වන්දි ගෙවීමට ප්‍රමුඛ සැලකිල්ල ලබා දිය යුතුය.

4. යෝග්‍ය අවස්ථාවලදී, රාජ්‍ය පාර්ශ්ව විසින් අන්‍යාකාරයෙන් තීරණය කරන්නේ නම් මිස, ඉල්ලීම ලබන රාජ්‍ය පාර්ශ්වය විසින් මෙම වගන්තියට අනුව රාජසන්තක කරන ලද දේපළ ආපසු ලබා දීමට හෝ බැහැර කිරීමට අදාළ වූ විමර්ශන, නඩුපැවරීම් හෝ අධිකරණ කටයුතු වෙනුවෙන් දරන ලද සාධාරණ වියදම් අඩු කරනු ලැබිය හැකිය.

5. යෝග්‍ය අවස්ථාවලදී, රාජසන්තක කරන ලද දේපළ අවසන් බැහැර කිරීම සඳහා රාජ්‍ය පාර්ශ්වයන් විසින් සිද්ධියෙන් සිද්ධිය වන පදනමකින් ගිවිසුම් හෝ අන්‍යෝන්‍ය වශයෙන් පිළිගත හැකි වැඩපිළිවෙල නියම කර ගැනීම සඳහා ද විශේෂ අවධානයක් යොමු කරනු ලැබිය හැක.

## 58 වැනි වගන්තිය. මූල්‍ය බුද්ධි ඒකකය

මෙම ප්‍රඥප්තියට අනුව ස්ථාපනය කර ඇති වැරදි ක්‍රියා මගින් උපයා ගනු ලබන දේපළ පවරා දීම වැළැක්වීමේ සහ එයට එරෙහිව සටන් කිරීමේ කාර්යය සහ එවැනි දේපළ ආපසු ලබා ගැනීමේ ක්‍රම සහ විධි ප්‍රවර්ධනය කිරීමේ කාර්යය සඳහා රාජ්‍ය පාර්ශ්ව එකිනෙකා සමග සහයෝගයෙන් යුක්තව කටයුතු කළ යුතු අතර, එම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා සැකකටයුතු මූල්‍ය ගනුදෙනු පිළිබඳ වාර්තා ලබා ගැනීම, විශ්ලේෂණය කිරීම සහ නිසි බලධාරීන් වෙත ප්‍රචාරණය කිරීම සඳහා වගකීම දරන මූල්‍ය බුද්ධි ඒකකයක් ස්ථාපිත කිරීම පිළිබඳව සලකා බැලිය යුතුය.

## 59 වැනි වගන්තිය. ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික ගිවිසුම් සහ වැඩපිළිවෙල

ප්‍රඥප්තියෙහි මෙම පරිච්ඡේදයට අනුව ක්‍රියාත්මක කරනු ලබන අන්තර්ජාතික සහයෝගීතාවයෙහි ඵලදායීත්වය වැඩිදියුණු කිරීම පිණිස රාජ්‍ය පාර්ශ්ව විසින් ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික ගිවිසුම් හෝ වැඩපිළිවෙල ගිවිස ගැනීම පිළිබඳ සලකා බැලිය යුතුය.

Transparency International Sri Lanka
5/1
Elibank Road
Colombo 05
Sri Lanka

Phone: +94 0114369781
Fax: +94 011 2 501 707

tisl@tisrilanka.org
www.tisrilanka.org

facebook.com/tisrilanka
twitter.com/tisrilanka

ISBN 978-955-1281-96-0